


දිවයින
ඉරිදා සංග්‍රහය

ලිපි මාලාවක් ඇසුරින්

අතහැරීම 8

# මහ රහතුන් වැඩි මඟ ඔස්සේ



ඉදිරිපත් කිරීම

ඉන්ද්‍රජිත් සුබසිංහ

# මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

## අතහැරීම 8

ඉදිරිපත් කිරීම
**ඉන්ද්‍රජිත් සුබසිංහ**

**දිවයින ඉරිදා සංග්‍රහයේ**
**ලිපි මාලාවක් ඇසුරිනි**

© ඉන්ද්‍රජිත් සුබසිංහ

පළමුවන මුද්‍රණය - 2015 සැප්තැම්බර්
දෙවන මුද්‍රණය - 2015 ඔක්තෝබර්
තෙවන මුද්‍රණය - 2015 දෙසැම්බර්
හතරවන මුද්‍රණය - 2016 පෙබරවාරි
පස්වන මුද්‍රණය - 2016 අප්‍රේල්

ISBN 978-955-7887-05-0

**පොත ලබාගත හැකි ස්ථාන**

**දිවයින පුරා පොත් අලෙවි සැල්**

**නිෂ්පාදන වියදමට මෙම දහම් පොත් ලබා ගැනීම සඳහා විමසන්න.**
දුරකථනඃ 0112755768 (සතියේ දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 1.30 දක්වා), 0712199900

ඡායාරූප
**වාසල සේනාරත්න**

මුද්‍රණය සහ බෙදාහැරීම
**ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්**
444/3B, පිටිපන දකුණ, හෝමාගම




මේ ලිපි මාලාව ලියූ ස්වාමීන් වහන්සේ මේ වන විට කොහි වැඩ සිටිනවාදැයි මම නොදනිමි. එහෙත් උන්වහන්සේ මේ පින් බිමේ කුමන හෝ ගැඹුරු වනගැබක අලි, කොටි, වලසුන් මැද ඒක විහාරීව දහම් සුව විඳිමින් සිටිතැයි මම විශ්වාස කරමි. මේ ඝෝර කටුක සංසාරයේ භිය දැක මේ ආත්මයේදීම සසර දුකින් එතෙරවීම අදිටන් කරගනිමින් ඍජුව නිවන් මගේ ගමන් කළ උන්වහන්සේ ලබා ඇති මග ඵල ගැන කියන්නට තරම් මම සමතෙක් නොවෙමි. එහෙත් උන්වහන්සේ වැඩිය යුතු බවුන් වඩන උතුමකු බව කියන්නට මම නොපැකිලෙමි. තම අවබෝධය මෙන්ම අත්දැකීම්ද උන්වහන්සේ සතුවූ සටහන් පොත් කිහිපයක සංස්කරණය නොකළ සටහන් ලෙසින් මා අතට පත්කළ උන්වහන්සේ නොපෙනී ගියහ. එහෙත් ඒ සටහන් කෙතරම් දාර්ශනිකද. ගැඹුරුද. ආශ්චර්යමත්ද. නිවන් මඟට පිළිපන් ගිහි පැවිදි උභය පාර්ශ්වයටම මෙය අගනා පූජාවක් වනු ඇතැයි මගේ පුහුදුන් සිත කියයි. මේ සියල්ල ඔබ වෙත ඉදිරිපත් වුවද ඒවා ලියූ උන්වහන්සේගේ නාමය හෙළි නොකරන සේ කරන ලද ඇයැදුමක්ද විය. කර්තෘ අඥාත වුවද මේ සියල්ල ඔබ හැමගේ යහපතට හේතුවනු නිසැකය. ඒ නිසාම මා ලද ඒ අතිශයින් අගනා දහම් පඬුර පොතක් ලෙසින් ඔබ අතට පත්කිරීමට මට ඉඩ දුන මැනවි!

( 2012 වෙසක් පුන් පොහෝ දින )

මේ ඝෝර කටුක භයානක සංසාරයේ
නියදුන, මේ ආත්මභාවයේදීම
සසර දුකින් එතෙර වීමට
අධිෂ්ඨානය කරමින් වීර්ය වඩමින්
මරණය ඔබ වුවත් "දක්වා"
හිස වැද්ද උතුමන්ම වන්දනා
මේ අනිත්‍ය ස්වභාවය
උපාසකයෙක් වේවා, පෙත්වෙතක් වේවා
ධාර්මිකයෙක් වේවා
තම තමාට ළඟා වන දුෂ්කරතාවය
තම තමන්ගේ චිත්ත වලින් ගෙන ගන්නේ.
දුරට හෝ විහායතා වුවද අත්තොත්
ඔබ නොකල වරදකට
ඔබ නොගැලවේ.
පහනට අනුකම්පා කෙරේවා
වරද නැතත් අවෙරද් වෙය
අවෙරද ලෝය දකින්.
මෙවැනි සටහන් හැම ප්‍රත්‍යේකලෝය
ඔබ උපමට සහාසතාවට වේවා.
තමා තමාටම විශ්ව කොට ගන්නේ.

(පින්වත් ඔබ වෙනුවෙන් මෙම සටහන් තැබූ භික්ෂූන් වහන්සේ විසින් ලියූවකි.)

'මහ රහතුන් වැඩි මග ඔස්සේ ' ලිපි මාලාව පින්වත් ඔබ වෙනුවෙන් පුදනු ලැබූ උන්වහන්සේ එදා ඒ සටහන් තබනු ලැබුවේ අප්‍රකටවය. මහා ඝන වනාන්තරයේ ඈත කුටියක සිට, සිතත්, පරිසරයත් සහ මුළින්ම නිසල මොහොතක, ලොවම නිදනා රාත්‍රියක, විටෙක රූස්ස ගස් අතරින් පෙරී එන ළහිරු කිරණ හෝ තවත් විටෙක ලන්තෑරුමේ දුප්පත් එලියේ පිහිටෙන් තැබූ ඒ සටහන් දිවයින සිසාරා සදහම් සුවඳ වී හමා ගියේය. ඒ සුවඳ හමන්නේ කොයි ඉසව්වෙන් දැයි සැදැහැති දනෝ විමසූහ. ඒ දහම් සුවඳින් හදවත සුවඳවත් කරගත් අයෙක් ඒ භාග්‍යවතුන් වහන්සේගේ ඒ දහම් සුවඳ පතුරුවාහල බුදුපුතුන් දැකීමට ප්‍රාර්ථනා කළහ. සත්‍යක්‍රියා කළහ. තවමත් ගලපා ගත නොහැකි දහම් ගැටළුවක් වේ නම් එය ඒ පින්වත් ස්වාමීන්වහන්සේගෙන්ම විමසා ගලපා ගැනීමට උනන්දු වූහ.

කාලයාගේ ඇවෑමෙන් ඒ ප්‍රාර්ථනා ඉටුවිය. සටහනකින් ඔබ දුටු උන්වහන්සේව සියැසින් දැක ගැනීමට ඔබට හැකිවිය. නැතිනම් ඔබට ඒ සඳහා හේතු තිබුණි. එතෙක් ඇසින් කියවූ දහම් ගැලපුම දෙසවනින් ඇසීම උදෙසා දස දහස් ගණනින් රැස්වූහ. පිරිස කොතරම් උන්වහන්සේ වටා රැස්වුවද, උන්වහන්සේ උන්වහන්සේගේ ස්වභාවයෙන්ම සිටිසේක. රැස්වන කඳු ගණන් පිරිකරද, දහස් ගණන් පිරිවරද ලෝකය වශයෙන්ම, මාරයා වශයෙන්ම දුටු සේක. ප්‍රසංශාවත්, සාධුකාරයත්, ගැරහුමත්, විවේචනයත් ධර්මයටම ගැලපූහ.

වනයේ රුක්ෂ මණ්ඩලයක රැඳුණු හුදකලාව තමන් වහන්සේගේ විවේකය පිණිසත්, ගම නගරයේ සැකසුණු ධර්ම මණ්ඩපයක ඉල්ලීම ධර්මකාමී ජනතාවගේ පහසුව පිණිස කැපකිරීමක් ලෙසත් වස්කාලයෙන් වස්කාලය, උන්වහන්සේ ඉකුත් වසර කිහිපය ගෙවා දැමූහ. නමුත් උන්වහන්සේ අප සැම කෙරෙහි අනුකම්පාවෙන් අඛණ්ඩවම ශ්‍රී සද්ධර්මය අප සැම වෙත දායාද කළ සේක. මේ එවැනි වූ තවත් උතුම් දහම් ගැලපුම් පෙළක එකතුවකි.

# පිදුම

මේ අනන්ත වූ සංසාරයේ අප කරක් නොගැසූ තැනක් වේද? අත් නොවිඳි අත්දැකීමක් වෙද්ද? ඒ සා තැන්හී කරක් ගසා, ඒ සා අත්දැකීම් විඳ මෙලෙසින් තවත් උපතක් ලැබූ අපි මේ භව චක්‍රයේ තවත් කැරකෙමුද? අප හැමදාම කැරකුනේ එකම තැනක් වටාය. විඳගත්තේ ජාති, ජරා, ව්‍යාධි, මරණ.... වැනි එකම අත්දැකීම් පෙළකි.

හිත හැරුණු අතේ, හිස හැරුණු අතේ....යන්නන් වාලේ ගිය මේ ගමනේ වෙහෙස යනු 'දුක' යැයි කියාදුන්, ඒ දුකට සමුදීමේ ක්‍රමවේදය 'දුක අවබෝධ කිරීම' යැයි කියාදුන්, දුක අවබෝධ කිරීමේ උත්සාහයට වචනයකින් හෝ ආදර්ශයෙන් හෝ සවිය දෙන කළ්‍යාණ මිත්‍රයෙක් යැයි කියන්නා වූ යමෙක් වෙත්ද, ඒ කළ්‍යාණ මිත්‍රයා වෙනුවෙන් මෙය පුදමි.

**ඉන්ද්‍රජිත්**

# පටුන


නිමාවක් නැති ලොවක අදට වඩා හොඳ හෙටක් කොහිද? 1

ප්‍රඥාවේ ඇසින් අත්දුටු ලොව්තුරා ධර්මයේ ආශ්චර්යය 4

ඔබත් අනෙක් අයත් අතර නැතිනම් වෙනසක්, දුකෙන් පිරුණු සසර කතර සදා උරුමයක් 8

සංසාරයේ කී වරක් නම් ඔබ ඔතැනම මිහිදන්ව ඇත්ද? 10

ඔබේ අතීත භව ගමනේ කැඩපතක් ඔබ ඉදිරියේ ඇත. 13

අධර්මයේ කාලය අති දීර්ඝයි 16

මේ ශාසනයේ අවසාන බැබලීමයි 19

මතු සංසාරේ ඔබේ මළකඳන් නුවණින් දැක්කොත් දස්කමකි... 23

ඔබේ ඊළඟ ආත්මයේ නිමැවුම්කරු ඔබමය 27

මැරෙන මොහොතේ මොකද වෙන්නේ 30

කල්‍යාණ මිත්‍රයකු නොමැති නම් තනිව සිටීමත් වටියි 32

හොරකම සුළුවෙන් තැකුවට ලෙහෙසිද එය එල දෙන විට 35

ලෝකය අසාධාරණයක්මයි ඔබට සාධාරණය ඔබ තුළමයි 39

අහෝ ! තිරිසන් අපාය 43

අතහැරීමක ආරම්භය සහ අල්ලාගැනීමක අවසානය (දඹරන් දෙවියා 1) 51

ක්‍රෝධයේ කළු පැහැය සහ සීලයේ රන් පැහැය
(දඹරන් දෙවියා 2) 57

කළණ මිතුරුබවේ අගය නිමක් නොවේ 63

මේ බිහිසුණු සිර දඬුවමින් නිදහස් නොවුන හොත්.. 68

ආරක්ෂා වීමේ අරුත... 72

උතුරේ ත්‍රස්තවාදයට වඩා භයානක ත්‍රස්තවාදයක්
ඔබ ඉදිරියේ ඇත 77

ඔය කඩුල්ල පැන ගන්න ඇයි බැරි? 82

ලෝකය අයිති කාටද? 88

තාක්ෂණයට නොපෙනෙන ප්‍රඥාවේ විද්‍යාව 91

දිව්‍ය ලෝකෙ සැපයි... ඒත්? 96

සැපයෙන් එහා ගිය නිදහස්වීමක හිමිකරුවෙකි ඔබ 107

ඵලය ගැන දුක් වීම පසෙක තබා හේතුව ගැන සොයන්න 112

පඬුර බෙල්ලේ බැඳ ගන්න සීලයේ කොඩිය අතට ගන්න 117

මස් මාළුවල නොවෙයි කෙළෙස්වල පිළී ගඳෙන් මිදෙන්න... 120

# නිමාවක් නැති ලොවක
# අදට වඩා හොඳ හෙටක් කොහිද?

ලෝකය නොනවතින ගමනක යනවා. ලෝකයාගේ මේ ගමන දැනුමෙන්, හැකියාවන්ගෙන්, නවතම සොයාගැනීම් වලින් පරිපූර්ණ එකක්. පසු කරන සෑම කඩ ඉමක්ම අලුත් දෙයක් ලෝකයට ඉදිරිපත් කරනවා. ලෝකයාට ඉදිරිපත් කරන තාක්ෂණයේ ප්‍රගතිය තුළින් ජනතාවට ප්‍රයෝජනයක්, පහසුවක් තාවකාලිකව උදාකරනවා. නමුත් ඒ පහසුව තුළින් ඉතිරිවෙන විවේකය මනුෂ්‍යයා යොමුකර ගන්නේ තව තවත් අවිවේකී දිශාවන්ටමයි. තාක්ෂණය මාරයා වශයෙන් හඳුනාගෙන තාක්ෂණය නිසාම ඔබට ලැබෙන කාලයේ ඉතිරිය මාරයාට එරෙහිව තම ධර්ම මාර්ගය ශක්තිමත් කිරීමට යොමුකර ගැනීමට අපි දක්ෂ විය යුතුයි.

එක පර්යේෂණාගාරයක මනුෂ්‍යයාගේ ආයු කාලය වැඩිකර ගැනීමට ඇති හැකියාව ඖෂධ වලින් සොයන විට තවත් විද්‍යාගාරයක මස් පිණ්ඩ ඇති කරන සතුන් ඉක්මනින් තර කොට මැරීමට අවශ්‍ය ක්‍රමවේදයන් සොයනවා. මේ කිසිවෙක් මනුෂ්‍යයා මරණින් පසු ඌරෙක්, හරකෙක්, එළුවෙක්, බැටළුවෙක්, කුකුළෙක් වෙන්නේ ඇයිද? කියලා සොයන්නේ නැහැ. මීට වඩා රෝගයක්, මීට වඩා වෛරයක් ලෝකය තුළ තිබෙනවාද? අවිද්‍යාව නිසාම මනුෂ්‍යයා තමා විසින් සොයා ගන්නා ක්‍රමවේදයන් තුළින් තමාම අනාගත භවයන්හිදී අඩු ආයුෂයෙන් තිරිසන් සතුන් වෙලා මැරුම් කනවා.

වර්තමාන ලෝකයට දැනුමේ කීර්තිය නිසා ප්‍රඥාව මෝදු වෙන්නේ නැහැ. අලුත් සොයාගැනීම් ඉදිරිපත් කරන මහත්වරුන් ලෝකයාගේ සම්මානයට, ගෞරවයට පාත්‍ර වෙනවා. යම් මහත්මයෙක් යම් දෙයක් තම පර්යේෂණ තුළින් සොයාගෙන ඔහුට ඒ සඳහා සම්මාන ගෞරව දක්වන විට තව මහත්මයෙක් එම සොයාගැනීම ඊටත් වඩා ගුණාත්මක තත්වයට උසස්කර ඔහුද සම්මානයට පාත්‍ර වෙනවා. සොයා ගැනීම්වලින්ද නිමාවක් නොමැති, සොයාගන්නන්ගෙන්ද නිමාවක් නොමැති ලෝකයක් තුළ අපිත් අදට වඩා හොඳ හෙටක් බලාපොරොත්තුවෙන් මොකක් හෝ දෙයක් සොයනවා.

ලෝකයේ කලබලකාරී ස්වභාවය ගැන බැලීමේදී මේ සොයන කිසිවෙකුට තමා සොයන දෙය හමු වී නොමැති බවයි පෙනෙන්නේ. ඒකයි මේ පෙරළ පෙරළා තවත් සොයන්නේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ලෝකය පෙරළ පෙරළා සෙවීම වෙනුවට තමාගේ ජීවිතය තුළින්ම ලෝකය දකින හැටි ඉදිරිපත් කළා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ලෝකයේ පහළ වීමට පෙරාතුව දඹදිව විමුක්තිය සොයන කණ්ඩායම් 62 ක් සිටියා. මේ අය එසේ මෙසේ අය නොවේ. විශාල ශ්‍රාවක පිරිස් සිව්පසයෙන් සශ්‍රීක, රජ සිටුවරු ඇසුරු කරපු කණ්ඩායම්. මේ හැම දෙයකින්ම ලෝකයට ප්‍රකාශ කළේ, තම ශ්‍රාවකයින්ට ප්‍රකාශ කළේ කරන්න බැරි දෙයක්මයි. සමහරු තම ශ්‍රාවකයින්ට හරකුන් බල්ලන් මෙන් හැසිරීමට උගන්වනවා. එය ඔවුන් විමුක්ති මාර්ගය ලෙස හැඳින්වූවා. තවත් සමහරු නිර්වස්ත්‍රව ජීවත් වෙමින්, ජලයේ බැස ජීවත් වෙමින්, අව්වේ වේලෙමින් සිටිමින් තම විමුක්ති මාර්ගය ලැබෙනා බව විශ්වාස කළා.

තවත් සමහරු දිව්‍ය තලයක, බ්‍රහ්ම තලයක සිත පිහිටෙව්වා. එය විමුක්තිය හැටියට දැක්කා. මේ කිසිම කණ්ඩායමක් සැබෑ අවසානයක් දකින්න පුළුවන් දෙයක් නොවේ ලෝකයට ඉදිරිපත් කළේ. කරල ඉවරයක් කරන්න බැරි දෙයක්මයි. මේවා තුළින් විමුක්තියක් නොවේ දේශනා වුණේ, සිරගත වීමක්. නැවතීමක් නම් නොවේ. ලෝකයාගේ ගමන තවත් විකෘතියක් වීමයි සිද්ධ වුණේ.

ආලෝකය නොදැක්ක මිනිස්සු අඳුර වර්ණනා කරන්නේ ගොඩක් ලස්සනට, හැඟීම්බරවයි. මෙවැනි මිනිසුන්ගෙන් පිරුණු ලෝකයකම බිහි වූ ලොව්තුරා බුදුරජාණන්වහන්සේ කරන්න බැරි දේවල්, කරලා ඉවරයක් කරන්න බැරි දේවල්, කරලා වැඩක් නැති දේවල් කරන්නය කියලා කිසිදාක දේශනා කළේ නැහැ. බුදුරජාණන් වහන්සේ පැහැදිලිව දේශනා කරනවා, ''මේ ලෝක ධාතුව බොහොම සංකීර්ණයි. ලෝකය සොයන්න යන්න, එය වෙනස් කරන්න යන්න එපා'' කියලා. එය නිශ්ඵල ක්‍රියාවක්. ලෝකය කියන්නේ ස්වභාවයෙන්ම වෙනස්වෙන තැනක්. එහි අපට වෙනස් කරන්න දෙයක් නැහැ. මොකද අපිත් වෙනස් වෙනවා. අපි වෙනස් වෙනකොට අපි ගැන සොයන්න කෙනෙක් නැහැ. අපි වෙනස් වෙනවා කියන්නේ අපිත් ජරා, ව්‍යාධි, මරණවලට ලක්වෙනවා. ලෝකය වෙනස් කරන්න යන ගමනේ කොතැනකදී හෝ අපිවත් මරණයට පත්වෙනවා. එහෙම මිය ගිහින් අපි අභ්‍යවකාශ ප්‍රේතයින්, විද්‍යාගාර ප්‍රේතයින් වෙලා උපත ලබයි. ඔබෙන් පස්සේ තව මහත්තයෙක් ඔබේ තනතුරට පත්වේවි. ඒත් ප්‍රේතයෙක් වුණ ඔබ අසරණ වෙනවා. ලෝකයත් අපිත් සෑම නිමේෂයකම වෙනස් වෙනවා. ලෝක ධාතුව නමැති විෂය ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමකගේ සම්මා සම්බුද්ධ ඥානයට පමණක් විෂය වෙන දෙයක්. ඒ නිසා මුළු ලෝක ධාතුවම අමතක කරලා මේ නාම රූප දෙකට ලෝකය ගෙනත් පෙන්නුවා. බැරි දෙයින් වළක්වලා පුළුවන් දෙය දේශනා කළා. ලෝකය කවදාත් තෘෂ්ණාව පස්සේ ලෝකය තුළ දුවනවා. ලෝකයේ අවසානය සොයන්න දිව ගොස් අවසානය තබා ආරම්භයවත් නොදැක සංවේගයට, මරණයට පත්වූ දෙවියන් අතීතයේ සිටියා. මේ කවුරුත් අවසානයේ සැනසුනේ බුදුරජාණන් වහන්සේ සෙවනේමයි. මේ අසිරිමත් ලොව්තුරා ධර්මය පින්වත් ඔබට ලෝකය විනිවිද දැකිය හැකි ධර්මයක්. ඒ ලෝකය විනිවිද දකින්නේ විද්‍යාගාර පර්යේෂණාගාර තුළදී නොවු පංචනීවරණයන් යටපත් නොවූ ඔබගේ ප්‍රභාෂ්වර සිත තුළින්මය.

# ප්‍රඥාවේ ඇසින් අත්දුටු ලොව්තුරා ධර්මයේ ආශ්චර්යය

මස් ඇසෙන් දකිනා ලෝකය මෝහයයි. ප්‍රඥාවේ ඇසින් දකිනා ලෝකය යථාර්ථයයි. සීලයේත් සමාධියේත් ඵලයෙන් උපදින ප්‍රඥාවේ ඇස, මංමුලා වූ ලෝකයෙන් ඔබ්බට භව නිරෝධය දෙසට පාර පෙන්වන ආලෝකයයි.

භික්ෂුව සමාධියෙන් පසුවන විට අරමුණු නොකරම ඒ ආලෝකය ඔස්සේ අපූරු දර්ශනයක් දර්ශනය විය. එය පිටසක්වල ජීවීන් පිරිසකගේ කියලයි භික්ෂුව අනුමාන කරන්නේ. ඒ කියන්නේ එය පිටසක්වල දර්ශනයක්. භික්ෂුවට දර්ශනය වන තැන බොහෝම ආලෝකවත් ස්ථානයක්. අක්කර දහයක පමණ භූමි ප්‍රදේශයක් දර්ශනය වුණා. ගහකොළ කිසිවක් පෙනෙන්නට තිබුණේ නැහැ. වැඩි උස නොවූ කෙටි ගොඩනැගිලි කිහිපයක් තිබුණා. මේවා පෙට්ටි හැඩයටයි තිබුණේ. කෘත්‍රිම ද්‍රව්‍යවලින් තනපු බවකුයි පෙනුණේ. එම ස්ථානය ළමා උද්‍යානයක්, ළමා පාසලක් වගේ තැනක්. කළු සහ සුදු පැහැති අඟුටුමිටි ළමයින් 25 ක් පමණ එතැන සිටියා. මේ හැම දරුවෙක්ම උපරිම අඩි 2 ක් පමණ උස ඇති. සියලුම දරුවන් දේහ ප්‍රමාණයෙන් එක වගේ. මේ දරුවන් බොහොම කඩිසර වේගවත් ඉරියව් දැක්වූවා. සෑම දරුවෙක්ම එක සමාන, වර්ණවත් ඇඳුම් ඇඳගෙන සිටියා. තද දම් පැහැති කෙටි කලිසමක්, රතු පැහැයට හුරු රෝස පැහැති උඩුකය බැනියමක්. එය මහත නූලෙන් ගෙතූ ඇඳුමකි. එහි කොටුවෙන් කොටුව හිදැස් ඇත. බැනියමේ පසුපස ගෙතූ පටි දෙකක් හරහට එල්ලෙමින් තිබිණි. සියලුම අඟුටුමිටි ළමයි

එකම ස්වභාවයේ ඇඳුම් මෝස්තර දරාගෙන සිටියහ. ස්වීටර් මහන රෙදි වර්ගයේ වැනි රෙදිවලිනි කෙටි කලිසම නිර්මාණය වී තිබුණේ. එම ඒකාකාරී ඇඳුමත්, දරුවන් සියලු දෙනා එකම ප්‍රමාණයේ වීමත්, ඔවුන්ගේ කඩිසර භාවයත් නිසා එය අපූරු චිත්‍රයක්.

මෙම දරුවන් සමග එක වැඩිහිටියෙක් සිටියා. ඔහු අඩි 4 ක පමණ අයෙක්. මේ ස්ථානයට යාබද පාරක් තිබුණා. එය අඩි 30 ක පමණ පළල පාරක්. එම පාරේ අලියෙක් ගමන් කළා. ඒ වැඩුණු අලියාගේ උස අඩි 5 ක් පමණ ඇති. එම සතා හීලෑ කළ කුරු අලියෙක් වගේ. මේ අලියාගේ එක කන් පෙත්තක කෙළවර වටාපතක් සේ මොනර පිල් කළඹක් තිබුණා. මොනරෙක් පිල විහිදාගෙන සිටින ආකාරයට එම පිල විහිදිලයි අලියාගේ කනේ පෙති අගට මුහුවෙලා තිබුණේ. එය ස්වාභාවික පිහිටීමක් හැටියටයි භික්ෂුව දැක්කේ. මේ අලියා සමග එක ප්‍රභූ මහත්මයෙක් ඇවිදගෙන යනවා. ඔහු සුදු ජාතිකයෙක් වගෙයි. ඔහුගේ උස අඩි 4 ක් විතර ඇති. ඔහු හොඳින් වැඩුණු වයස අවුරුදු 55 ක වගේ මහත්මයෙක්. මොහු කෝට් එකක්, දිගු කලිසමක් සහ ප්‍රභූන් පළඳින තොප්පියක් පැළඳගෙන සිටියා. මොහු බොහොම තැන්පත් ප්‍රභූ ලීලාවෙනුයි අලියා පසුපස ගමන් කළේ. අලියා සමග ඇත්ගොව්වෙකුත් ගමන් කළා. ඔහු කළු ජාතිකයෙක් වගෙයි. ඔහුත් අඩි 4 ක් පමණ උස ඇති. මොවුන් සියලු දෙනාම ප්‍රමාණයෙන් මිටි මනුෂ්‍යයින්. හැබැයි මේ අය බොහොම කඩිසරයි. ඒ වගේම පෞරුෂත්වයෙන් ඉහළයි. ගහකොළ නැති කෘත්‍රිමව නිර්මාණය කළ නගරයක්, පරිසරයක් වගෙයි එම පරිසරය භික්ෂුවට දර්ශනය වුණේ.

ඉහත අඟුටුමිටි ළමා පිරිස ඉහත ස්ථානයේ රැඳී සිටියදී තවත් ළමා අඟුටුමිටි පිරිසක් උද්‍යානයට ඇතුළුවීම සඳහා වාහනයකින් බසිමින් සිටියෝය. එම වාහනය නවතා තිබුණේ උද්‍යානයට යාව තිබූ අලියා ගමන් කළ මාර්ගයේ. එම මාර්ගය ගුවන් පථයක්, අධිවේගී මාර්ගයක් සේ තැනූ ඉතාමත් පිරිසිදු, මැදුණු කෘත්‍රිම

මාර්ගයක්. එම අඟුටුමිටි ළමා පිරිස පැමිණි වාහනයේ හැඩය අමුතුයි. වෙසක් සැරසිලි සඳහා හදන අටපට්ටම් කූඩුවක හැඩය තිබුණා.

භික්ෂුව ඉහතින් සමාධිය තුළ දී දකින්නේ පිටසක්වල ජීවීන් පිරිසක් බව භික්ෂුවට හොඳටම පැහැදිලියි. ලොව්තුරා බුදුජාණන් වහන්සේ දේශනා කොට වදාළ අප්‍රමාණ ලෝක ධාතුන්ගෙන් එකක ජීවත් වන මනුෂ්‍යයින් පිරිසක්. එය විනාඩියක් වැනි කෙටි කලකදී දර්ශනය වී මැකී ගොස් අවසන්. මේ කෙටි කාල පරාසය තුළ භික්ෂුව අත්දුටු දර්ශනයයි මෙහි සටහන් තැබුවේ. මෙම කාරණය කෙනකුගේ හාස්‍යයට විවේචනයට ලක් වීමටත් පුළුවන්. ප්‍රතිචාරය කුමක් වුවද එය භික්ෂුවට අදාළ වන්නේ නැහැ. මේ ධර්ම මාර්ගයේ ගමන් කිරීමේදී උතුම් සමාධිය තුළින් යමක් දැක්කද එය භික්ෂුව සටහන් තබන්නේ පින්වත් ඔබට උතුම් සද්ධර්මයේ අසිරිය ගැන නැවත නැවත සිතන්නයි. එසේ නැතිව පිටසක්වල ගැන පර්යේෂණ කරන්නට නොවේ. ලෝකයේ දේවත්වයෙන් සලකන තාක්ෂණය විසින් නොදැක්කා වූ ලෝකය, ප්‍රඥාවේ ඇසින් අත්දකින ලොව්තුරා ධර්මයේ ආශ්චර්යය ගැන කියන්නයි. භික්ෂුවට අවශ්‍ය සද්ධර්මය කෙරෙහි ඔබගේ විශ්වාසය එක දශමයකින් හෝ වැඩි කරන්න පමණයි.

ලෝකය බොහොම අනතුරුදායකයි. මොකද ඔබ සීමාව ඉක්මවා පිටසක්වල ලෝකයන් කෙරෙහි උපාදානය සකස් කොටගතහොත්, පින්වත් ඔබව ධර්මයක් නොමැති මිථ්‍යාදෘෂ්ටික පිටසක්වලක අඟුටුමිට්ටෙක් වෙලා, අඟුටුමිටි තිරිසන් සතෙක් වෙලා ඉපදීමේ අවදානම තිබෙනවා. ලෝකය තාක්ෂණයට විද්‍යාවට ලොල්වෙන්න ලොල්වෙන්න පිටසක්වල ජීවීන්ගේ ගහනය වැඩි වෙන්න පුළුවන්. දැනුම හරහා ලෝකය තුළින් ඔබ කොතැනින් එතෙර වීමට ගියත් දුකමයි. මිථ්‍යා දෘෂ්ටික භාවයමයි උරුම වන්නේ. සද්ධර්මය තුළින් ඔබ ලෝකයෙන් එතෙරට යන්න තබන පියවරක් පාසා සැපයමයි අයිති වෙන්නේ. මෙලොව ඇති ශ්‍රේෂ්ඨතම බලය, සීල සමාධි ප්‍රඥා බලයයි. එම බලයට ඕනෑම

මනුෂ්‍යයෙක්, දෙවියෙක්, බ්‍රහ්මයෙක් යටත්ය. ඒ ශ්‍රේෂ්ඨ බලයට අභියෝග කළොත් ඔහු අභියෝග කරන්නේ ඔහුටමය. මන්ද, බලවත් අකුසලයන් ඔහු එන පෙරමග බලා සිටිනා බැවිනි.

# ඔබත් අනෙක් අයත් අතර නැතිනම් වෙනසක්, දුකෙන් පිරුණු සසර කතර සදා උරුමයක්

පින්වත් ඔබ හැම විටම ගෙදර සිටින අනෙක් අයට වඩා වෙනස් කෙනෙක් වෙන්න. පන්ති කාමරයේ, කාර්යාලයේ, ගමේ, රටේ.... සිටින අන්‍යයන්ට වඩා වෙනස් කෙනෙක් වෙන්න. දන් දීමේදී, සිල් ආරක්ෂා කිරීමේදී, භාවනා කිරීමේදී අනෙක් අයට වඩා වෙනස් කෙනෙක් වෙන්න. මේ කියන්නේ කැපී පෙනෙන කෙනෙක් වෙන්න කියන කාරණාව නෙමෙයි. 'වෙනස්' කියලා මෙතැනදී කියන්නේ අර්ථයෙන් ධර්මයෙන් ගුණාත්මක කෙනෙක් වෙන්න කියලයි. මොකද ලොව්තුරා බුදුරජාණන් වහන්සේ තම නිය මතට පස් ස්වල්පයක් අරගෙන දේශනා කරනවා, පොළොවේ තිබෙන පස් ප්‍රමාණයට සාපේක්ෂව නියසිලේ තිබෙන පස් ප්‍රමාණය කොපමණක් ද, මේ වෙසෙන සත්ත්වයන්ට සාපේක්ෂව මරණින් මතු සුගතිගාමී වන සත්ත්වයන් ද ප්‍රමාණයෙන් ඒ වගෙයි කියලා.

පින්වත් ඔබට, බුදුරජාණන් වහන්සේගේ නිය සිලෙහි ඇති පස් ටිකෙන් එක වැලි කැටයක් වෙන්න අවශ්‍ය නම්, ඔබට අනිවාර්යයෙන්ම අනෙක් අයට වඩා වෙනස් කෙනෙක් වෙන්න වෙනවා. පින්වත් ඔබත් අනෙක් සියල්ලන්ම වගේ වුණොත් ඔබටත් සුගතිය අහිමි වේවි. මේ ලැබූ උතුම් අවස්ථාව ගිලිහී යාවී.

වරක් භික්ෂුව වස් තුන් මාසය එක්තරා ගම්මානයකට ආසන්න කුටියක වැඩ සිටියා. මාසයකටම එක් දිනක් පමණයි ගමේ ගෙදරකට පිණ්ඩපාතය බෙදන්න යෙදී තිබෙන්නේ. වෙසක් පෝය දිනය ආවත් ඒ අය තමන්ගේ දිනයට පිටින් වෙනත් දිනයක අතිරේකව දානයක් බෙදන්නේ නැහැ. අවම වශයෙන් වෙසක් පුරපසොලොස්වක දිනකවත් අතිරේකව දානයක් පූජා කරන්නේ නැහැ. නමුත් මේ ගමේ එක්තරා මැදි වියේ කාන්තාවක් හිටියා, ඇය තම දානය යෙදී ඇති දිනයට අමතරව මාසයකට හතර පස් වතාවක්, පාරට ඇවිත් ගෙදර උයන කෑමට හදා ගත් මොකක් හරි පොඩි දෙයක් හෝ පූජා කරනවා. ගමේ කාටවත් නැති ලක්ෂණයක් භික්ෂුව ඇගෙන් දුටුවා. ඒ කියන්නේ ගමේ සියල්ලන්ට වඩා ඇය වෙනස් කෙනෙක්. නමුත් වස් කාලයේ අවසන් මාසයේදී ඇය ඒ පුරුද්ද අතහැර දැමුවා. මොකද ගමේ අනෙක් පින්වතුන් කිසිවෙක් එහෙම නොකරන නිසා. ඒ කියන්නේ ඇයත් අනෙක් සියල්ලන් වගේම වුණා. එම නිසා පින්වත් ඔබත් අනෙක් හැමෝම වැඩ කරන කාලසටහනට, ඒ අයගේ චර්යාවටම වැටෙන්න එපා. දාන, ශීල, භාවනා මාර්ගයේ ගුණාත්මක භාවයෙන් පෙරට යන්න දක්ෂ වෙන්න. මොකද, ඔබ තුළින්මයි ඔබේ සැනසීමත්, දුකත් දෙකම සකස් වෙන්නේ. පින්වත් ඔබ ශ්‍රද්ධාවෙන්, ගෞරවයෙන්, කර්මඵල විශ්වාසයෙන් බෙදන එක බත් හැන්දක, සමාදන්ව ආරක්ෂා කරන එක සිල් පදයක් තුළ දෙවියෙක්, දිව්‍යාංගනාවක් දකින්න ඔබ දක්ෂ වෙන්න. එක මොහොතක් අනිත්‍ය සංඥාව වැඩීමේදී, එම අනිත්‍ය සංඥාව තුළින් රහතන් වහන්සේ නමක් දකින්න දක්ෂ වෙන්න. එහෙමයි ඔබ වීර්යය සකස් කොටගත යුත්තේ, මේ මාර්ගයේ පෙරට යන්න. අනුන් ආදර්ශයට අරගෙන නොවේ, තමා තුළින්ම දුකේ අම්හිරි බව දැකලයි එසේ කළ යුත්තේ. අනුන් කරන දේවල් කරන්න ගිහිල්ල තමයි අපි සංසාරයේ තවමත් දුක තුළම සිටින්නේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ කියපු දෙයම කරන්න. උන්වහන්සේ දකින්න කියපු ආකාරයටම දකින්න.

# සංසාරයේ කී වරක් නම් ඔබ ඔතැනම මිහිදන්ව ඇත්ද?

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටින කාලයේ එක්තරා වස්තු සම්පත් ඇති සශ්‍රීක බමුණෙක් ජීවත් වුණා. මේ බමුණාට කාටවත් ඇති නොවන විදිහේ අශාවක් ඇති වුණා. ඒ ආශාව තමයි තමන් මැරුණාට පසුව කිසිම සත්වයෙක් වළ නොදැමූ බිමක තමාගේ දේහය මිහිදන් කළ යුතුයි කියන ආශාව.

බමුණා මිථ්‍යාදෘෂ්ටික කෙනෙක් වුවත් මරණානුස්සතිය කියන කාරණය වඩලා තිබෙන කෙනෙක්. ඒ කියන්නේ තමා මැරෙනවාය කියල දන්න කෙනෙක්. තෙරුවන් කෙරෙහි සද්ධාවෙන් තොරව මරණානුස්සතිය වැඩීම නිසාම සංසාර බිය උදෙසා නොවේ මේ බමුණාට මරණානුස්සතිය වැඩුනේ. මරණය තුළිනුත් ආශ්වාදයක් සෙවීමේ අරමුණ ඇතිවයි, මරණානුස්සතිය වැඩිලා තිබුණේ. මරණයට පෙර මරණය ආශ්වාදයක් කරගන්න මනුෂ්‍යයෝ ඕනෑ තරම් සමාජයේ සිටිනවා. මරණය ආශ්වාදයක් කරගන්නා තැනත්තා මැරිලා ඉපදෙනවාය කියන කාරණය දකින්නේ නැහැ. එයා මරණය කියන කාරණය දකින්නේ නැහැ. එයා මරණය කියන කාරණය ළඟ නවතිනවා. මේකම බුදුරජාණන් වහන්සේ 'විභව තණ්හාව' කියලා කියනවා. නැවත උපතක් නැහැය කියන විශ්වාසයයි ඔහු තුළ තිබෙන්නේ. ඔහු සිතනවා මරණින් පස්සේ සියල්ල ඉවරයි කියලා. ඒ නිසාම ඔහු මරණය ආශ්වාදයක් කරගෙනමයි මැරෙන්න හදන්නේ.

භික්ෂුව දන්න එක්තරා මහත්තයෙක් සිටියා ඒ මහත්මයා තමා මැරෙන්නට පෙරාතුව මිනී පෙට්ටියක් ගෙදරට ගෙනත් තියාගත්තා. ඔහු හැමදාම මේ මිනී පෙට්ටියේ නිදා ගන්නවා. ඔහු බීමත්වයි හුඟාක් වෙලාවට සිටින්නේ. ඔහුට මරණය ආශ්වාදයක්. මරණින් මතු නැවත උපදිනවාය කියල ඔහු දන්නේ නැහැ. ඔහු මැරෙන්න කැමතියි. ඔහු සිතනවා මරණින් පස්සේ මේ දුක් ගොඩ ඉවරයි කියලා.

භික්ෂුව දන්න තවත් මහත්මයෙක් සිටියා. ඔහු තමන්ගේ ඥාතීන්ට මරණයට පෙරාතුව කියා තිබුණා මරණයට පසුව තමාට පාංශුකූලයක්, මතක බණක්, දානයක් දෙන්න එපාය කියල. ඔහු සැම වෙලාවේම කිව්වේ 'මැරෙනකම් හොඳට කාල බීල ඇඳලා, පැළඳලා, ජීවත් වෙන්න. සියල්ල මැරෙනකම් පමණයි, මරණින් පසුව කිසිවක් නැහැ'ය කියලා. මේ අය මරණය ආශ්වාදයක් කරගන්න අය. මරණය තමයි මේ අයගේ විමුක්තිය. මැරිල නැවත ඉපදෙනවාය කියන විශ්වාසය මේ අයට නැහැ. මරණින් පසුව සියල්ල ඉවරයි කියන විශ්වාසය ඔවුනට තිබෙන්නේ. ඉහත බමුණත් මේ දෘෂ්ඨිය තිබුණ කෙනෙක්. බමුණා තමන්ගේ සේවකයනුත් අරගෙන මීට පෙර කිසිවෙකු වළ නොදැමූ බිම්කඩක් සොයමින් කැලය පීරමින් ගියා. බොහෝම දුරක් කැලයේ ඇවිදලා විශාල ගසක් යට යම් ස්ථානයක් බමුණා සලකුණු කළා. වටපිට හොඳින් නිරීක්ෂණය කළා. බමුණාට හොඳටම විශ්වාසයි තමා සලකුණු කළ තැන අතීතයේ කිසිවකු වළ නොදැමූ තැනක්ය කියල. බමුණා තම සේවකයන්ට අණ කළා තමා සලකුණු කළ ස්ථානයේ වළක් හාරන්න කියලා. බමුණා ලෝකයක් දිනා ගත්තා වගේ සතුටකින් සිටියේ. ඔහු තම ඥාතීන්ව සේවකයින්ව දැනුවත් කළා. තමා මැරුණාට පසුව මේ වළේම වළදමන්න කියලා. තමා මරණින් පසුව මේ වළ ඇතුලේ සමාදානයේ සැතපෙන ආකාරය මේ බමුණා සිහිපත් කළා. බමුණාගේ සේවකයන් මිනී වළ හාරමින් සිටියදී මෙතැනට ලොව්තුරා බුදුරජාණන් වහන්සේ වැඩම කරනවා.

බුදුරජාණන් වහන්සේ බමුණාගෙන් විමසනවා 'බමුණ, ඔබ ඔය කුමක්ද කරන්නේ කියලා. ඒ වෙලාවේ බමුණා කියනවා මම මේ කව්රුවත් නොකළ වැඩක් කරන්න යන්නේ. මම මැරුණාට පස්සේ මගේ දේහය මීට පෙර කිසිවෙකු වළ නොදැමූ තැනක වළ දැමීමට මට ආශාවක් ඇති වුණා. මට හොඳටම විශ්වාසයි මේ ස්ථානයේ මීට පෙර කිසිවෙකු වළදමා නැහැ'ය කියලා. ඒ වෙලාවේ බුදුරජාණන් වහන්සේ පූර්වේනිවාසානුස්සති ඥානයෙන් අතීතය බලා දේශනා කරනවා, බමුණ ඔබ මේ සලකුණු කර ඇති ස්ථානයේ අතීතයේ ඔබවම දහතුන්දාස් වාරයක් මැරිල වළ දමලා තිබෙනවාය කියලා. බුදුරජාණන් වහන්සේ බමුණාට දුන් මේ පිළිතුර බමුණාට සිතාගන්නවත් බැරිව ගියා. බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය අභියස බමුණා නුවණින් මෙනෙහි කරන්න පටන් ගත්තා. බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළ සංසාරයේ ගැඹුර තේරුම් ගත්ත බමුණා තමාගේ ළදරු මනෝභාවයට සමච්චල් කරමින් තෙරුවන් සරණ පිහිටියා. තමාම අතීත භවයන්හිදී දහතුන්දහස් වාරයක් මිහිදන් වුණ බිම්කඩම කමටහනක් කරගනිමින්, බමුණා සද්ධර්මය ශ්‍රවණයකර තමාගේ අනාගත භවගමන උපරිම ආත්ම භාව හතකට සීමා කොට ගත්තා.

පින්වත් ඔබ නුවණින් දකින්න, ඔබ දෙපා තබාගෙන සිටින ඔය බිම් තීරුව මත ඔබ අතීතයේ කී දහස් වාරයක් මිහිදන් වෙලා ඇතිද කියලා.

# ඔබේ අතීත
# භව ගමනේ කැඩපතක්
# ඔබ ඉදිරියේ ඇත.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මුළු දඹදිව තිබෙන කෝටු කැබලි එක ගොඩක් ගසලා ඒ සෑම කෝටු කැබැල්ලක්ම ඔබේ ඇඟිල්ලේ ප්‍රමාණයට කඩන්න කියලා. දැන් මේ කෝටු කැබැල්ල කෝටු කැබැල්ල අයින් කරන්න කියනවා. මේ මගේ මේ ජීවිතේ අම්මා, මේ මගේ අම්මාගේ අම්මා, වශයෙන්. ඔබේ පරපුර ඉවර නොවී තිබියදීම කොටු කැබලි ප්‍රමාණය ඉවර වෙනවා කියලා. මෙසේ මැරෙමින් ඉපදෙමින් පැමිණි ගමනේදී මනාප දෙයින් වෙන් වීමට සිදුවෙලා, අමනාප දෙය සමග එක් වීමට සිදුවෙලා නෙතින් ගලා ගිය කඳුළු මහා සාගරයේ ජලයට වැඩියි කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ මහ පොළවේ ඇති පස් සියල්ලම වෙරළු ගෙඩි තරමට ගුලි කරන්න කියලා. එහෙම ගුලි කරලා එක් එක් වෙරළු ගෙඩි ප්‍රමාණයේ පස් ගුලිය ගුලිය අයින් කරන්න කියනවා. මේ මගේ ගෙවී ගිය එක කල්පයක්. මේ මගේ ගෙවී ගිය දෙවැනි කල්පය, මේ මගේ ගෙවී ගිය තුන්වෙනි කල්පය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. වෙරළු ගෙඩි ප්‍රමාණයේ පස් ගුලි ඉවර වෙනවා. ඒත් තමා ගෙවාගෙන පැමිණි කල්ප ප්‍රමාණය ඉවර වෙන්නෙ නැහැ කියලා.

මේ සංසාරේ ගැඹුර පින්වතුන්ලා කමටහනක් කරගන්න. මේවා නුවණින් මෙනෙහි කරමින් සංසාර බිය සකස් කරගන්න.

ප්‍රඥාව කියන කාරණය ආලෝක පූජා තුළින්, විදුලි පන්දම් පූජාව තුළින් ඇති වන්නේ නැහැ. ඔබ තුළ ප්‍රඥාව මෝදු වෙන්න නම් කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලැබෙන්න ඕන. සද්ධර්ම ශ්‍රවණය සිද්ධ වෙන්න ඕන. ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කරන්න ඕන. එවිටයි පින්වත් ඔබ තුළ ප්‍රඥාව ඇතිවෙන්නේ.

මේ නුවණින් මෙනෙහි කිරීම කියන කාරණයෙන් වර්තමානයේ පින්වතුන්ලා හුඟක් බැහැරවයි සිටින්නේ. නුවණින් මෙනෙහි කිරීම හීන වන විට අපි මෝහය දෙසටයි ගමන් කරන්නේ. ඔබ සංසාරයේ ගෙවා පැමිණි දුර සද්ධර්ම ශ්‍රවණය ඔස්සේ මතු කර ගන්න. විවේකීව සිටින වේලාවට තමා සංසාරයේ ලබා ඇති ජීවිත නුවණින් සිහි කරන්න. දෙහිවල සත්ත්ව උද්‍යානයේ ඇති සතුන් ඔබේ අතීත භව ගමනේ කැඩපතක් ලෙස දකින්න. අතීතයේ ඔබ සක්විති රාජ සම්පත්, ශක්‍ර, දිව්‍ය සම්පත්, මනු ලොව ධන කුවේර සම්පත් ලබලා සතුටු වුන හැටි නුවණින් දකින්න. එම සැපයන්ගෙන් තෘප්තිමත් භාවයට පත් නොවූ නිසාම නැවත කල්ප ගණන් සතර අපායන්හි ඉපදිලා සෙම්, සෙම් සොටු ගිනි අඟුරු, ලෝදිය, තණකොළ, පුන්නක්කු ආදී දුකම අනුභව කර ජීවත් වුණ අතීතය සිහිපත් කරන්න. බුදුරජාණන් වහන්සේ තමයි කල්‍යාණ මිත්‍රයා වශයෙන් අපට මේ සංසාර බිය මතුකර පෙන්වන්නේ. පින්වත් ඔබ මේ අතීත සංසාර ගමන නුවණින් මෙනෙහි කරන්න දක්ෂ වුවහොත් ඔබට දැනේවි මේ තිරිසන් ලෝකයේ ජීවත්වෙන සෑම සතෙක්ම, මේ ප්‍රේත ලෝකයේ ජීවත්වෙන සෑම සත්ත්වයෙක්ම, ඔබගේ ඥාතිවරයෙක්ය කියලා. මේ සුගතියේ දිව්‍ය, බ්‍රහ්ම, මනුෂ්‍ය ලෝකවල ජීවත්වන සෑම සත්ත්වයෙක්ම ඔබගේ අතීත ඥාතිවරයෙක්ය කියලා. බුදුරජාණන් වහන්සේ ස්වාමීන් වහන්සේලාට දේශනා කරනවා අවිද්‍යාව නිසා ඉපදෙමින් මැරෙමින් පැමිණි ගමනේදී රජවරු හිස ගසා දමද්දී වගුරපු රුධිරයද මහා සාගරයේ ජලයට වැඩිය කියලා. ගව යෝනියේ, බැටළු යෝනියේ, ඌරු යෝනියේ ඉපදිලා හිස ගසා දමද්දී ගලා ගිය රුධිරය මහා සාගරයේ ජලයට වැඩිය කියලා. මහා සාගරය පරදවන තරම් රුධිරය අප සංසාරයේ

හෙළා තිබෙනවා. ඉපදෙමින් මැරෙන ස්වභාවය අවසන් නොවන දෙයක්. නිදහස් වෙන්නමයි ඕනේ කියලා, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

අනේපිඬු සිටුතුමා, විශාඛා උපාසිකාව, නකුලමාතාව බුදුරජාණන් වහන්සේ හමුවන මුල්ම දැක්මේදීම සංසාර බිය නුවණින් මෙනෙහි කිරීම තුළින්මයි සෝවාන් ඵලයට පත්වෙන්නේ. පින්වත් ඔබට සිතන්න පුළුවන් ඒ අයට ගොඩාක් පාරමී ශක්තිය වැඩිය කියලා. එම අදහස සද්ධාවේ දුර්වලතාවයක් හේතුවෙන් සකස් වෙන විචිකිච්ඡාවේ ස්වභාවයක් හැටියට දකිමින් බැහැර කර දමන්න. ලෝකයා සිතන විදිහට සිතන්න ඔබ පෙළඹෙන්න එපා. ලෝකය යන්නේ දුක දිශාවටයි. ඔබ ලෝකයම කමටහනක් කරගෙන ලෝකයෙන් මිදෙන දිශාවට එන්න.

රූපය කෙරෙහි තිබෙන තෘෂ්ණාව රූපය ඇසුරු කරමින් ක්‍රමානුකූලව හීන කරගන්න. රූපයට රූපයේ ස්වභාවයෙන් තිබෙන්ට හැර රූපය කෙරෙහි ඇති තෘෂ්ණාව අතහරින්න. ඔබ අතහරින දෙය අල්ලා ගන්න ඕන තරම් ලෝකයා ඉන්නවා. ඔබ ලෝකයෙන් හිස්වුණාය කියලා ලෝකයට පාඩුවක් නැහැ.

# අධර්මයේ කාලය අති දීර්ඝයි

ලෝකයට හැමදාමත් පෙරහැරවල් දෙකක් තිබෙනවා. එක පෙරහැරක් තමයි ධර්මයේ පෙරහැර. අනෙක් එක තමයි අධර්මයේ පෙරහැර. ලෝකයේ හැමදාමත් අධර්මයේ පෙරහැර දිග වැඩියි. ධර්මයේ පෙරහැර හැමදාමත් දිගින් අඩුයි.

ධර්මාවබෝධය සඳහා ඇතිවන බුද්ධෝත්පාද කාල වල ආයුෂත් හුඟක් අඩුයි. අධර්මයේ කාලය, අති දීර්ඝයි. කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයේ මනුෂ්‍යයාගේ පරමායුෂ අවුරුදු විසි දහසක්. ගෞතම බුදුරජාණන් වහන්සේගේ කාලයේ පරමායුෂ අවුරුදු එකසිය විස්සයි. දැන් ඔබ නුවණින් දකින්න. කාශ්‍යප බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පා අවුරුදු කී ලක්ෂයක් ගියාට පස්සෙද අපේ ගෞතම බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්වෙන්නේ?

පරමායුෂ අවුරුදු විසි දාහක්, පරමායුෂ අවුරුදු එකසිය විස්සක් බවට ක්‍රමානුකූලව අඩු වෙන්න අවම තරමින් අවුරුදු ලක්ෂ දහයක්වත් ගතවෙන්න ඕනේ. ඒ අවුරුදු ලක්ෂ දහයම පාහේ අබුද්ධෝත්පාද කාලය. ඒ කියන්නේ මාරයාගේ කාලය. මාරයා විසින් ලෝකය පාලනය කරන කාලය. කාශ්‍යප බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පාලා අවම වශයෙන් අවුරුදු ලක්ෂ දහයකට පසුවයි ගෞතම බුදුරජාණන් වහන්සේ පහළ වෙන්නේ. ඒ වගේමයි ගෞතම සම්මා සම්බුද්ධ ශාසනය තව ටික කාලයකින් අතුරුදන් වෙලා, නැවත මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ශාසනය ඇති වන්නේ තවත් අවුරුදු ලක්ෂ විසි පහක්වත් ඈතට ගිහිල්ලයි.

අබුද්ධෝත්පත්ති කාල වලදී, සතර අපායේ සත්ත්වයාගෙත්, මනුෂ්‍යයාගෙත් අතර වෙනසක් නැහැ. සුගතියෙත් දුගතියෙත් වෙනස ඇතිකොට දෙන්නේ සීලය විසින්. අබුද්ධෝත්පත්ති කාලවලදී ධර්මය බවට පත්වෙන්නේ දුස්සීල භාවයයි. දුස්සීලභාවය නිසා, මනුෂ්‍යයාගේත්, දෙවියාගේත් තිබෙන ගුණාත්මක භාවය හීන කරනවා. මනුෂ්‍යත්වයට වටිනාකමක් ලබා දෙන්නේ බුද්ධෝත්පාද කාලයයි. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මනුෂ්‍ය ජීවිතයක් ලැබීම ඉතාම දුර්ලභ දෙයක් හැටියට. එය කණ කැස්බෑවෙක් විය සිදුරෙන් අහස බලනවා වගේ දුර්ලභ දෙයක්ය කියලා.

එසේ නම් පින්වත් ඔබ නුවණින් දකින්න ඕනේ, මෙතැනදී බුදුරජාණන් වහන්සේ කණ කැස්බෑවෙක් විය සිදුරෙන් අහස බලනවා වගේ, මනුෂ්‍ය ජීවිතයක් ලැබීම දුර්ලභ දෙයක් බව කියන්නේ මේ උතුම් බුද්ධෝත්පාද කාලයක, උතුම් බෞද්ධයෙක් වශයෙන් ඉපදීමයි. මිථ්‍යාදෘෂ්ටික භාවයට පත් වී ඉපදීම, අබුද්ධෝත්පත්ති කාලවල මනුෂ්‍ය ජීවිත ලබා ඉපදීම, දුර්ලභ මනුෂ්‍ය ජීවිතයක් බවට පත්වන්නේ නැහැ. පින්වත් ඔබ නුවණින් මෙනෙහි කිරීම තුළින්ම මේ සත්‍යය දකින්නට ඕනේ. ඔබ මේ සත්‍යය දකින්නට අදක්ෂ වුවහොත්, මේ ලැබූ උතුම් බෞද්ධ ජීවිතයේ වටිනාකම ඔබ මතුකොට ගන්නේ නැහැ. මේ ලෝක ධාතුව තුළ ජීවත් වෙන හැම මනුෂ්‍යයෙක්ටම වඩා ඔබ මේ බුද්ධෝත්පාද කාලය තුළ ලැබූ මනුෂ්‍ය උපත ශ්‍රේෂ්ඨ වෙනවා. කණ කැස්බෑවෙක් විය සිදුරින් අහස දකිනවාය කියන අතිශයින් දුර්ලභ ඉලක්කය ඔබ සපුරාගෙන සිටිනවා. ඒකයි භික්ෂුව ඔබට කියන්නේ ඔබ ලැබූ මේ උපත, කාලය, දීපය, දේශය, කුලය, මව කියන කාරණා බලා ලැබූ උපතක්ය කියලා. පින්වත් ඔබ මේ උතුම් ධර්මතාවයන් සපුරා ගනිමින් ලැබූ මේ උපත අර්ථවත් කරගන්න දක්ෂ වෙන්න ඕනේ.

අපි සිතා ඉන්නවා මෛත්‍රී බුදුරජාණන් වහන්සේ තව අවුරුදු පන් දහසකින් පහළ වෙනවාය කියලා. මෙවැනි අදහස් අමූලිකා

ශ්‍රද්ධාව හැටියටයි ගැනෙන්නේ. ඔබම පැනක් කොළයක් අරගෙන කාලය පිළිබඳව තීරණයකට එන්න.

බුදුරජාණන් වහනසේ ජීවමානව වැඩසිටි කාලයේ පරමායුෂ අවුරුදු එකසිය විස්සයි. වර්තමානයේ මනුෂ්‍යයාගේ පරමායුෂ අවුරුදු හැත්තෑවට විතර අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ වසර දෙදහස් පන්සියයක කාලය ගෙවී යද්දී පරමායුෂ අවුරුදු පනහකින් මනුෂ්‍යයාගේ ආයුෂ අඩුවෙලා තිබෙනවා. මෛත්‍රී බුදුරජාණන් වහන්සේ පහළ වන්නේ මනුෂ්‍යයාගේ ආයුෂ අවුරුදු අසූ දහසක් දක්වා ඉහළ නැගපු කාලයකදියි. එසේ නම් ඔබම ගණන් හදා බලන්න, අවුරුදු දෙදහස් පන්සියයකට ආයුෂ අවුරුදු පනහක අඩු වීමක් සිද්ධ වෙනවා නම්, මනුෂ්‍යයාගේ ආයුෂ අවුරුදු අසූ දහසක් දක්වා ඉහළ යන්න අවම වශයෙන් තව අවුරුදු ලක්ෂ විසි පහකටත් වැඩිය යනවා. පින්වත් ඔබ නිවැරදිවම ගණන් හදා බැලුවහොත් මෙම කාලය මීටත් වඩා වැඩිවිය හැකි බව ඔබට තේරුම් යනු ඇත. අතීත, වර්තමාන, අනාගත තුන් කාලයම අනිත්‍යවන ලොවක, පින්වත් ඔබගේ ධර්ම මාර්ගය, අනිත්‍යවන කාලයට භාර නොදෙන්න. අතීත, වර්තමාන, අනාගත තුන් කාලයම අනිත්‍ය වශයෙන් දකිමින් කාලය පරාජය කොට අවබෝධය මතුකොට ගන්න. පින්වත් ඔබ යම් දවසක කාලයේ අනිත්‍යභාවය අවබෝධ ඥාණයට හසුකොට ගනිද්දී අතීත, වර්තමාන, අනාගත තුන්කාලය යනු සංස්කාරයන්ගේම ඇස්බැන්දුමක් බව ඔබට අවබෝධවනු ඇත. පින්වත් ඔබ මොහොතක් ඇස් දෙක පියාගෙන අනිත්‍යට සිත යොමු කොට අතීත, වර්තමාන, අනාගත තුන් කාලයම වංචාකාර නුවණින් මෙනෙහි කරන්න. කාලයේ හිස් භාවය දකිමින් වර්තමානය කෙරෙහි තෘෂ්ණාව අතහරින්න.

# මේ ශාසනයේ අවසාන බැබලීමයි

මේ මොහොත ධර්මයේ අර්ථයන් දීප්තිමත්ව බබළන මොහොතක්. එය හරියටම සවසට මුහුදු වෙරළට ගොස් ඉර බැස යනවා බලන විට ඇති වන ඉරේ දීප්තිය වගේ. අතුරුදන් වීමේ ඇරඹුමයි අපිට දීප්තියේ ප්‍රභාශ්වරභාවය තුළින් මතක් කර දෙන්නේ. වර්තමානයේද බුදුදහමේ අර්ථයන් ජීවමානව තිබෙන බැවින් එම අර්ථයන් තුළින් ගුණාත්මක පණිවිඩයක් ලෝකයාට ලැබෙන නිසා ලෝකයේ පවතින අනෙකුත් ආගම්ද ඒවායේ ගුණාත්මකභාවය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට උත්සාහ ගන්නවා. මොකද බුදුදහමේ ශක්තිමත් අර්ථයන්ට මුහුණදීමට. එසේ නොවුණහොත් බුදුදහමේ අර්ථයන් ඉදිරියේ ඔවුන්ගේ ආගම් අර්ථශූන්‍ය වෙනවා. නමුත් යම් දවසක බුදුදහමේ අර්ථයන් ගිළිහී ගියොත්, ඒ කියන්නේ ශ්‍රද්ධාවෙන් පෝෂණය වුණ සීලය අතුරුදන්ව ගියොත්, අන්‍ය ආගම්වලට තරග කිරීමට දහමක් ලෝකයේ නැතිව යනවා. ඒ හේතුව නිසා මුළු ලෝකයම සදාචාරාත්මක බිඳ වැටීමකට ලක්වෙනවා. සීලය විකෘති වී ගිය දුශ්සීල සමාජයකදී මනුෂ්‍යයා සහ තිරිසන් සත්ත්වයා අතර වෙනසක් නැහැ. එවන් සමාජයක මනුෂ්‍යත්වය කියන කාරණය දුර්ලභ දෙයක් වෙන්නේ නැහැ.

එක් ධර්ම සාකච්ඡාවකදී මහත්මයෙක් ප්‍රශ්නයක් ඇසුවා සමාජය එන්න එන්නම පිරිහුණත් උතුම් යැයි සැලකෙන මනුෂ්‍ය ජනගහණය ශීඝ්‍රයෙන් වැඩිවෙන්නේ කොහොමද කියලා. නමුත් මෙවන් කලක මනුෂ්‍යයා දුශ්සීල වෙන්න වෙන්න මනුෂ්‍ය ජනගහණය වැඩි වෙනවා. එය හේතුඵල ධර්මයක්. මනුෂ්‍යයා

සීලයෙන් පිරිහෙනකොට මනුෂ්‍යයා තිරිසන් සතුන් සමග වඩාත් ලෙන්ගතු වෙනවා. දැන් බල්ලෙක්, පූසෙක්, මාළු ටැංකියක් නැති ගෙදරක් නැති තරම්. ශ්‍රද්ධාවෙන් පෝෂණය වුණ සීලය පිරිහෙනවිට මනුෂ්‍යයා තිරිසන් සතුන්ව මගේ කරගන්නවා. දරුවන් කරගන්නවා. බිරිඳ කරගන්නවා. තිරිසන් සතුන් සමග කාමයේ හැසිරෙන මිනිසුන් සමාජයේ සිටිනවා. විදේශ රටවල මේ තත්ත්වය වැඩියි. ඒ වගේමයි මනුෂ්‍යයා ශ්‍රද්ධාවෙන් පිරිහෙන විට ප්‍රේතයා, යක්ෂයා කියන සත්වයින් සමග ඇසුරත් හුඟක් වැඩි වෙනවා. රට පුරාම තොවිල්, දේවාල, සාස්තර කියන ස්ථාන වේගයෙන් වැඩි වෙනවා. මේ හැම දෙයක් තුළින්ම අමනුෂ්‍යයින්, මනුෂ්‍යයින් සමග සම්බන්ධ වෙනවා වැඩියි. මනුෂ්‍යයාත් සතර අපායේ සත්ත්වයන් අතරත් ඇසුර වැඩිවෙන්නේ ශ්‍රද්ධාවෙන් තොර දුශ්ශීලභාවය නිසයි.

සතර අපායත් උතුම් මනුෂ්‍ය ජීවිතයත් අතර ඇති පරතරය නොදකින නිසා මනුෂ්‍යයාත් සතර අපායේ සත්ත්වයාත් වෙන්කර දක්වන සිල්වත්භාවය මනුෂ්‍යයා තුළින් අතුරුදන්වෙමින්, මනුෂ්‍යයා දුසිල්වත් වෙනවිට, මනුෂ්‍ය ජීවිතයක් ලැබීම දුර්ලභ කාරණයක් වෙන්නේ නැහැ. එවිට මනුෂ්‍ය ජීවිතයේ වටිනාකම තිරිසන් සතා, ප්‍රේතයා කියන තැන ආසන්නයටම වැටෙනවා. එවිට මනුෂ්‍ය ජීවිතයක් ලැබීම කණකැස්බෑවෙක් විය සිදුරෙන් අහස බලනවා වාගේ දුර්ලභ දෙයක් නොවේ. මනුෂ්‍යයා මැරිලා තිරිසන් සතෙක්, ප්‍රේතයෙක් වෙනවා වගේම තිරිසන් සතුන් අමනුෂ්‍යයින් මැරිලා මනුෂ්‍යයින් වශයෙන් ඉපදෙනවා. මනුෂ්‍යයාගේ දුස්සීලභාවය නිසා වැඩි වශයෙන් තිරිසන් සතුන් ප්‍රේතයින් ඇසුරට යාම හේතුවෙන් මේ සතර අපායේ සත්ත්වයින් මැරෙන මොහොතේ මනුෂ්‍ය උපාදානයක් සකස් කරගෙන මනුෂ්‍යයන් වශයෙන් උපදිනවා. මේ හේතුවෙන් වේගයෙන් මනුෂ්‍ය ගහනය ඉහළ යනවා. තිරිසන් සතුන් අමනුෂ්‍යයින් මැරිලා වේගයෙන් මනුෂ්‍යයින් වශයෙන් ඉපදෙනවා. නමුත් එම මනුෂ්‍යයාගේ ගුණාත්මකභාවයක් නැහැ.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මනුෂ්‍යයා දුස්සීලභාවයට පත්වෙන වේගයෙන්ම දෙවියාද දුස්සීලභාවයට පත්වෙනවා කියල. මොකද මනුෂ්‍යයාගේ දුස්සීලභාවය දැකල කාමඡන්දයන්ට ප්‍රිය කරන මාර්ගඵලලාභී නොවන දෙවියනුත් මනුෂ්‍යයාගේ ආදර්ශය ලබමින් දුස්සීලභාවයට පත්වෙනවා. දෙවියන්ද දුස්සීලභාවයට පත්වීම නිසාම දෙවියන් තුළද ලෝභ, ද්වේෂ, මෝහ අකුසලයන් බහුල වී දෙවියන්ද මනුෂ්‍ය ලෝකයේ උපදිනවා. මනුෂ්‍ය ජනගහණය තව තව වැඩි වෙනවා. අබුද්ධෝත්පාද කාලවල දිව්‍යතලවල දෙවියන්ගේ ගහනය ශීඝ්‍රයෙන් පහළ බසිනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මේ පහළ යන දිව්‍ය ගහනය, මනුෂ්‍ය ලෝකයේ ජනගහණයටයි එකතු වෙන්නේ. දැන් ලෝකය එකම අවුලක්.

පින්වත් ඔබ මේ ජීවිතයේදී අදක්ෂ වුවහොත්, ඔබටත් මේ අවුලේ කොටස්කරුවෙක් බවට පත්වෙන්නට සිද්ධ වේවි. එදාට ලෝකයේ ධර්මය බවට පත්වන්නේ ඇනකොටා ගැනීම, මරා ගැනීම සහ යටත් කොට ගැනීමයි.

ශ්‍රද්ධාවෙන් පෝෂණය වුණ සීලය අතුරුදන්ව ගිය සමාජයකදී ඔබව හරකුන් එළුවන් වගේ කෑලි කෑලි වලට කපා මරා දමාවි. මුවන් ගෝනුන් සේ වෙඩි තබා මරා දමාවි. ගස්වල අතුරිකිලි කපනවා වාගේ ඔබගේ අතපය කපලා දමාවි. ගල්ගෙඩි හිස මතට අතහැරලා පණ පිටින් ඔබේ හිස කුඩුකරාවි. අමු අමුවේ ඔබලාව පුච්චලා මරාගෙන කාවි. ජනගහණය වැඩි වීමත්, ස්වභාවික සම්පත් හීනව යෑමත් නිසා බලකාමී යුද කෝලාහලවලට මැදිවී ඔබ මැරුම්කාවි. දුකම, කඳුළම වියෝවම උරුම කරදෙන දුස්සීල සමාජයක් අනාගතයේ ඔබට උරුම කරදෙන්නේ. මේ සත්‍ය තත්ත්වය නුවණින් මෙනෙහි කරමින් අනාගත සංසාර බිය ඇතිකර ගන්න. අතීතයේ ගෙවුණ අබුද්ධෝත්පාද කාලවල ඔබ විඳ ඇති දුක් ගොඩ නුවණින් දකින්න. මැනවින් දැකීම තුළින්මයි ඔබ අවබෝධයෙන් කලකිරෙන්නේ. අවබෝධයෙන් කලකිරීම තුළින්මයි ඔබ නොඇලීමේ අර්ථය මතුකරගන්නේ. නොඇලීමේ

අර්ථය තුළින්මයි පින්වත් ඔබ තුළ භවයෙන් නිදහස් වීමට අවශ්‍ය සාධක සකස් වෙන්නේ. නිදහස් වීම තුළින්මයි කවදාහරි දවසක අපි නිවීම සාක්ෂාත් කර ගන්නේ. එහෙම නම් නිවීමට අවශ්‍ය ප්‍රධාන සාධකය බවට පත්වෙන්නේ සංසාර බිය නුවණින්, මැනවින් දැකීමමයි.

# මතු සංසාරේ ඔබේ මළකඳන් නුවණින් දැක්කොත් දස්කමකි...

සංසාර භය ඔබ තුළ ඇති කර ගන්නා තරමටම පින්වත් ඔබ තුළ භවයට ඇති තෘෂ්ණාව සියුම් වෙනවා. මෙතැනදී අපි උපක්‍රමශීලී වෙන්න ඕනේ, ඇසට හමුවන සෑම රූපයක්ම කමටහනක් කරගන්න.

වැරහැලි ඇඳගත්ත යාචක මහත්මයෙක් මහපාරක ඉන්නවා දැක්කහම එම යාචක මහත්මයා තුළින් තමාව දකින්න දක්ෂ වෙන්න ඕනේ. තමා කොතෙක් නම් සංසාරයේ වැරහැලි ඇඳගෙන, අපිරිසිදුව, විසිකරල දමන රොටි කැබැල්ලක්වත් නැතිව මොන තරම් දුක් විඳලා ඇතිද? හිසට සෙවණක් නැතිව අගුපිල්වල, සීතලට, උෂ්ණයට හසුවී කී වරක් නම් මිය යන්නට ඇතිද? මේ ජීවිතයේදී සතර අපායෙන් මිදීමට අදක්ෂ වුවහොත්, අනාගත සංසාරයේ තව කොතෙක් යාචක ජීවිත ගතකරන්නට සිදු වේවිද? නුවණින් ඒ යාචක ජීවිතය මෙනෙහි කරන්න. යාචක පින්වතා තුළින් තමාව මතුකොට ගන්න.

මළ මිනියක් දැක්කොත්, ඒ මළමිනිය තුළින් තමාව දකින්න උත්සාහ කරන්න. අතීතයේ තමා මැරි මැරී ගොඩගැසුණු මළ කඳන් ප්‍රමාණය එක ගොඩක් කළොත්, එය ගිජ්ඣකූට පර්වතයේ ප්‍රමාණය පරදවන බව නුවණින් දකින්න. ඔබ බල්ලො, බළල්ලු, හරක්, අලි ඇතුන් වෙලා මැරිලා ගොඩගැසූ මළකඳන්, එම මළකඳන් ගොඩ තුළින්ම දකින්න. මේ ජීවිතයේදී සතර අපායෙන් මිදෙන්නට බැරි වුණොත් අනාගතයේ ගොඩගැසීමට නියමිත මළකඳන් ප්‍රමාණය නුවණින් දකින්න.

බල්ලෙක්, හරකෙක්, ඌරෙක් දැක්කහම ඒ සතා තුළින් තමාව දකින්න. ඔබ සංසාරයේ මෙවැනි සතුන් වෙලා, අපි අනුන්ගෙන් මොන තරම් ගුටි කාලා ඇත්ද? මහ පාරවල වාහනවලට හසු වී මොන තරම් නම් මැරිලා යන්නට ඇතිද? අතීතයේ ගිණි කඳුවලට හසු වෙලා, භූමිකම්පාවලට හසුවෙලා කොච්චර නම් පණපිටින් වැළලී යන්න ඇතිද? අතීතයේ සිදු වූ කල්ප විනාශයන්ට මැදිවෙලා කොච්චර නම් පිච්චිලා මිය යන්නට ඇතිද? අවුරුදු ගණනාවක් භාවනා කර ලබාගත්තාට වඩා වැඩි සංසාර බියක්, ඉහත ධර්මතාවයන් නුවණින් මෙනෙහි කිරීම තුළින් ඔබ තුළ සකස් වෙනවා. එවිට ඔබ රූපයන් කෙරෙහි ඇලෙන්නේ නැහැ. අනාගත භවය කෙරෙහි බැසගන්නේ නැහැ.

බ්‍රහ්මයා කියන රූපය, දෙවියා කියන රූපය දැක්කම, එම බ්‍රහ්මයන් දෙවියන් නැවත සතර අපායට වැටෙන හැටි නුවණින් දකිනවා. රූපය කෙරෙහි කලකිරීම සකස් වෙන දිශාවට ඔබ රූපය නුවණින් දකින්න දක්ෂ වෙන්න. සත්ත්වයා බැඳිලා යන්නේ රූපයටමයි. පංච උපාදානස්කන්ධයේ මුල්ම උපාදානස්කන්ධය රූප උපාදානස්කන්ධයයි. රූපය කෙරෙහි ඔබ ඇති කොට ගන්නා ඡන්ද රාගය නිසාමයි වේදනා, සංඥා, චේතනා, විඥ්ඥාණ කියන ධර්මතාවයන් ඔබ ඇතිකරගන්නේ. රූපය කෙරෙහි ඔබ අවබෝධයෙන් කලකිරීම ඇතිකරගත්තා නම් වේදනා, සංඥා, චේතනා, විඥ්ඥාණ කියන ධර්මතාවයන් පිළිබඳව ඔබට ප්‍රශ්නයක් මතුවෙන්නේ නැහැ.

රහතන් වහන්සේටත් ඇසක් තිබෙනවා. රහතන් වහන්සේත් ඇසෙන් රූප දකිනවා. රහතන් වහන්සේ කනෙන් ශබ්ද අහනවා. දකිනවා, ඇසෙනවා කියන්නේ ඵස්සය කියන කාරණයට. ඵස්සය කියන්නේ කාරණා 3 ක එකතුවයි කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. මේ කාරණා 3 තමයි අධ්‍යාත්මික රූපය, බාහිර රූපය සහ විඥ්ඥාණය. මේ ධර්මතාවයන් 3 එකතු වුන තැනදී ඵස්සය සිද්ධ වෙනවා. ඒ කියන්නේ රහතන් වහන්සේටත් ස්පර්ශය හෙවත් ඵස්සය සිදුවෙනවා. නමුත් රහතන් වහන්සේ

ඵස්සයේ අනිත්‍ය භාවය දකිනවා. ඒ නිසා රහතන් වහන්සේ තුළ විඳීමක් ඇතිවන්නේ නැහැ. විඳීමක් නැති නිසාම භවයට යන පංච උපාදානස්කන්ධයක් සකස්වෙන්නේ නැහැ. රහතන් වහන්සේ චතුරාර්ය සත්‍ය අවබෝධය ලබන වෙලාවේ ඥාන දර්ශන තුළින් රූපයේ අනිත්‍ය භාවය අවබෝධ කර ඇති නිසා රහතන් වහන්සේ ඵස්සය සිද්ධ වෙන මොහොතේම ඕනේම රූපයක් අනිත්‍ය වශයෙන් දකින්න දක්ෂ භාවය ලබලයි තිබෙන්නේ. මෙතැනදී පින්වත් ඔබට 'සම්මා ඥාන' කියන ධර්මතාවය ගොඩාක් වැදගත් වෙනවා. බුදුරජාණන් වහන්සේ 'සම්මාඥාන' කියන වචනය පනවන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ 9 වැනි අංගය හැටියටයි. 10 වැනි අංගය හැටියට 'සම්මා විමුක්තිය' පනවනවා. එහෙම නම් ඥාන දර්ශන කියන කාරණය යම් භික්ෂුවක් තුළ වැඩෙන්නේ ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ගයේ මාර්ග අංග 8න් පරිපූර්ණ භාවයට පත් වීමෙන් අනතුරුවයි. සම්මා සතියෙන්, සම්මා සමාධියෙන් පරිපූර්ණ භික්ෂුව තුළයි, සම්මා ඥාන සකස් වෙන්නේ. සම්මා ඥාන තුළින් අවබෝධය සකස් කොට දීලා, සම්මා විමුක්තිය සාක්ෂාත් කොට ගන්නවා. මෙතැන දී මුලින්ම සකස් වෙන්නේ සම්මා ඥානයයි. සම්මා ඥාන තුළිනුයි භික්ෂුවක් සම්මා විමුක්තිය සාක්ෂාත් කර ගන්නේ.

මෙතැනදී චතුරාර්ය සත්‍යය අවබෝධයට මෙහොතකට පෙරාතුව සම්මා ඥාන තුළින් රූපයේ අනිත්‍ය භාවය තියුණු සමාධියේ ඇසෙන් ප්‍රකට කර පෙන්වනවා. පරිපූර්ණ වූ සමාධිය තුළයි මේ සම්මා ඥාන සකස්කර දෙන්නේ. රහතන් වහන්සේ දකින රූපයේ අනිත්‍යයත්, අපි දකින රූපයේ අනිත්‍යයත් ස්වභාවයන් දෙකක්. අපි අනිත්‍යයි කියලා දකින්නේ කෙනෙක් වයසට යනවා, ලෙඩ වෙනවා, මැරෙනවා කියන කාරණයයි. පින්වත් ඔබ ඉදිරියේ තිබෙන මල් කළඹ අනිත්‍යයි කියලා ඔබ දකින්නේ එම මල් පරවෙනවා, පෙති වැටෙනවා, නරක් වෙනවා, කුණු වෙනවා... කියන කාරණාවන්. නමුත් සම්මා ඥාන

තුළින් රහතන් වහන්සේ රූපය දකින්නේ වේගයක් වශයෙන් පමණක්මයි.

පින්වත් ඔබ මෙහෙම උදාහරණයක් ගන්නකෝ. නිවන් මග වඩන භික්ෂුවක් සම්මා ඥාන තුළින් පිදුරුතලාගල කන්ද දකිනවා කියලා. එම පිදුරුතලාගල කන්ද, එම භික්ෂුවට උතුම් සමාධියෙන් දර්ශනය වෙන්නේ වේගයෙන් භ්‍රමණය වන සුළියක් හැටියට. ඒ සුළිය වේගයෙන් භ්‍රමණය වෙලා වාතයේ පාවී යන දූවිල්ලක් ලෙසින් අර අයෝමය පිදුරුතලාගල කන්ද දර්ශනය වෙන්නේ. මෙතැනදී එම භික්ෂුව තමන්ට අරමුණු වන සෑම රූපයකටම අනිත්‍ය සංඥාව, වේගයෙන් ගලපා බලනවා. රූපය විනිවිද දකිනවා. රූපයේ හිස් බව දකිනවා.

# ඔබේ ඊළඟ ආත්මයේ නිමැවුම්කරු ඔබමය

එක් තරුණ මහත්මයෙක් භික්ෂුවගෙන් විමසුවා රහතන් වහන්සේ නමක් තමා ඉදිරියේ සිටින මනුෂ්‍යයාව දකින්නේ කොයි විදිහටද කියලා.

රහතන් වහන්සේට එම මනුෂ්‍යයාව බාහිර ස්වරූපයෙන් පෙනෙනවා. නමුත් එම බාහිර රූප සංඥාව ඉක්මවා ගිය, අවබෝධාත්මක මනුෂ්‍ය රූපය, වේගයක් හැටියටයි රහතන් වහන්සේ දකින්නේ. රහතන් වහන්සේට පුළුවන් මනුෂ්‍ය රූපය දූවිල්ලක් කර දකින්න. රූපයේ අර්ථයක් නොමැති නිසාම රහතන් වහන්සේ රූපයක් ඵස්සය වන මොහොතේම 'දැක්කාය' කියන තැන නවතිනවා. ඇසුණාය, දැනුණාය කියන තැනම නවතිනවා. රහතන් වහන්සේ දක්ෂයි මහා බ්‍රහ්මයා කියන රූපය දැක්කත්, ශක්‍රයා කියන රූපය දැක්කත්, සක්විති රජ කියන රූපය දැක්කත් එම රූපයන් ඵස්සය ළඟදීම අනිත්‍ය වශයෙන් දකින්න. මේ දක්ෂ භාවය රහතන් වහන්සේට පමණක් ලැබෙන්නේ ඥාන දර්ශන තුළින් රූපයේ සුවිශේෂී අවබෝධය ඔහු ලබන නිසාමයි. මේ රූපයේ වේගය ඥාන දර්ශන තුළින් දකින මොහොතේ රූපය කෙරෙහි තෘෂ්ණාවෙන් බැහැර වී උතුම් සම්මා විමුක්තිය සාක්ෂාත් කර ගන්නවා. රහතන් වහන්සේ දක්ෂයි පටිච්චසමුප්පාද ක්‍රියාවලිය තුළ ඕනෑම රූපයක් විසිරුවා දකින්න.

ඉහත කාරණාවන් භික්ෂුව පින්වත් ඔබට සටහන් තැබුවේ රූපයේ අනිත්‍යතාවය දකිමින් ජීවත් වීමේ අගය පවසන්නයි. මස්

ඇසෙන් පෙනෙන රූපයේ අනිත්‍ය භාවයත්, උතුම් ඥාන දර්ශන තුළින් දකින රූපයේ අනිත්‍ය භාවයත්, අහසයි පොළවයි වගේ වෙනස් වූවක්. පින්වත් ඔබ මේ මොහොතේ මස් ඇසෙන් දකින රූපයේ අනිත්‍ය භාවය දකිමින් සිටින්න. මොකද ඔබ බැඳුනොත් බැඳී යන්නෙත් රූපයටමයි.

භික්ෂුවට මතකයි භික්ෂුව අනිත්‍ය සංඥාවන් තීව්‍ර ආකාරයෙන් වඩන කාලයේදී ලෝකයේ සිටි සුරූපී කුමරියක් රිය අනතුරකට පත් වී මිය ගිය ඛේදජනක ආකාරය නුවණින් දැක්කා. ඇයගේ සුරූපී භාවය, ප්‍රභූ භාවයේ අවසානය කොයි තරම් නම් ඛේදජනකද කියලා නුවණින් මෙනෙහි කළා. ඇයගේ මීළඟ ජීවිතය කුමක් වේවිද කියලා නුවණින් මෙනෙහි කළා.

රාජ්‍ය නායකයෝ මරාගෙන මැරෙන බෝම්බ කරුවන් විසින් මරා දමනු ලැබූ ඛේදජනක ආකාරය නුවණින් දැක්කා. එම රූපය කෙරෙහි, එම ප්‍රභූ භාවයන් කෙරෙහි අවබෝධයෙන් කලකිරුණා. මෙය සටහන් තබන භික්ෂුව බෝම්බ අනතුරකට හසු වී තමාගේ ශරීරය කුඩු වී විසිරී තිබෙනු මනසින් දැක්කා. එම කුරිරු මරණය නුවණින් මෙනෙහි කළා. මේ මොහොත ගිලිහී ගියොත් තවත් එවැනි කුරිරු මරණ ලක්ෂ ගණනක් හිමි වන බව නුවණින් දැක්කා. ඒවා තුළින් සංසාර බිය ඇතිකර ගැනීම සඳහා....

ධර්ම සාකච්ඡාවකදී මහත්මයෙක් ප්‍රශ්නයක් විමසුවා රහතන් වහන්සේට විඳීම කියන කාරණය තිබෙනවා නේද කියලා. රහතන් වහන්සේට විඳීම ඇතිවෙනවා කියන කාරණය වැරදි කාරණයක්. රහතන් වහන්සේ තුළ විඳීම සකස් වෙන්නේ නැහැ. විඳීම කියලා කියන්නේ ඇලීම, ගැටීම, උපේක්ෂාව කියන කාරණා තුනට. මේ කාරණා තුන තුළම තෘෂ්ණාව බැසගෙන තිබෙනවා. රහතන් වහන්සේ කියන්නේ තෘෂ්ණාව ක්ෂය කරපු උත්තමයෙක්. රහතන් වහන්සේ තුළ විඳීම සකස් වෙනවා නම් එයින් අදහස් වෙන්නේ ඔහු තෘෂ්ණාව නැති කරල නැහැ. මෙතනදී සමහරක් පින්වතුන්ලා ඵස්සය සහ වේදනාව කියන

කාරණා දෙක පටලවා ගන්නවා. රහතන් වහන්සේ තුළ ඵස්සය සිද්ධ වෙනවා. නමුත් රහතන් වහන්සේ ඵස්සය ළඟදීම ඵස්සයේ අනිත්‍යතාවය දකිනවා. විඳීමක් සකස් වීමක් නැහැ.

එතකොට එම මහත්මයා නැවත ප්‍රශ්න කළා. රහතන් වහන්සේට උෂ්ණය, ශීතල, දැනෙන්නේ නැතිද කියල. ආහාරයක තිත්ත, පැණි රස දැනෙන්නේ නැතිද කියලා. රහතන් වහන්සේට උෂ්ණය, ශීතල දැනෙනවා. තිත්ත, පැණි රස දැනෙනවා. එය විඳීම නොවෙයි ඵස්සයයි. දැනුනා කියන තැන රහතන් වහන්සේ නවතිනවා. එය බොහෝ සියුම් තැනක්. උෂ්ණය, ශීතල දැනෙනවා තිත්ත පැණි රස දැනෙනවා. ඒවා කෙරෙහි ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන් ඇතිවෙන්නේ නැහැ. විඳීම් ඇති වෙනවා නම් ඉන් අර්ථවත් වෙන්නේ තෘෂ්ණාව ක්ෂය කරලා නැති බවයි.

රස දැනෙනවා. නමුත් රසයට බැඳෙන්නේ නැහැ. ඒ කියන්නේ ඇලීම් ගැටීම් උපේක්ෂාවන් සකස් කර ගන්නේ නැහැ. එම නිසාම රහතන් වහන්සේ තුළින් විඳීම් කියන කාරණය ප්‍රතික්ෂේප වෙනවා. මේ නිසායි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ රහතන් වහන්සේ දැක්කාය, ඇසුණාය, දැනුණාය කියන තැන නතර වෙනවාය කියල. පැණි රස දැනෙනවා. ඇලීමක් නැහැ. තිත්ත රස දැනෙනවා ගැටීමක් නැහැ. පැණි රසත් තිත්ත රසයත් මධ්‍යස්ථව දැනෙනවා උපේක්ෂාවක් නැහැ. ඵස්සය අනිත්‍ය වශයෙන් දැක්ක තැනදී විඳීමට පැවත්මක් නැහැ.

# මැරෙන මොහොතේ මොකද වෙන්නේ

ධර්ම සාකච්ඡාවක් වෙලාවේදී මහත්මයෙක් ප්‍රශ්නයක් විමසුවා හාමුදුරුවනේ මැරෙන මොහොතේ කුමක්ද වෙන්නේ කියලා. මැරෙන මොහොතේ වෙන දෙය කවුද තීරණය කරන්නේ කියලා.

මැරෙන මොහොතේ වෙන්නේ මොකක්ද කියන කාරණය අපිට ධර්මානුකූලව හොඳට පැහැදිලියි. අපි කවුරුන් හෝ මිය යන මොහොතේ අවසාන චුති සිත ඇතිවෙන විට, චුති සිත කියන්නේ මේ රූපය උපයෝගී කරගෙන සකස් වෙන අවසාන පංචඋපාදානස්කන්ධයට. චුතිසිත සකස් වෙන්නේ මනෝ විඤ්ඤාණයක් හැටියට. කුමක් හෝ බාහිර රූපයක් අරමුණුවෙලයි සකස් වෙන්නේ. තමන් කළා වූ ශක්තිමත් කුසලයක් හෝ ශක්තිමත් අකුසලයක් මෙහිදී අරමුණු වෙන්න පුළුවන්. මෙම අවසාන චුති සිතට අදාළව ඊළග ප්‍රතිසන්ධිය සකස් වෙනවා. ඉහත කාරණය පින්වත් ඔබට හොඳින් තේරුම් ගන්න පින්වත් ගෞරවණීය ස්වාමීන් වහන්සේ නමක් භික්ෂුවට කියූ කථා ප්‍රවෘත්තියක් මෙහි සටහන් තබනවා.

එක්තරා තරුණ මහත්මයෙක් මුහුදු බඩ ප්‍රදේශයේ ජීවත් වුණා. ඒ මහතාගේ විනෝදාංශය මාළු සහ කකුළුවන් ඇල්ලීම. සෑම උදෑසනම එම තරුණ මහත්මයා මුහුදු වෙරළට යනවා. මාළු සහ කකුළුවන් අල්ලන්න. මෙහෙම කාලයක් මේ කටයුත්තේ නියලෙන විට මේ මහත්මයා හදිසි අනතුරකට ලක්වෙනවා. ඔහු

දැඩි සේ ගිලන් වෙනවා. ඔහු මරණාසන්න බවට පත්වෙනවා. ඔහු සිතනවා තමාව මැරෙන්නයි යන්නේ කියලා. නමුත් ඔහුගේ සංසාරයේ පිනට මැරෙන්නේ නැහැ. ඒ තරුණ මහත්මයා කියනවා තමා මරණාසන්න වෙච්ච වෙලාවේ තමා නේවාසිකව සිටි රෝහලේ වාට්ටුවේ තිබෙන සෑම කොන්ක්‍රීට් කණුවක්ම ඒ මහතාට පෙනුනේ අඬු දික් කරගෙන සිටින විශාල කකුළුවන් වගේය කියල. දැන් ඔබට මට කොන්ක්‍රීට් කණුවක් පෙනෙන්නේ කොන්ක්‍රීට් කණුවක් වගේනේ. නමුත් මේ මහත්තයාට මරණාසන්න වෙලාවේ කොන්ක්‍රීට් කණු සියල්ලම පෙනිල තිබෙන්නේ අඬු දික් කරගත් කකුළුවන් වගෙයි. යම් හෙයකින් මේ තරුණ මහත්මයා මිය පරලොව ගියා නම් අනිවාර්යෙන්ම මේ මහත්මයා නැවත උපත ලබන්නේ කකුළු බිත්තරයක් තුළයි. උපාදාන පච්චයා භවෝ, උපාදානයයි භවය සකස් කර දෙන්නේ. නමුත් මේ මහත්මයා මිය පරලොව ගියා නම් ඒ මහත්මයා කකුළුවෙක් වෙලා උපදියි කියලා මේ ලෝකේ කිසිවෙක් විශ්වාස කරන්නෙ නැහැ. නමුත් ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ධර්මය ඒ උතුම් යථාර්ථය අපිට මැනවින් පැහැදිලි කර දෙනවා. ඉහත කථාවෙන් ඔබට පැහැදිලි වෙනවා. තමාගේ ඊළඟ උපත තීරණය කරන්නේ තමා තුළින්මය කියලා. තමා තුළ සකස්වෙන අවසාන පංචඋපාදානස්කන්ධයේ හේතුඵල ධර්මයන් නිසාය කියලා.

# කල්‍යාණ මිත්‍රයකු නොමැති නම් තනිව සිටීමත් වටියි

භික්ෂුවක් උතුම් සමාධියෙන් පසුවන විට මනුෂ්‍ය ලෝකය ආශ්‍රිතව ජීවත් වන දිව්‍යාංගනාවක් දර්ශනය වෙනවා. ඇය සාමාන්‍ය දිව්‍ය ස්වභාවයෙන් යුක්තයි. ඇය පැළඳගෙන සිටියේ බොහෝම පිළිවෙළට තිබූ සුදු සාරියක්, අත් දිග සුදු හැට්ටයක්. ඇය යන යන තැනට ඇයට සිංහාසනයක් වගේ පුටුවක් ලැබිල තිබෙනවා. මේ පුටුවේ හිඳගෙනම තමයි ඇය ගමන් කරන්නේ. ඇයට ආකාශයේ පාවී යන්න පුළුවන්. එම පුටුව හරියට ඇයට බද්ධවෙලා තිබෙනවා වගෙයි පෙනෙන්නේ. එම භික්ෂුව උතුම් සමාධියෙන් අරමුණු කරල බලනවා ඇය පෙර ජීවිතයේ කවරෙක්ද කියලා. ඇය කාලයකට පෙර මේ ගමේම ජීවත් වුණ වයෝවෘද්ධ සිල්වත් උපාසිකාවක්. ඇය ගිහි උපාසිකාවක් හැටියට බොහෝම දක්ෂයි ස්වාමීන් වහන්සේලාට ආසන පනවන්න. ඇයගේ නිවසට යම් ස්වාමීන් වහන්සේ නමක් වැඩියත්, ඇය ආරණ්‍යයට ගියත් බොහෝම සුව පහසුව ස්වාමීන් වහන්සේලාට වැඩ සිටින්න ගෞරවණීය ලෙස ආසන පනවල තිබෙනවා. නමුත් කල්‍යාණ මිත්‍ර ඇසුර, සද්ධර්ම ශ්‍රවණයේ දුර්වල භාවයන් නිසාම ඇයට ධර්මයේ නියම හරයන් ජීවිතයට ලැබිල නැහැ. ඒ නිසාම ඇය මැරෙන වෙලාවේ ඇය තමා සිදු කළ, භික්ෂුවකට ආසන පැනවීමේ පින්කමක් තමයි සිහි වෙලා තිබෙන්නේ. එම උපාදානයට අදාළව, එම පිනට විපාක හැටියට සිංහාසනයක් වැනි පුටුවක වාඩි වුණ ඍද්ධිමත්භාවය ඇති සාමාන්‍ය දිව්‍ය ස්වභාවයක් ලැබිල තිබෙනවා. ඉහත කාරණයෙනුත් පින්වත්

ඔබට පැහැදිලි වෙනවා කෙනෙකුගේ ඊළඟ ජීවිතය තීරණය වන්නේ තමා තුළින්මය කියලා.

එක පින්වත් මහත්මයෙක් ප්‍රශ්නයක් විමසුවා. ඊළඟ ජීවිතයේ අපි කවුරුන් වෙනවාද කියල, කවුරුන් විසින්ද තීරණය කරන්නේ කියලා. බුදුරජාණන් වහන්සේ බොහෝම පැහැදිලිව දේශනා කරනවා දෙවියෙක්, බ්‍රහ්මයෙක්, මනුෂ්‍යයෙක් එසේත් නැතිනම් වෙනත් අදෘෂ්‍යමාන බලවේගයක් නොවෙයි ඊළඟ ප්‍රතිසන්ධිය තීරණය කරන්නේ කියලා. උපාදානයයි මීළඟ උපත තීරණය කරන්නේ කියලා. උපාදානය සකස් වෙන්නේ තෘෂ්ණාව නිසා. එහෙම නම් තමා තුළයි තීරකයා සිටින්නේ. එම තීරකයා අවසාන පංචඋපාදානස්කන්ධය වන චුති සිතයි. තමාම තීරකයා වන ලොවක තෘෂ්ණාවේ ඇති භයානකභාවය නිසාම සතර අපායන්ට වැටී ඔබම විඳි දුක් කන්දරාව නුවණින් දකිමින් සංසාර බිය ඇති කරගන්න. මේ සංසාර බිය අපිට ඇති නොවූයේ ධර්මය අධර්මය ගැන නොදත් නිසාමයි. කළයුත්ත නොකළ යුත්ත ගැන නොදත් නිසාමයි. එහෙම නම් කල්‍යාණ මිත්‍ර ආශ්‍රය නොලැබීම, කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන්මයි අපි මේ විනාශයට වැටිල තිබෙන්නේ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ මුළු ශාසනයම රඳා පවතින්නේ කල්‍යාණ මිත්‍ර ආශ්‍රය මතය කියලා. එහෙම නම් භව නිරෝධයේ දුක නැති කිරීමේ ගමන රඳා පවතින්නේ කල්‍යාණ මිත්‍ර ආශ්‍රය මතමයි. එම නිසාම අඹු දරුවන් වස්තුව දේපළවලට තබන විශ්වාසයට වඩා වැඩි විශ්වාසයක් කල්‍යාණ මිත්‍රයා මතම තබන්න. කල්‍යාණ මිත්‍ර ඇසුරින් තොර ජීවිතය ගැන බිය ඇතිකර ගන්න.

භික්ෂුව මුණගැසීමට එක්තරා ප්‍රභූ මහත්මයෙක් පැමිණියා. එතුමා සමග තවත් තුන් දෙනෙක් පැමිණ සිටියා. ඉන් එක මහත්මයෙක් අවුරුදු 65 ක විතර මහත්මයෙක්. මේ මහත්මයා ධර්මයේ ගැඹුරු ප්‍රශ්න කිහිපයක්ම විමසුවා. ඇත්තටම භික්ෂුව හිතුවේ නෑ එවැනි ගැඹුරු ප්‍රශ්න මෙම කණ්ඩායම අසාවි කියලා. භික්ෂුවටත් හරි සතුටක් ඇති වුණා. ඒ වෙලාවේ භික්ෂුව එම ප්‍රභූ

මහත්මයගෙන් විමසුවා මේ වයෝවෘද්ධ මහත්මයා කවුද කියලා. ඔහු සුදු සරමක් කමිසයක් ඇඳගෙන සිටියේ. ප්‍රභූ මහත්මයා කියනවා මේ වයෝවෘද්ධ මහත්මයා මගේ කල්‍යාණ මිත්‍රයා කියලා. මට ටිකක් කේන්ති යන වැඩක් වුණාම මම උපදෙස් ගන්නේ මේ මහත්මයාගෙන් කියලා. සැබෑම කළ්‍යාණ මිත්‍රයා කියන්නේ අඩුම තරමින් සෝවාන් ඵලයට පත් වූ පින්වතායි. ඉන් පහළ කෙනෙකුට සැබෑ කල්‍යාණ මිත්‍රයෙක් වෙන්නට තිබෙන ඉඩ කඩ අඩුයි. නමුත් ඔහුටත් පුළුවන් හොඳ නරක කියලා දෙන්න. ධර්මය අධර්මය කියල දෙන්න, වැරැද්දෙන් මුදව ගන්න. එම නිසා තමා දක්ෂ වෙන්න අවශ්‍යයි තමා කෙරෙහිම අනුකම්පාවෙන්. සැබෑම කල්‍යාණ මිත්‍රයෙක් සොයා ගැනීමට එසේ අපහසු නම් සැබෑම කල්‍යාණ මිත්‍රයෙකුගේ උපදෙස් ලබා ගැනීම ප්‍රශ්නයක් නම්, තමාට වඩා ධර්මය ගරු කරන පින්වතුන්ගේ අවවාද අනුශාසනා ලබන්න. තමන්ට වඩා ගුණ ධර්මවලින් උසස් කෙනෙක්වමයි තමන් නිතරම ආශ්‍රයට තෝරා ගත යුත්තේ. එහෙම කෙනෙක් නැතිනම් තමාට සමාන ගුණ ධර්ම තිබෙන කෙනෙක් ආශ්‍රයට තෝරා ගන්න. එහෙම කෙනෙකු නැතිනම් හුදකලාව තනිව ජීවත් වෙන්න කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

# හොරකම සුළුවෙන් තැකුවට ලෙහෙසිද එය එල දෙන විට

දැන් වේලාව සවස හයට පමණ ඇති. මැටි කුටියේ ඉදිරිපස තිබෙන ලෑලි බංකුවේ වාඩි වෙලා භික්ෂුව මේ සටහන තබන විට භික්ෂුවට ඇතින් ඇසෙනවා අලියෙක් අතු බිඳින වේගවත් ශබ්දයක්. අලියා අතු බිඳිමින් කුරුමානම් අල්ලන්නෙ ඇඳිරි වැටුනාට පසුව ගමට යන්න. උදේට දායක මහත්වරුන් පිණ්ඩපාත මඩුවේදී කියනවා ඇසෙනවා ඊයේ රාත්‍රියේ මගේ වට්ටක්කා වගාව, බඩ ඉරිඟු වගාව ඉවරයි කියලා. මොකද අලියා ඒවා විනාශ කරලා.

අලියා කියන සතා එයාගේ බලවත් භාවය නිසාම ගොඩක් අකුසල් සිද්ධ කර ගන්නවා. හොරකමට පුරුදුවෙච්ච අලින් ගැන කතා සමහර ගම්මානවලදී භික්ෂුවට ඇසිල තිබෙනවා. හොරෙක් යම් සේද වගාවක් හානි කරන්න, වගාවක් සොරකම් කරන්න සැලසුම් කරන්නේ, ඒ ආකාරයටම බොහෝම සියුම් උපක්‍රම වල් අලින් යොදා ගන්නවා. තමා කරන්නේ සොරකමක්ය කියන චේතනාව මේ සතාට පහළ වෙනවා. ඒ සතා ඒ සඳහා උපක්‍රම යොදනවා. නමුත් මේ සතා කර්මය කර්මඵල විශ්වාසය ගැන දන්නේ නැහැ. කර්මය කර්මඵල විශ්වාසය මේ සතා නොදන්නවා වුනාට අනුනට පීඩා කිරීමේ, සොරකම් කිරීමේ අකුසලයේ විපාකයන් අනාගතයේ විපාක පිණිස එම සතාට සකස් වෙනවා.

භික්ෂුවක් උතුම් සමාධියෙන් පසුවන විට ප්‍රේත අලියන් කිහිප ආකාරයකින් දුක් විඳිනවා දැක තිබෙනවා. ප්‍රේත සතුනගේ

ලෝකයේ අමානුෂික, වේදනාත්මක, කටුක අකුසල් විපාකයන් අත් විඳින සතෙක් තමයි ප්‍රේත අලියා කියන්නේ. අලියා තමාට තිබෙන බලවත් භාවය නිසා, අකීකරු භාවය නිසා තම ශක්තියෙන් සැවොම යටත් කරගෙනයි ජීවත් වෙන්නේ. එම නිසාම එයාට සිදු වන අකුසල් වැඩියි. තමාගේ පාඩුවේ සැරිසරමින් ජීවත්වන අලින් කැලයේ සිටිනවා. ඒ බවත් සඳහන් කරන්න ඕන. ගම් නොවදින වල් අලින් සමහර කැලෑ වල ජීවත් වෙනවා. ඒ අය මනුෂ්‍ය වාසයට බියයි. ඒත් බහුතරයක් අලින් ගම්මානවලට වැදී වගාවන් විනාශ කරනවා.

භික්ෂුවකට එක්තරා රාත්‍රියකදී උතුම් සමාධියෙන් පසුවනවිට විශාල වනාන්තරයක් දර්ශනය වෙනවා. මේ වනාන්තරයේ කොළ පැහැයක් නැහැ. ඔබ දැකල ඇති හේන් වගාවට කැලය ගිනි තැබීමෙන් පසුව දැවී ගිය හේනක ස්වභාවය. භික්ෂුවට උතුම් සමාධිය තුළින් මේ මුළු විශාල වනාන්තරයම පෙනෙන්නේ කිසිම ගසක කොළ පැහැති කොළයක් නැති දැවී ගිය වනාන්තරයක් ලෙසින්. මේ කොළ පැහැයක් නැති දැවී ගිය වනාන්තරයේ ප්‍රේත අලි රංචුවක් සිටිනවා. මේ ප්‍රේත අලි හොඬවැල් දිගු කරමින් වියලි ගස් ඉව කරනවා. කිසිම ගසක අනුභව කිරීමට කොළයක් නැහැ. කුසට අහරක් නොමැතිව වැහැරුණු ශරීර සහිත ප්‍රේත අලීන්ගේ ශරීර ස්වභාවය හරියට හුලං ගිය බෝලයක් වගේය. මෙම ප්‍රේත අලි කුසගින්නෙන් දුක් විඳිනවා. ඉඩෝරයට දැවී ගිය වනාන්තරයේ ආහාරයක් නැහැ. ජලය බිඳක් නැහැ. භික්ෂුව මේ දර්ශනය තමාගේ නුවණින් සලකා බැලුවා. කුමක්ද මේ සිද්ධ වෙන්නේ කියලා. එවිට භික්ෂුව පැමිණි නිගමනය පහත සඳහන් කරනවා.

භික්ෂුවට මෙතනදී දර්ශනය වෙන්නේ හොඳින් ගහකොළ තිබෙන සශ්‍රීක කැලෑවක්. නමුත් මේ ප්‍රේත අලියන්ගේ අකුසල් විපාකය නිසා එම අකුසල් විපාකය විඳීමට ඒ ප්‍රේත අලින්ට කොළපාට ගස් පෙනෙන්නේ දර ඉපල් වගේ. ඒ අකුසලයේ විපාකය. බලන්න පෙර මනුෂ්‍ය ලෝකයේ තිරිසන් කුලයේ අලි

ජීවිතවල ඉපදිලා මිනිසුන්ගේ වගාවන් විනාශ කිරීම නිසාම, තම බලපුළුවන්කාරකම් පෙන්වීම නිසාම, මරණින් මතු ප්‍රේත ලෝකයේ ප්‍රේත අලියෙක් වෙලා. මුළු කොළ පැහැති කැලයම එම ප්‍රේත අලියාට පෙනෙන්නේ දැවී ගිය කැලයක් වගෙයි. කුසට ආහාරයක් නැහැ. ශරීරය වැහැරිලා ඇට මතු වෙලා. දුක්ඛිත ජීවිත ප්‍රේත අලියන් සැටියට ගත කරනවා. බලන්න සංසාරය කොයිතරම් නම් බියකරුද කියලා.

මනුෂ්‍යයන් හැටියට ඔබ අනුන්ගේ දේවල් සොරකම් කළොත් එහි විපාකයක් හැටියට මරණින් මතු ඔබ ප්‍රේත ලෝකයට වැටුණොත්, ප්‍රේත ලෝකයේදී ඔබට පෙනි පෙනී ඔබ ඉදිරියේ ආහාරයක් තිබෙනවා, ඔබ එම ආහාරය අනුභව කිරීමට සැරසෙන විට එම ආහාරය අතුරුදහන් වෙනවා. ආහාර පිරුණු පිඟාන ඔබට පෙනෙන්නේ හිස් පිඟානක් වගේ, වතුර පිරුණු වීදුරුව ඔබට පෙනෙන්නේ හිස් වීදුරුවක් වගෙයි. හොඳින් ජලය තිබෙන දිය කඩිත්තෙන් පැන් පොදක් දෝතට ගන්න හදනවිටම එම දිය කඩිත්ත අතුරුදහන් වෙනවා. අන් සතු දෙය සොරකම් කිරීම නිසාම එහි විපාකයන් හැටියට කුසගින්නෙන් පිපාසයෙන් වැහැරුණු ශරීරයෙන් ප්‍රේත ලෝකයේදී දුක් විඳිනවා. තිරිසන් සතෙක් ඔබගේ වගාවන් විනාශ කරන විට එම වගාව විනාශකරන තිරිසන් සතා සකස් කරගන්නා අනාගත අකුසල් දැක ඔබ අන්සතු දෙය සොරකම් කිරීමට බිය ඇති කරගන්න.

වර්තමාන සමාජයේ බොහෝම ප්‍රබල ආකාරයෙන් සොරකම් සිද්ධ වෙනවා. මේ අය තේරුම් ගත යුතුයි ප්‍රේත ලෝකයට තමන් වැටුනාට පසුව ප්‍රේත ලෝකයේදී මඟුල් ගෙදරකට ගියත් බඩගින්නෙයි ගෙදර එන්න වෙන්නේ කියලා. අනුන්ගේ දේවල් අතුරුදහන් කළා වගේ ඔබගේ දේවල්ද අතුරුදහන් වෙනවා. අන්සතු දෙයක් සොරකම් කිරීමට ඔබට සිත සකස් වන විටම ඒවායේ දරුණු ආදීනව දැක සංසාර බිය ඇතිකර ගන්න. වර්තමාන ගිහි සමාජය තුළ සොරකම කියන කාරණයේ බරපතලකම ගැන බොහෝම අඩු ලන්සුවක් දෙන්නේ. එය

ඒ තරමටම සාමාන්‍ය වෙලා. නමුත් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සොරකමෙන් වැළකීම ඉහළම සිල් පදයක් හැටියට උපසම්පදා භික්ෂු ප්‍රාතිමෝක්ෂ සීලයේ සතර පාරාජිකාවන්ට ඇතුළත් කර තිබෙනවා. එසේ අන්සතු දෙය සොරකම් කිරීමට එරෙහිව ප්‍රාතිමෝක්ෂයට එකතු කරන්නේ සොරකමේ විපාකයන් බුදුරජාණන් වහන්සේ නුවණින් දැකලාමයි.

බුදුරජාණන් වහන්සේ යම් විනය කාරණාවක් දේශනා කළා නම්, එම විනය කාරණා දුර්වල කරගැනීමෙන් ලැබෙන විපාකයන් කවදාවත් අඩුවක් වෙන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේගේ පැනවීම් කවදාවත් කාලයට අනුව වෙනස් වෙන්නේ නැහැ. අපි ධර්මයෙන් බැහැරව යනකොට, අපේ හිත රවට්ටා ගෙන අමුතු ආරක්ෂාවක් ලෙසින් විනය කාරණාවන් ලිහිල් කිරීමට ගන්නා වූ උත්සාහයක් සමාජයේ තිබෙනවා. නමුත් බුදුරජාණන් වහන්සේ අතීතයේ යම් විනය කාරණාවක් පැනවූවා නම්, එම විනය කාරණා දුර්වල කරගැනීම තුළ, ලැබෙන ආදීනවය අදත් එදා මෙන්මයි. විනය කාරණා ලිහිල් කරගත්තාට එහි ආදීනවයන් නම් ලිහිල් වන්නේ නැහැ. විනය ලිහිල්කොටගත් තැනැත්තාගෙන් සතිය, සිහිය ගිලිහී යනවා. සතිය, සිහිය ගිලිහීගිය තැනැත්තා තුළින් ඉන්ද්‍රිය අසංවරභාවය ඇතිවෙනවා. ඉන්ද්‍රිය අසංවරභාවය ඇති තැනැත්තා අනාගත අසංවර භවගමනේ දීර්ඝ කාලීන කොටස් කරුවෙක් වෙනවා.

# ලෝකය අසාධාරණයක්මයි
# ඔබට සාධාරණය ඔබ තුළමයි

අජාසත්ත රජතුමා එක්තරා සඳ ඇති රාත්‍රියක තමන්ගේ ඇමැති මණ්ඩලය කැඳවල විමසීමක් කරනවා, මේ සඳ පායලා තිබෙන සුන්දර රාත්‍රියේ මට සුන්දර ධර්මයක් ඇසීමට ඇත්නම් එය විශාල සහනයක් කියලා. ඇමැතිවරුන් තම තමන් ගරු කරන ශාස්තෘවරුන්ගේ නම් කියනවා. එක ඇමැතිවරයෙක් කියනවා නිඝන්ඨනාථපුත්ත අහවල් තැන වැඩ සිටිනවා, අපි එතනට යමු කියලා. තව ඇමැතිවරයෙක් කියනවා සංජය බෙල්ලට්ඨපුත්ත අහවල් තැන වැඩ සිටිනවා අපි එතනට ගියොත් සුන්දර ධර්මයක් අහන්න පුළුවන්ය කියලා. මේ වෙලාවේ මෙතන සිටිය තෙරුවන් සරණ ගිය කෝමාරභච්ච කියන ඇමැතිවරයා කියනවා තමාගේ අඹ උයනේ බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ පන්සියයක් මහ රහතන් වහන්සේලා වැඩ සිටිනවා රජතුමා එතනට පැමිණියොත් මේ සුන්දර රාත්‍රියේ සුන්දර ධර්මයක් අහන්න පුළුවන්ය කියලා.

රජතුමා තම බිසෝවරු, පිරිවර සමග බුදුරජාණන් වහන්සේ බැහැදකින්න මහා රාත්‍රියේ අඹ වනයට යනවා. බුදුරජාණන් වහන්සේ අජාසත්ත රජතුමාට බොහෝම සුන්දර ධර්මයක් දේශනා කරනවා. ධර්ම දේශනාව අවසානයේදී අජාසත්ත රජතුමා බුදුරජාණන් වහන්සේට වන්දනා කරලා රජ මැදුරට නික්මෙනවා. අජාසත්ත රජතුමා බුදුරජාණන් වහන්සේ හමු වෙලා බැහැරට ගිය පසු බුදුරජාණන් වහන්සේ මහ රහතන් වහන්සේලාට ප්‍රකාශ කරනවා මේ අජාසත්ත තමන්ගේ තාත්තාව ඝාතනය කර නොතිබුණා නම් ඒ කියන්නේ ආනන්තරිය පාපකර්මය සිදු

කොටගෙන නොතිබුණා නම් මේ ධර්ම මණ්ඩපයේදීම සෝවාන් ඵලයට පත්වෙනවා කියලා.

බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළ, බරපතළ අකුසල්, ශක්තිමත් කුසල් තුළින් යටපත් කරගන්න බැහැය කියන කාරණය මෙයින් පැහැදිලි වෙනවා. පාපකාරී ආශ්‍රය නිසාම බලවත් අකුසල් සිදු කරගත් අජාසත්ත රජතුමා පසු කාලයේදී සත්පුරුෂ ආශ්‍රය නිසාම අප්‍රමාණ කුසල් සිදු කරගන්නවා. පළමුවැනි ධර්ම සංඝායනාව පවත්වන්න පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබාදෙන්නේ අජාසත්ත රජතුමා. එදා අජාසත්ත රජතුමා එවැනි රාජ්‍ය අනුග්‍රහයක් පළමුවැනි ධර්ම සංඝායනාවට නොදක්වන්න වර්තමානයේ ශාසනයේ අර්ථයත් අතුරුදන්ව ගොස් තිබෙන්න පුළුවන්. මේසා බලවත් කුසල් සිදු කරගත්තත් බලවත් අකුසල්වල විපාකයන් සමනය කරන්න ඒවා හේතුවෙන්නේ නැහැ.

වර්තමානයේ බලවත් අකුසල් අපි විග්‍රහ කරන්නේ බොහෝම සරල විදිහට. වර්තමානයේ පිතෘ ඝාතක රජකෙනෙක් ලෝකයේ ජීවත් වෙනවා නම් අපි ඔහුට අනුශාසනා කරන්නේ ඔබ වර්තමානයේ කරන බලවත් කුසල් හේතුවෙන් එම අතීත පිතෘ ඝාතක අකුසලය යටපත් වන බව ඒත්තු ගැන්වීමටයි. බුදුරජාණන් වහන්සේ යමක් දේශනා කර තිබෙනවා නම් දෙපාරක් ඒ ගැන සිතන්න අවශ්‍ය නැහැ.

ඒ නිසාම සොරකමේ බලවත් ආදීනවයන් දැකලා බුදුරජාණන් වහන්සේ සතර පරාජිකාවන්ට සොරකම පනවන්නේ. ඉකුත් ලිපියක සඳහන් කළ, වගා පාළු කරමින් සොරකමේ යන තිරිසන් සතා මරණින් මතු ප්‍රේත අලියෙක්ව උපත ලබා විඳින දුක්ඛිත ප්‍රේත අලි ජීවිතය කමටහනක් කරගෙන සංසාර බිය ඇති කරගන්න. තිරිසන් සතෙක් සොරකමේ ගිහිල්ලා එවැනි කුරිරු විපාක මරණින් මතු අත්විඳිනවා නම් කර්මය කර්මඵල විශ්වාසය හඳුනන මනුෂ්‍ය ඔබ අන්සතු දෙය සොරකම් කළොත් පරලොව ජීවිතයේදී ඔබට විඳීමට සිදුවන වේදනාවන් සිහිපත් කර ගන්න.

ඒ තුළින් සංසාර බිය ඇති කරගන්න. යමෙක් යමක් සොරකම් කරන්නේ ධනයක් තිබෙන කෙනෙක්ගෙන්. ධනය තිබෙනවාය කියන්නේ පිනෙන් ශක්තිමත් කෙනෙක්. යමෙක් සොරකම් කරනවාය කියන්නේ, පිනයි ඔහු සොරකම් කරන්නේ. යමෙක් පින සොරකම් කළොත් පව බොහොම බලවත් වෙනවා.

ලෝකය නිරතුරුවම ගමන් කරන්නේ දුක දෙසට. තෘෂ්ණාව නිසාම මනුෂ්‍යයාගේ පංච උපාදානස්කන්ධය නිරතුරුවම ගිනි ගන්නවා. මේ ගිනි ගැනීම නිසාම සමාජයත් ගිනි ගන්නවා. ඔබත් මේ ලෝකයේ සාමාජිකයින් වුණොත් ඔබත් මේ ගින්නෙන් පිච්චෙනවා. ඒ කියන්නේ ලෝභ, ද්වේෂ, මෝහ අකුසලයන් රැස්කර ගනීවි. රට ජාතිය උදෙසා හඬ නැගුවත්, කාමයන් උදෙසා හඬනැගුවත් මේ ඔබට ඇසෙන්නේ මනුෂ්‍යයාගේ පංච උපාදානස්කන්ධය ඇවිලෙන හඬයි. අවිද්‍යාව නිසා තමනුත් ඇවිලී අනුනුත් අවුළුවන මනුෂ්‍යයාගේ දෝංකාරයයි.

හඬ වේගවත් වන තරමට අකුසලයේ ප්‍රමාණය වේගවත් වෙනවා. අකුසලය වේගවත් වෙනවාය කියන්නේ සතර අපායට පිරිස් බලය සැපයීමේ වේගය වැඩිවෙනවා. අවිද්‍යාව නැමති මඩ ගොහොරුවේ එරී කුසල් සංස්කාර නැමති අත් වාරුවෙන් මඩෙන් ගොඩ ඒමට දඟලන මෝහ බරිත ලෝකයේ ක්‍රියාන්විතයයි ඔබ ඉදිරියේ සිදු වෙමින් පවතින්නේ.

ලෝකය යන දිශාවකට ගියාදෙන්. පින්වත් ඔබ ධර්ම මාර්ග යට එන්න. කොයිම මොහොතකවත් ඔබ ලෝකයෙන් සාධාරණය බලාපොරොත්තු වෙන්න එපා. ලෝකය කියන්නේ බොහෝම අසාධාරණ තැනක් නිසාමයි සිදුහත් කුමාරයා රජ සැප අළුයම හෙළූ කෙළ පිඩක් සේ ඉවතලා අසාධාරණ ලෝකයට සාධාරණය මතුකර දීමට ධර්ම මාර්ගයට පැමිණෙන්නේ. 'උපාදාන පච්චයා භවෝ' කියන ධර්මතාවය යටතේ පින් කරපු මනුෂ්‍යයා මරණින් මතු දුගතියට වැටෙනවා නම්, පව් කරපු මනුෂ්‍යයා සුගතියට යනවා නම්, මොකක්ද ලෝකයේ ඇති සාධාරණත්වය. ලොව්තුරා

බුදුරජාණන් වහන්සේ, සුළැඟිල්ලේ දැවටෙමින් පැමිණි රාහුල පුතණුවන්ට දායාද කර දුන්නේ අසාධාරණ ලෝකයෙන් මිදී සැබෑම සාධාරණය මතුකර දෙන ධර්ම මාර්ගයක්. කල්ප ගණනාවක පටන් තමා පසුපසින් අයෝමය ශක්තියක් වෙමින් පැමිණි යශෝධරාවට බුදුරජාණන් වහන්සේ මතුකර දුන්නේ අසාධාරණ ලෝකයෙන් මිදී සැබෑම සාධාරණය මතුකර ගන්නා මාර්ගයයි.

# අහෝ ! තිරිසන් අපාය

පින්වත් ඔබේ දෑස් ඉදිරියේ ජීවත් වන තිරිසන් සතුන් සතර අපායේ කොටස් කරුවන්. සතර අපායෙන් එකක් තමයි තිරිසන් ලෝකය. තිරිසන් ලෝකය සත්ත්වයාට බොහෝම දුක්දෙන ස්ථානයක්. මේ සෑම තිරිසන් සතෙකුම පෙර භවයක මනුෂ්‍ය ජීවිතයක් ගතකර සිදුකරගත් කාය, වචී, මනෝ අකුසලයන් හේතුවෙන් තිරිසන් ලෝකයට වැටුණු අය. මරණ බිය, කාමය, වෛරය, කුසගින්න තිරිසන් සතුන්ගේ ජීවිතයයි. පෙර මනුෂ්‍යයින්ව ඉපිද අනුනට දුන් මරණ බය, ජීවිත බය, අනුනගේ ආයුෂ, වර්ණය, සැපය, බලය උදුරා ගැනීම, වැළැක්වීම, මග හැරීම හේතුවෙන් අත් වූ කර්ම විපාකයන්. සීලයක් ආරක්ෂා නොකිරීමේ, දන් නොදීමේ, මෛත්‍රී, බුදු ගුණ භාවනාවක් නොවැඩීමේ විපාකයන්ගේ ස්වභාවය, තිරිසන් ලෝකයේ ඉපිද අනුනට අහිමි කළ දෙයම තමන්ටද ඒ ආකාරයෙන්ම අහිමිව එම දුක සිත් සේ විඳීමට සිදුවීමය. තිරිසන් ජීවිතයේදී මේ සතුන් යම් තාවකාලික සැපයක්, ආශ්වාදයක්, ආහාරය නිසා කාමය නිසා ලැබුවද මොවුන් එය බුක්ති විඳීමේදීම එම සැපය නිසා සකස් වෙන්නේද බරපතළ අකුසලයක්. සංසාරික වශයෙන් දුකේ සංවර්ධනයකි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සතර අපායේ දුක දීර්ඝ බව දේශනා කර වදාළේ ඉහත හේතුව නිසායි.

භික්ෂුව මෙහි සටහන් කරන්නේ ඉහත තිරිසන් ලෝකයේ කථාවක් නොවේ. ඊට හාත්පසින්ම වෙනස් සතර අපායටම අයිති ප්‍රේත තිරිසන් ලෝකයේ කථාවකි. ප්‍රේත තිරිසන් ලෝකයද සත්ත්වයා අනන්ත දුක් විඳින ස්ථානයකි. තිරිසන් සතුන් ලෙස

ජීවත්වන සතුන් මරණින් මතු ප්‍රේත සතුන් ලෙස ඉපදීමට හේතු කිහිපයක් භික්ෂුව අනුමාන කරයි.

විශේෂයෙන් එයට බලපාන්නේ තම කණ්ඩායමම, රැල කෙරෙහි ඇති ඡන්ද රාගයයි, තෘෂ්ණාවයි. ඒ නිසා සකස් වූ උපාදානයයි. දෙවැනි හේතුව තමාට ආහාර, කරුණාව, ආරක්ෂාව සපයන තම ස්වාමියා කෙරෙහි ඇති ඡන්ද රාගයයි, තෘෂ්ණාවයි. ස්වාමියා යනු සතුන් ඇතිදැඩි කරන මනුෂ්‍යයාය. කැලයේ ජීවත්වන සතුන් මුල් හේතුව නිසා මරණින් මතු ප්‍රේත සතුන් ලෙස ප්‍රේත ලෝකයේ උපත ලබන අතර මිනිසුන් ඇසුරේ වැඩෙන සතුන් දෙවැනි හේතුව නිසා ප්‍රේත සතුන් ලෙස එම ලෝකයේ උපත ලබනු ඇත.

භික්ෂුව එක්තරා ආරණ්‍යයක වැඩ සිටියදී එම ආරණ්‍යයේ බළලුන් නව දෙනෙක් දාන ශාලාව ආශ්‍රිතව ඇති දැඩි වෙමින් සිටියහ. දෑස් අන්ධ සතුන් කිහිප දෙනෙක් ද මේ අතර විය. මේ සෑම සතෙක්ම සිටියේ නායක ස්වාමීන් වහන්සේගේ කරුණාව, මෛත්‍රිය විඳිමින්ය. බළලුන් ප්‍රිය කරන ආහාර සුලභව එහි තිබිණි. හැබැයි සමහර දිනවල බළලුන්ගේ මුත්‍රා සහිත පාපිසි, ඇතිරිලි සේදීමටද මෙහිදී සිදුවිය. මෙම බළලුන්ගේ හොඳ ගතිගුණ වැඩිපුර තිබිණි. ස්වාමීන් වහන්සේලා හැර මේ සතුනට වෙනත් රැකවරණයක් නොතිබිණි. ගෞරවණීය උපසම්පදා ස්වාමීන්වහන්සේලාගේ විනය සම්බන්ධ ගැටලුද මෙහිදී ඇති නොවුණා නොවේ.

දිනක් හිමිදිරි උදෑසන පහට පමණ භික්ෂුව තම කුටියේ සිට දාන ශාලාවේ ''වත" කිරීමට දාන ශාලාවට පැමිණෙනවිට දාන ශාලාවේ පිටත ආලින්දයේ සවි කර තිබූ වතුර කරාමය සහිත බේසමේ තැටිය මත අඩියක් පමණ උසැති අළු පැහැති බළලෙක් සිටගෙන සිටියේය. භික්ෂුව මුලින් හිතුවේ මේ ආරණ්‍යයේ සිටින බළලෙක් කියල. භික්ෂුව ජල බේසමට කිට්ටු වන විට බළලා අතුරුදන් විය. අතුරුදන් වීමත් සමග මොහු ප්‍රේත බළලෙක්

ලෙස භික්ෂුව හඳුනා ගත්හ. මේ ප්‍රේත බළලා කවරෙක්ද යන්න භික්ෂුවට අනුමාන කළ හැකි තොරතුරක් පසුව ලැබිණි.

මෙම ආරණ්‍යයේ ඇතිදැඩි වෙන බළලුන් නව දෙනාගේ රැලේ මීට පෙර බොහෝම සුරතල් බළලෙක් සිට ඇත. එම බළලා ගෞරවණීය ලොකු ස්වාමීන් වහන්සේගේ පසුපස නිතරම පැමිණෙන උන්වහන්සේගෙන් නොමඳව කරුණාව ලද සතෙකි. මේ බළලා මීට පෙර මිය ගොස් තිබිණි. මේ බළලා මියගිය අවස්ථාවේ නායක ස්වාමීන් වහන්සේගේ සත්ත්ව කරුණාව නිසාම උන්වහන්සේගේ නෙතට කඳුළු මතු කිරීමට සමත්ව ඇත. පසුව බළලා ගෞරවණීය ආකාරයට වළදමා තිබිණි. භික්ෂුව අනුමාන කරන්නේ එම මිය ගිය බළලා තම ස්වාමියා, රැළ, ස්ථානය කෙරෙහි ඇති කරගත් ඡන්ද රාගය තෘෂ්ණාව නිසා එම ස්ථානයම උපාදානය කරගෙන ප්‍රේත බළලෙක් ලෙස උපත ලබන්නට ඇති බවයි. මේ ප්‍රේත බළලා කවුරුවත් ඇසින් නොදැක්කාට මේ මොහොතේද එම ආරණ්‍යයේ මේසය මත තිබෙන ආහාර ඉව කරමින් ජීවත් වන අනෙක් බළලුන් සමඟ ගැවසෙමින් අතීතයේදී මෙන්ම නායක ස්වාමීන් වහන්සේ ළඟ දැවටෙමින් සිටිනු ඇත. එහෙත් එය දකින කෙනෙක් නැත. යම් දිනයක ගෞරවණීය ස්වාමීන් වහන්සේ සමාධිය වඩා නොපෙනෙන ලෝකය ප්‍රඥා ඇසෙන් දුටුවහොත් ජීවිතයේ කිසිම දිනයක තිරිසන් සතෙකුට ළෙන්ගතු නොවනු ඇත. මන්ද එම ළෙන්ගතු බව මතු භවයක එම තිරිසන් සතුනට ප්‍රේත ලෝකයට වැටීමට පාර පෙන්වන නිසාය. එම අසරණ සතුන් තම ස්වාමියා කෙරෙහි තිබෙන ඡන්ද රාගය නිසා තම ස්වාමියා සහ ස්ථානය වසඟයේම ප්‍රේත සතෙකුව ඉපදෙනු ඇත.

ඉහත බළලා සේම වනවාසීව වැඩ සිටින විට ප්‍රේත බල්ලන්, මී හරකුන්, මුවන්, වළි කුකුළන්, ගම් කුකුළන් භික්ෂුවට දර්ශනය වී ඇත. ඉහත සතුන් අතරින් අනුවේදනීය ප්‍රේත සතෙකු ගැන සටහනක් පින්වත් ඔබට ඉහත කරුණු සනාථ කරගැනීම සඳහා තබමි. මේ ප්‍රේත සතා භික්ෂුවට දර්ශනය වූ අතිශය දුක්ඛිත

ජීවිතයක් ගත කරන ප්‍රේත අලියෙකි. භික්ෂුව රුහුණු පුරවරයේ කැලෑබද ආරණ්‍යයක වැඩ සිටින විට රාත්‍රී සමාධියෙන් පසු වෙද්දී මෙම ආරණ්‍යයේ විශාල ගල් පර්වතය යට පිහිටි බුදු මැදුර ඉදිරියෙන් මෙම ප්‍රේත අලියා බොහෝම සෙමින් ගුප්ත, අලස ස්වභාවයෙන් ගමන් කරනවා භික්ෂුවට දර්ශනය විය. මෙම ප්‍රේත අලියා කලු පැහැති සමාන්‍ය අලින්ට වඩා උසින් අඩු පළල් ස්වභාවයක් ගන්නා අලියෙකුගේ ස්වරූපයට සමාන රූපයකි. මෙසේ ප්‍රේත අලියා විනාඩි දෙකක් පමණ ඉදිරියට ගමන් කරමින් නොපෙනී ගියේය. මේ සිද්ධිය මෙතනින් නිමා විය. නැවත සතියකට පමණ පසුව රාත්‍රියේ භික්ෂුව සමාධියෙන් පසුවන විට භික්ෂුවට මෙවැනි දර්ශනයක් දක්නට ලැබිණි. මෙම ආරණ්‍යයේ ජලය පිරී තිබෙන නිතර වල් අලින් ස්නානය කරන වැවක් තිබේ. මෙම වැවේ වල් අලි දෙදෙනෙක් හොඳ හැටියට සතුටු වෙමින් වතුර විදිමින් ස්නානය කරමින් සිටියහ. ඉහත ජීවමාන අලි දෙදෙනා ජලයේ සතුටු වෙමින් සිටින මොහොතේ පෙර සඳහන් කළ ප්‍රේත අලියාද විහාරය පැත්තෙන් සෙමින් සෙමින් පැමිණ ජීවමාන අලි දෙදෙනා ජල ක්‍රීඩා කරන වැවට බැස්සේය. ගුප්ත ස්වභාවයෙන් පැමිණි ප්‍රේත අලියාගේ හැඩරුවෙන් භික්ෂුව පැහැදිලිව ප්‍රේත අලියා හඳුනා ගත්තේය. ප්‍රේත අලියා වැවට බැස්සේ ජීවමාන අලින් දෙදෙනා සේ සතුටුවෙමින් ජලයේ ස්නානය කිරීමටය. එහෙත් අභාග්‍යයකි, කර්මයේ විපාක දීම ඒ මොහොතේ ඇරඹිණි. ප්‍රේත අලියා වැවට බැස ජලයේ පෙරළීමට නිදා ගැනීමට, උත්සාහ කරන විටම එය වැළකිණි. ප්‍රේත අලියා සිටියේ ජලයේ සිටගෙනය. ප්‍රේත අලියා මහත් වේදනාවකින් වමනය කිරීමට පටන් ගත්තේය. මොහු වමනය කරන්නේ දැඩි වේදනාවකින් හා අපහසුතාවයකින්ය. කුස හකුලවමින් මහත් වේදනාවකින් වමනය කරයි. වමනය කලු පැහැතිය, හරියට වතුර පීල්ලකින් ජලය වැක්කෙරෙනවා වගේ දැඩි ලෙස වමනය කරයි. කලු පැහැති වමනය භික්ෂුව හඳුනා ගත්තේ ලේ වමනය ලෙසයි. දැඩි අපහසුවකින් ලේ වමනය කළ ප්‍රේත අලියා දිය නෑමට වාසනාව නොමැතිව වැවෙන් ගොඩට සෙමින් සෙමින්

වේදනාවෙන් පැමිණ නොපෙනී ගියේය. මේ සිද්ධි දාමය ප්‍රේත අලියාගේ දින චර්යාව විය යුතුය. පෙර කරන ලද කර්මයක් නිසා මෙම ප්‍රේත අලියාට සමහර විට කල්ප ගණනාවක් මෙලෙසින් තමා කැමති දෙයක් ස්පර්ශ කිරීමට යෑමේදී මේ ආකාරයෙන් ලේ වමනය ගොස් ශරීරය වේදනාවට පත්ව එම ආස්වාදය ලැබීමේ හැකියාව අකුසල කර්ම බලය නිසා අහිමි වේ යැයි භික්ෂුව අනුමාන කරයි. ඉහත අවස්ථාවේදීද ප්‍රේත අලියා බොහෝම කැමැත්තෙන් වැවට බැස්සේ ජීවමාන වල් අලි දෙදෙනා වැව් ජලයේ සතුටුවන සතුට තමන්ද විඳීමටය. එහෙත් එය ඛේදවාචකයක් විය.

අපි බලමු අනුමාන වශයෙන් මොන වගේ අකුසලයක් මේ සතා අතින් වෙන්න ඇතිද කියලා. ඊට පෙර මේ ප්‍රේත අලියා කවුරුන්ද කියල හොයල බලමු. මේ ආරණ්‍යය නිරන්තරයෙන් වල් අලින් ගැවසෙන ස්ථානයක්. මෙහි එක අලියෙක් ඉඳල තිබෙනවා බොහෝම කාලයක් හාමුදුරුවන්ට බොහෝම කීකරුව ගෙදරක හුරතලයට හදන බල්ලෙක් යම් සේ තම ස්වාමියාට කීකරුද ස්වාමියාගේ අණ පිළිපදීද එයට සමාන ආකාරයෙන් මෙම වල් අලියා ස්වාමීන් වහන්සේට කීකරුව සිට ඇත. මෙම කීකරුභාවය ඇති කරගෙන ඇත්තේ වල් අලියා ප්‍රිය කරන රසවත් ආහාර දීම නිසාය. මෙසේ සිටින අතරතුර භික්ෂුව අසා තිබූ පරිදි අසල වන ලැහැබකදී එම වල් අලියා අත්වැරදීමකින් සිදු වූ වෙඩි ප්‍රහාරයකින් මිය ගොස් ඇත. අලියා මිය යන මොහොතේ රැලෙන් සහ තම වර්ගයාගෙන් මිදී සිටි මෙම වල් අලියාට ස්වාමීන් වහන්සේත් මෙම ආරණ්‍යයත් හැර වෙන කුමක් සිහි වෙයිද. තම රැලෙනුත් කැලෑවෙනුත් මිදිලා තමාත් ආරණ්‍යයේ සාමාජිකයෙක් ලෙස ජීවත් වූ මෙම අලියාට මැරෙන මොහොතේ ස්ථානය සහ ස්වාමීන් වහන්සේ ගැන ඇති වූ ඡන්ද රාගය, තෘෂ්ණාව නිසා එහිම ප්‍රේත අලියෙක් ලෙස උපත ලබන්නට ඇතැයි භික්ෂුව අනුමාන කරයි. දැන් මේ ප්‍රේත අලියා මිය යාමට පෙර වල් අලියෙකු ලෙස හැසුරුණ ආකාරයෙන්ම ප්‍රේත අලියෙකු ලෙස ආරණ්‍යය භූමියේ නිරතුරුවම ගැවසෙමින් තම ප්‍රේත ජීවිතය ගත කරනු ඇත.

පෙර වල් අලියෙක් ලෙස ජීවත් වීමේදී භික්ෂූන්ගේ පරිහරණය සඳහා තිබූ වැව් ජලය බොර කිරීම, අපවිත්‍ර කිරීම, උපාසක උපාසිකාවන්ට ජලය පරිහරණය වැළක්වීම, බිය ගැන්වීම වැනි හේතූන් නිසා මෙම කර්ම විපාකය විඳීමට සිදු වූවා විය හැකිය. මන්ද මේ වල් අලියා නිසා බියට පත් වූ පින්වත් වන්දනාකරුවන් ද බොහෝ විය හැකිය.

දෙවැනිව බලමු ප්‍රේත අලියා විඳින දැඩිම කර්ම විපාකය ලේවමනය දැමීම ගැන. මෙය සාමාන්‍ය ලේ වමනයක් නොවේ. ගොජ ගොජ ගාමින් දමන ලේ වමනයකි. මෙවැනි කර්ම විපාකයක් විඳීමට හේතු වූ කාරණය වශයෙන් භික්ෂුව අනුමාන කරන්නේ සාංඝික දේවල් මේ වල් අලියා කෑමය. භික්ෂුව මෙයින් අදහස් කරනුයේ ආරණ්‍යය භූමියේ ඇති ගහ කොළ නොවෙයි. පාලි වාක්‍ය ප්‍රකාශ කර දායකයින් මහත් සද්ධාවෙන් මහා සංඝ රත්නයට පූජා කරන ලද දානයයි. මේ වල් අලියා කාලයක් නායක ස්වාමීන් වහන්සේ ඇතුළු පින්වත් ගිහි කැපකරුවන්ගේ සුරතලා වෙමින් ආරණ්‍යයේ වැඩ සිටින සංඝයා උදෙසා පූජා කළ ආහාරයන්ගෙන් දිනපතා නිරතුරුවම සංග්‍රහ ලැබූ සතෙකි. ඉහත කාලය තුළ සංඝ රත්නය උදෙසා දායකයින් පූජා කළ ආහාරපාන කොතෙක් මෙම සතාට දෙන්නට ඇතිද? ස්වාමීන් වහන්සේලාගේ දානයට තිබෙන පළතුරු, කැවිලි, මේ සතාට ආහාරයට දීම නිසා සංඝ රත්නයට ඒවා වැළදීමේ අවස්ථාව අහිමි වෙන්නට ඇතිද?

සංඝ රත්නය යනු මෙලොව උතුම්ම පිරිසයි. එක්තරා අවස්ථාවක ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ බුදුරජාණන් වහන්සේ අරමුණු කර කරන පූජාවට වඩා මහා සංඝ රත්නය අරමුණු කරගෙන කරන පූජාව මහත්ඵල මහානිසංස අත්වන බවයි. ඒ නිසා ගෝතමිය මේ චීවරය මහා සංඝ රත්නය අරමුණු කරගෙනම පූජා කරගන්නය කියලා මහා ප්‍රජාපතී කිරි මෑණියන්ට මහා සංඝ රත්නයේ බල කදම්බය ගැන සිංහ නාද කරනවා. මහා සංඝ රත්නය යනු මේ ජාති, ජරා, ව්‍යාධි, මරණවලින් ගහන මේ ලෝකයෙන් එතෙර වූ

පිරිසක්මය. නොඑසේනම් එම මාර්ගයේ ජයග්‍රහණය කරා ගමන් කරන පිරිසක්මය. උන්වහන්සේලා ලෝක ධාතුවම අනිත්‍යයේ වේගයෙන් සියුම් කර ප්‍රඥාවෙන් තම දෝතට ගත් පිරිසක්මය. මේ පඨවි ධාතුව අනිත්‍යයේ වේගයෙන් සියුම් කර අයෝමය පඨවි ධාතුවට අභියෝග කළ පිරිසක්මය. එවන් මහා බුලකදම්බයකින් පරිපූර්ණ සංඝ රත්නය අරමුණු කොට ඉමහත් ශ්‍රද්ධාවෙන් යුතුව පාලි වාක්‍ය ප්‍රකාශ කරමින් සාංඝික වශයෙන් පුජා කරන ආහාරපාන මහා සංඝ රත්නයේ අවශ්‍යතා සපුරා ගැනීමට පෙරාතුව තිරිසන් සතුනට ආහාරයට දීම එම අහිංසක සතුනට කරන අසාධාරණයක් වනවා නිසැකය.

මෙහිදී ඔබට මෙවැනි ප්‍රශ්නයක් මතු වීමට ඉඩ ඇත. තමා කන්නේ සාංඝික දෙයක් බව වල් අලියාට චේතනාවක් නොමැති නිසා අකුසලයක් වන්නේ කෙසේද කියල. එය මෙසේ අප තේරුම් ගත යුතුය. අලියා දාන ශාලාව ඉදිරියට එන්නේ දානයට සංඥාව දෙන ගෙඩියේ හඬට. එම සතා එන්නේ "හාමුදුරුවෝ වළඳන දේවල් මටත් දෙන්න" කියන චේතනාව එම සතා තුළ ඇති නිසාය. මෙහිදී කර්මය කර්ම ඵලය වැටහීමක් නොමැති තිරිසන් සතා අසරණයෙකි. එම අහිංසක සතුන් එම අසරණ භාවයෙන් මුදවා ලීමට අප දක්ෂ විය යුතුය. අපි අදක්ෂ වුවහොත් අසරණ සතුන් සසර අනන්ත දුක්වලට මුහුණ දෙනු ඇත. එසේ නම් අප ඔවුනට දක්වා ඇත්තේ කරුණාවේ නාමයෙන් අකාරුණික බවකි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ පාරිලෙය්‍ය වනයේදී පාරිලෙය්‍ය ඇතාගෙන් උපස්ථානයක් ලබා එම ඇතාට සුගතියකට යැමට අවස්ථාව සලසා සැබෑම සත්ත්ව කරුණාව දැක්වූවා මිස ඇතාට ආහාරපාන ලබාදී උපස්ථානය කිරීමට ගොස් එම සතාට දුගතියට යැමට කරුණු කාරණා සකස් කර දුන්නේ නැත. සැබෑම සත්ත්ව කරුණාව කුමක්ද යන්න බොහෝම නිරවුල්ව ලෝකයාට ආදර්ශයෙන් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළහ. මෙම ආදර්ශය වඩාත්ම වටින්නේ නිවන් මඟ වඩනා පින්වතුන්ටමය. එසේ නොවුණහොත් සසර කළ අකුසල්

නිසා දන් නොදීම, සීලයක් ආරක්ෂා නොකිරීම, මෛත්‍රිය නොවැඩීම වැනි එම අකුසල් නිසා සතර අපායට වැටුණු සතුන් නිසා ඔබ ඔබේ සතර අපායෙන් මිදීමට ඇති අවස්ථාව අහිමි කර ගන්නවා ඇත.

මෙහිදී විශේෂයෙන් ගිහි පින්වතුන්ට අවධාරණය කරන්නේ පින්වත් ඔබ අසරණ සතුනට දක්වන කරුණාව මෛත්‍රිය දක්වන්න එපාය කියල නොවේ. අසරණ සතුනට ආහාරපාන රැකවරණය සැලසීම පින් වැඩෙන තමා තුළ මෛත්‍රිය වැඩෙන ක්‍රියාවක්. එහෙත් මෙම සතුන් ඔබ ඔබේ කර නොගන්න. ඔබේ දුව පුතා කර නොගන්න. ඔබේ නිදන කාමරයේ, සාලයේ, ඔඩොක්කුවේ සුරතලා කර නොගන්න. මෙවැනි බැඳීම් හේතුවෙන් එම සතුන් මිය යාමෙන් පසුව ප්‍රේත සතුන් ලෙස ඔබේ නිදන කාමරය, නිවස, ඔඩොක්කුව උපාදානය කරගෙන නැවත ඉපදෙනු ඇත. මේ වන විටත් ඔබ සීමාව ඉක්මවා සුරතලයට සැදුව සතුන් මියගොස් ප්‍රේත සතුන් ලෙස ඔබගේ නිවසේ හැසිරෙනවා ඇත. සයනයේ නිදනවා ඇත. ඔඩොක්කුවේ නිදනවා ඇත. ඔබේ කෑම මේසයේ ආහාර දිව ගානවා ඇත. එහෙත් ඔබ මේ කිසිවක් නොදනී, නොදකී. මන්ද ඔබ දකින්නේ දෑසින් පෙනෙන ලෝකය පමණක් නිසාය. ඉහත ප්‍රේත අලියා විඳින දුක තවත් සතෙකුට නොදීමට අපි වගබලා ගතයුතු වෙමු. ඔබ මෙහෙම සිතන්න. ලෝකයේ ආගම් තිබෙනවා ඒවා අදහන පිරිස් යාඥා කරමින් සතුටු සිතින් අහිංසක සතුන් ආගමික පූජා උදෙසා මස් සඳහා, සුබ කටයුතු සඳහා මරණවා. ඒ අය යාඥා කරමින්, සතුටු සිතින් එම සතුන් මැරුවාය කියලා ඔවුනට පුළුවන්ද එම ප්‍රාණඝාත අකුසලයෙන් මිදෙන්න. එහි කර්ම විපාකයන්ගෙන් මිදෙන්න. නොදන්නාකම කර්ම විපාකයන්ගෙන් මිදීමට හේතුවක් නොවේ. නොදන්නා කම යනු අවිද්‍යාවයි. අවිද්‍යාවේ අවසාන ඵලය ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්සයන්මය. කවුරුන් වුවද දුගතියක උපත ලැබූ විට තමා කරා ඇදී එන්නේ කරන ලද අකුසල් විපාකයන්ම බව අප සිහිතබා ගත යුතුය. ඉහත ප්‍රේත අලියා ද එහි ජීවමාන සංකේතයකි.

# අතහැරීමක ආරම්භය සහ අල්ලාගැනීමක අවසානය

(දඹරන් දෙවියා 1)

භික්ෂුව බොහෝම කල්‍යාණ මිත්‍ර භාවයෙන් ඇසුරු කරන ස්වාමීන් වහන්සේ නමකගේ සහෝදර ස්වාමීන් වහන්සේ නමක් තරුණ වයසේ පැවිදි වෙලා ඉතා සිල්වත් පැවිදි ජීවිතයක් ගත කරමින් වැඩ සිටියා. උන් වහන්සේ පසුගිය වසර හතරක පමණ කාලය තුළදී වැඩ සිටියේ දකුණු පළාතේ හුදකලාව කුඩා ආරණ්‍යයක. භික්ෂුවට කවදාකවත් උන්වහන්සේව මුණගැහිල නැහැ. උන්වහන්සේ තුන් සිවුරත් පාත්‍රයත් පමණක්මයි දැරුවේ. භික්ෂුවට වරක් දැනගන්න ලැබුණා උන්වහන්සේ එක් අඳනයක් පමණයි පාවිච්චි කරන්නේ ඒ එකම අඳනය ඇඳගෙන පැන්පහසු වෙලා, ඒ අඳනය වේලාගෙන තමයි නැවත පරිහරණය කරන්නේ කියලා.

උන්වහන්සේ දෙවැනි අඳනයක් හෝ නානකඩයක් පාවිච්චි කරන්නේ නැහැ. මෙම පින්වත් ස්වාමීන් වහන්සේගේ අතහැරීම උන්වහන්සේ රකින ධුතාංගයක් වශයෙනුයි උන්වහන්සේ අර්ථ දක්වන්නේ. මේ අතහැරීම භික්ෂුව විවේචනය කරන්නේ නැහැ. පසසන්නෙත් නැහැ. මොකද යම් ස්වාමීන් වහන්සේ නමක් සීමාව ඉක්මවලා අත්‍යවශ්‍යම දෙය හිස්කරන්න, අතහරින්න යනවා නම් එහෙම කළ යුතුයි සිතනවා නම් ඒ ගැන දෙවරක් සිතා බැලිය යුතුයි. එසේ නොමැති නම් ගුරුවරයෙකුගෙන් කල්‍යාණ මිත්‍රයෙකුගෙන් ගුරුහරුකම් ගත යුතුයි. ධුතාංගයක්

රැකීමේදී අපි දන්නවා එය ධූතාංගයක් බවට පත්වෙන්නේ එහි ස්වභාවය තමා පමණක් දැනගැනීමෙන් පමණය කියලා. භික්ෂූන් වහන්සේගේ තුන්සිවුරට නානකඩය අයිති නොවුණත් පින්වත් ස්වාමීන්වහන්සේ නමකට නානකඩයත් අත හැරීමට සිතෙනවා නම් එය අත හැරීමට වඩා අල්ලා ගැනීමක්. කුමක් අල්ලා ගැනීමක්ද? 'මම', 'මගේ සීලය', 'මගේ අතහැරීම'.... වස් ආරාධනා සිදු වෙද්දී නානකඩයක් විනයානුකූලව භික්ෂුවකගේ පරිහරණයට ලැබෙනවා.

ඉතා කුඩා නානකඩය අතහැරලා විශාල දෙයක් අල්ලා ගන්නවා. මේවා තමයි යම් යම් තැන්වල නවාතැන් ගන්නා සියුම් කෙලෙස් ධර්මයන්. මෙය සටහන් කරන භික්ෂුවද හැමදාමත් තුන් සිවුරට අමතරව නානකඩයක් පාවිච්චි කරනවා. කුඩා දෙයක් අත හැරීමේ වේශයෙන් එන මහා දෙයක් අල්ලා ගැනීමේ ස්වභාවය මෙම සිද්ධීන්ගෙන් අපි අවබෝධ කරගත යුතුයි.

ඉහතින් සඳහන් කළේ භික්ෂුවගේ අදහසයි. නමුත් එම පින්වත් භික්ෂුවගේ අදහස මීට වඩා වෙනස් වෙන්න පුළුවන්. උන්වහන්සේට ගෞරව කරමිනුයි පහත සටහන තබන්නේ.

මෙතැනදී භික්ෂුව කීමට උත්සාහ දරන්නේ නානකඩය අතහැරීම ගැන නොවේ. එවැනි අතහැරීමක් කිරීමට ධෛර්යයක්, වීර්යයක්, කැප කිරීමක් කිරීමට හැකියාව ඇති, ඉතා හොඳින් සීලය ආරක්ෂා කරගත් මේ පින්වත් තරුණ ස්වාමීන් වහන්සේ, ඔය අතහැරීමත්, රැකගත් සීලයත් තණ්හාව, මාන්නය දෘෂ්ටීන්ට යටත්ව ක්‍රියාත්මක නොකළානම් එහි වටිනාකම ගැනයි. තමා තුළ අධිෂ්ඨානයෙන් ගොඩ නගාගත් සීලයේ ශක්තිය, දිරායන නාන කඩය මෙන්ම ඒ නානකඩය දවටා ගන්නා ශරීරයේ අනිත්‍යභාවයත්, නාන කඩයත් අත්හරින්නයයි අණ කරන සිතේ අනිත්‍ය බවත් දුටුවා නම් නැවත සසරේ නාන කඩයක් දවටා ගැනීමට අවශ්‍ය නොවන ස්වභාවයකට යාමට පුළුවන්කම තිබුණා විය හැකියි.

මේ 'මම' මගේ සීලය කියන දෘෂ්ටිය නිසා හටගන්නා මාන්නයේ අහිංසක ස්වභාවයන්ය. බාහිර කෙනකුට හඳුනා ගැනීමට නොහැකි තරමට මේ ධර්මතාවයන් සියුම්ය. නිවීමේ අරමුණ ජය ගැනීම උදෙසා ඔබ තුළ මෝදු වන තරුණ ජවය පින්වත් ඔබලාගේ සංසාරික පුරුදුය. මේ සුන්දර මනුෂ්‍ය ජීවිතය ලැබුවේ සම්මා සම්බුදු ශාසනය පිරිනිවීයාමට පෙරාතුව මේ ජීවිතයේදීම අවම වශයෙන් සතර අපායෙන් මිදී නිවන් මාර්ගයට අවතීර්ණ වීම සඳහාමය. මෙය ඔබට ලැබෙන අවසාන අවස්ථාව වීමටද පුළුවන. එහෙයින් නිවීමේ මග උදෙසා ඔබේ තරුණ ජවය යෙදිය යුත්තේ මාර බලවේගයන්ගේ ග්‍රහණයෙන් මිදෙමින්ය. කල්‍යාණ මිත්‍ර ආශ්‍රය සමගින්මය.

මෙසේ හුදකලාව වැඩ සිටි ස්වාමීන්වහන්සේ තම කුඩා ආරණ්‍යයේ වැඩ සිටියදී දිනක් රාත්‍රී සයනය කර සැතපී හිමිදිරියේ අවදිවන විට සයනයේ අතුරා තිබූ කොට්ටය යටට ධාතුන් වහන්සේලා කීප නමක් වැඩම කර තිබුණි. මේ ධාතුන් වහන්සේලා වැඩම කිරීම නිසා මෙම ස්වාමීන් වහන්සේට තම කුඩා ආරණ්‍යයේ එම ධාතුන් වහන්සේලා නිධන් කර චෛත්‍යය රාජයාණන් වහන්සේ නමක් ඉදිකිරීමට සිත පහළවිය. දායක පිරිසද ඊට බොහෝම සද්ධාවෙන් ඉදිරිපත් විය. පින්වත් ස්වාමීන් වහන්සේගේ සැතපෙන කොට්ටය යටට ධාතුන් වහන්සේලා වැඩම කිරීම නිසා දායකයින් තුළ ස්වාමීන් වහන්සේට ගෞරවය වැඩි විය. ආරණ්‍ය පිහිටි වන මැද ගල් කුළ මතට බොහෝම මහන්සියෙන් ගල්, වැලි ගෙනැවිත් ගොඩ ගසා තිබුණි. චෛත්‍යයේ වැඩ කටයුතු පහසු කරගැනීම පිණිස ස්වාමීන් වහන්සේව පහසුවෙන් සම්බන්ධකර ගැනීම සඳහා සහ ඉදිකිරීම් කටයුතු සම්බන්ධීකරණය කර ගැනීම සඳහා දායක පිරිස විසින් සෙලියුලර් දුරකථනයක්ද පූජා කරන ලදී. නානකඩයත් අත්හැර දමා සිටි පින්වත් ස්වාමීන් වහන්සේ මේ සියල්ල අකමැත්තෙන් පිළිගත්හ. තරුණ ස්වාමීන් වහන්සේද ගල් වැලි කර මත අදිමින් බොහෝම වෙහෙස මහන්සියෙන් කටයුතු කළහ. හුදකලාව ප්‍රිය

කළ, ධුතාංග වැඩූ ස්වාමීන් වහන්සේගේ මේ වෙනස අහම්බයක් නොවේ. මන්ද මාරයා අපිව එයාගේ දැලට හසුකර ගැනීම සඳහා එයාගේ නවාතැන් පලවල්වල සීලය, සමාධිය වැනි ඔටුනු පළඳවාගෙන නවත්වාගෙන සිටින්නේ සුදුසු වේලාවේදී ගොදුරු කරගැනීමටය.

ගුරු ඇසුරකින් තොරව නිවන් මග වැඩීම මාරයාට කරන ආශිර්වාදයක්මය. අපි වෙර වැඩිය යුත්තේ නිරතුරුවම සීලය, සමාධිය නවාතැන් පලවල නොනැවතී ඒවා නිසා දායක පිරිස්වලින් ලැබෙන ධනාත්මක ප්‍රතිචාර අතහරිමින් සියල්ලම කමටහනක් කරගෙන ප්‍රඥාව දෙසට, ගමනාන්තයට යාමටය.

චෛත්‍යයේ වැඩ කටයුතුවලට පින්වත් ස්වාමීන් වහන්සේ දුරකථනය භාවිතා කිරීම නිසා එහි බැටරිය ආරෝපණය කර ගැනීමට සිදුවිය. ආරණ්‍යයට විදුලි බලය නොතිබිණි. උන්වහන්සේ වැඩ සිටියේ ලන්තෑරුම් එළියෙනි. දුරකථනයේ බැටරි චාජ් කරගැනීමට ආරණ්‍ය අසලම පිහිටි නිවසට සවසට වැඩම කිරීමට උන්වහන්සේට සිදුවිය. මෙම සිද්ධිය උන්වහන්සේ ආර්යකාන්ත සීලයකින් හික්මුණු කෙනෙක් නොවන බවට මතුකොට පෙන්වන සාධකයකි. එක්තරා දිනයක අදාළ නිවසේ සිට බැටරිය ආරෝපණය කරගෙන තම කුටියට වඩින විට සවස 6 ට පමණ කැලෑ මාර්ගයේ අතරමග ස්ථානයකදී උන්වහන්සේට වල් අලියෙක් පහර දී තිබිණි. එය ඉතා දැඩි දරුණු පහර දීමකි. පහරදීමෙන් උන්වහන්සේ අපවත් වූහ. ඒ බව දායක පිරිස දැන ගත්තේ පසුවදා උදෑසන 9 ට පමණය. ගම්මානයකට ඇතුළු වන්නට ගොස් ගම්වැසියන්ගේ පීඩාවට ලක්ව පලායමින් සිටියදී ස්වාමීන් වහන්සේව මුණගැසුනු, වියරු වැටී සිටි අලියා විසින් මුළු රැයක් පුරාම දැඩි ලෙස පහර දීමට ලක් කර තිබූ දේහය කැලයේ ගල් කුලක් පාමුල තිබිණි. ඒ ශ්‍රී දේහය දැඩි ලෙස කුඩු වී තැලී නරක් වී තිබිණි. දේහය එක් දිනක් හෝ තබා ගැනීමට නොහැකි නිසා එදිනම සවස එම කුඩා ආරණ්‍යය භූමියේදීම අදාහනය කර තිබිණි.

උන්වහන්සේ අපවත් වීමට දින කිහිපයකට පෙර වෙහෙස මහන්සි වී චෛත්‍ය කර්මාන්තයට ඇද්ද වැලි, කළුගල් ඒ ඒ තැන්වල නිසොල්මන්ව තිබිණි. ශ්‍රී දේහය දැවී වා තලයට එකතු වූ අළු, දුවිලි එම වැලි ගොඩටම නැවත එකතු විය. වල් අලි ප්‍රහාරයේදී උන්වහන්සේගේ ශරීරයෙන් ගලා ගිය රුධිරය පසට එකතු වී පසේම කොටසක් බවට පත්විය. සෙලියුලර් දුරකථනය අලිපාදයට පෑගී කුඩු පට්ටම් වී පසේම කොටසක් බවට එකතු විය. ශ්‍රී දේහය දැවී ඉතිරි වූ භෂ්මාවශේෂ පාත්‍රයේ බහා මහ පොළවේ තැන්පත් විය. මේ සියල්ල දෙස සතියෙන්, සිහියෙන් බලන විට අපි දකින්නේ රූපයේ අනිත්‍ය භාවයයි. අනිත්‍ය භාවයේ වේගයයි.

ඉහතින් භික්ෂුව සටහන් කළ තොරතුරු සියල්ලම භික්ෂුව දෑසින් නොදුටුව නමුත් කල්‍යාණමිත්‍ර ස්වාමීන් වහන්සේ එම ආදාහනයට වැඩම කර පැමිණි පසු උන්වහන්සේගෙන් දැනගත් සිද්ධීන් සමග ගලපා කළ සටහනකි. මේ පින්වත් ස්වාමීන් වහන්සේ අපවත් වීමෙන් පසු උන්වහන්සේ අපවත් වූ වේදනාත්මක ස්වභාවය සලකා නිතිපතා පින් අනුමෝදන් කිරීම් සිදුවිය. උන්වහන්සේ වෙනුවෙන් දාන මාන පින්කම් සිදුවිය.

අපවත්වීම සිදු වී හරියටම දින හතකින් රාත්‍රියේ භික්ෂුවක් සමාධියෙන් පසුවෙන විට අඩි 10 පමණ උසැති මහා සද්දන්ත ශරීරයක් ඇති මිනිස් රුවක් දර්ශනය විය. මේ ප්‍රේත මිනිසාගේ ශරීරයේ උඩුකයට ඇඳුමක් නොතිබිණි. මොහු ප්‍රේත ලෝකයේ උපත ලද ප්‍රේත ලෝකය අභිබවා ගිය 'මහේශාක්‍ය' ප්‍රේත උපතකි. මේ මහේශාඛ්‍ය බව නිසා මොහුට අනෙක් ප්‍රේතයින් අභිබවා යන විශාල ශරීරයක්, පෞරුෂත්වයක් ලැබී තිබිණි. මොහුට තිබුණේ කළු පැහැති ශරීරයකි. මේ අපූරු ප්‍රේත සද්දන්තයාගේ දෑස් දෙකින් සුදු පැහැති දීප්තිමත් ආලෝක දෙකක් විහිදෙමින් තිබිණ. මොහු දර්ශනය වී විනාඩි දෙකකින් පමණ නොපෙනී ගියේය. ප්‍රේතයාගේ මහේශාඛ්‍ය සද්දන්ත පෙනුමත්, දෑස් වලින් ආලෝකය විහිදෙන ස්වභාවයත් නිසා භික්ෂුව තුළ, මේ අලියා

පහර දීමෙන් අපවත් වූ ස්වාමීන් වහන්සේගේ නැවත උපතදැයි සැකයක් ඇති විය. එය සැක කිරීමක් පමණි. ඉහත ස්වභාවය නිසා භික්ෂුව ද නැවත නැවත පින්දීම සිදු කළේය. අපවත් වී හරියටම දින 11 කින් උදේ පාන්දර පහට පමණ භික්ෂුව සමාධියෙන් පසුවන විට එම ස්වාමීන් වහන්සේව අරමුණු කළේය. ඒ මොහොතේම දිව්‍යතලයක වැඩ සිටින අපූරු සුන්දර දෙවියෙක් දර්ශනය විය. එම දෙවියා දිව්‍ය භාවයෙන් සිටියේ එරමිනිය ගොතාගෙන සිටින ඉරියව්වෙනි. ඉතාමත් නිස්කලංකව වැඩ සිටියේය. ලස්සන හුරුබුහුටි තිකලැල් තරුණ පෙනුමක් දිස්විය. පිරිවර දෙවියන් හෝ දිව්‍යාංගනාවන් කිසිවක් නොදුටුවේය. එම දෙවියා දඹරන් පැහැති ඔටුන්නක් පැළඳ සිටියේය. එම ඔටුන්නේ හිස් ආවරණයේ කන් පෙති දෙපස රවුම් ආකාරයට දඹරන් පාටින් කැටයම් කළ රවුම් දෙකක් ඔටුන්නට සම්බන්ධ වී තිබිණි. එම දෙවියාගේ ශරීරයේ උඩු කොටස සම්පූර්ණයෙන්ම දඹරන් පැහැයෙන් යුත් ආභරණවලින් සැදි ඇඳුමකින් සැරසී තිබිණි. මෙය වෙස් නැට්ටුවන් උඩුකයට පළඳින ආභරණ සහිත සැට්ටය සේය. දෙවියාගේ ශරීරයේ වර්ණයද, පැළඳ සිටින ආභරණවල වර්ණයද දඹරන් පැහැතිය. ශරීරයත්, ආභරණත් වෙන් වශයෙන් ගත නොහැකිය. දඹරන් පැහැති ශරීරයේම ලියවන ලද ඇඳුම් ආභරණයන් සේය. දඹරන් පැහැය හැර වෙනත් පැහැයක් දෙවියා තුළ නොවීය. මේ දෙවියාට නමක් තබන්න යැයි යමෙක් භික්ෂුවට කීවොත් දෙවියාට නම තබන්නේ 'දඹරන් දෙවියා' කියාය. දඹරන් කුට්ටියකින් ලියවන ලද දෙවියෙක් සේය.

# ක්‍රෝධයේ කළු පැහැය සහ සීලයේ රන් පැහැය

**(දඹරන් දෙවියා 2)**

භික්ෂුවට පළමු අවස්ථාවේදී දර්ශනය වූ සද්දන්ත ප්‍රේත ස්වභාවයත්, දෙවැනිව දර්ශනය වූ සශ්‍රීක දිව්‍ය ස්වභාවයත් කවුරුන්ද යන්න දැන් විමසා බලමු. භික්ෂුව මේ කරුණු පහත විග්‍රහ කරනු ලබන්නේ අනුමානයන් වශයෙනි. එය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම ඔබට බාරය. අවශ්‍ය වන්නේ ලෝකයේ ස්වභාවය ගැන ඔබ යමක් ඉගෙන ගැනීමය.

අලි ප්‍රහාරයට ලක්වූ ස්වාමීන් වහන්සේ එම ප්‍රහාරයට ලක්ව ඇත්තේ සවස 6 ට පමණය. ක්ෂණිකව ඇති වූ අලි ප්‍රහාරයේදී ස්වාමීන් වහන්සේ තුළ බිය, ක්‍රෝධය සහිත ගැටෙන සිතක් අවසාන චුති සිත ලෙසින් සැකසෙන්නට ඇත. අලියා මෙම සිරුර පාපන්දුවකට ගසන්නාක් මෙන් හොඬයෙන් සහ පාදවලින් ගසමින් යම් දුරක් ගෙනගොස් ඇත. උන්වහන්සේ පළමු පහරදීමේදීම ක්ෂණිකව අපවත් වී හෝ සිහිමුර්ජා වී නැත. පහර කමින් ක්‍රෝධය, බිය, වෛරය සිතෙන් අත් විඳිමින් සිට අපවත්වීම සිදු වී ඇතැයි භික්ෂුව අනුමාන කරයි. මෙලෙස දීර්ඝ වේලාවක් දුක දරමින් සිදුවන වේදනාත්මක, බියජනක අපවත් වීමකදී උන්වහන්සේට තමා වැඩූ සීලය ගැන මෙනෙහි කිරීමට සුදුසු සිහියක් වැඩී නොමැත. මේ හේතුවෙන් ගැටුණු සිතකින් අපවත් වූ උන්වහන්සේ ප්‍රේත ලෝකය අභිබවා ගිය සද්දන්ත ප්‍රේතයා ලෙස උපත ලබන්නට ඇතැයි භික්ෂුව අනුමාන කරයි.

සශ්‍රික දිව්‍ය ස්වභාවයක් ලබාගැනීමට තරම් කුසල් ජීවිතය තුළ රැස්කොටගෙන තිබුණද, අවසන අනපේක්ෂිත කුරිරු ප්‍රහාරය නිසා එම කුසල් යටපත් වී අකුසල් සිතක්ම සකස් වීම අරුමයක් නොවිය යුතුය. මේ අකුසල් සිතේ ස්වභාවයට ගැලපෙන ප්‍රේත ලෝකයේ උපතක් ලැබුවද, පැවිදි ජීවිතයේදී කළ කුසල් නිසා, ඒවායේ ශක්තිය නිසා ඇස් දෙකෙන් ආලෝකය විහිදෙන ස්වභාවයක් සහිත සශ්‍රික ප්‍රේත ජීවිතයක් ඇති විය. ප්‍රේතයාගේ ඇස් දෙකෙන් ආලෝකය විහිදෙන්නේ පෙර භික්ෂු ජීවිතයේ අනුනට දහම් දෙසීම, ප්‍රඥාව වඩවා ගැනීමට උපකාර කිරීම වැනි ශක්තිමත් කුසල කර්මවල ආනිසංසයන් විපාක දීම හේතුවෙන් යැයි භික්ෂුව විශ්වාස කරයි.

තමාට දුන් ශක්තිමත් පින් අනුමෝදන් වීම නිසා එම සශ්‍රික ප්‍රේත ස්වභාවයෙන් මිදී, එම ස්වාමීන් වහන්සේ කුරිරු ලෙස අපවත් වන අවස්ථාවේදී යටපත් වී ගිය කුසල් විපාකයන්ට ගැලපෙන සශ්‍රික දිව්‍ය ස්වභාවයක් ලබන්නට ඇත.

මෙම සශ්‍රික දිව්‍ය ස්වභාවය උන්වහන්සේ ලැබුවේ වැඩූ සීලයේ ආනිසංස නිසාමය. මේ දඹරන් දෙවියා සීලයේ උත්කෘෂ්ට ප්‍රතිඵලයකි. මේ සටහනේ මුලදී භික්ෂුව සඳහන් කළ අයුරින්, තුන් සිවුර හැර නාන කඩයක්වත් උන්වහන්සේ පරිහරණය නොකළේ තමන්ගේ උත්කෘෂ්ට සීලය ධූතාංගයක් ලෙස ආරක්ෂා කරගැනීමටය. මෙය සුන්දර දිව්‍ය ස්වභාවයක් වුවද භවයේ නවාතැන්පලක්මය. ජාති, ජරා, ව්‍යාධි, මරණවලට තෝතැන්නකි. එහෙත් ලොව්තුරා බුදු සමිඳුන් පිරිනිවීම සිදුවී වසර 2550 ක් ඉකුත්ව ගිය මෙවැනි කාල වකවානුවක තම භික්ෂු ජීවිතය මෙවන් සශ්‍රික දිව්‍ය ස්වභාවයක් කරා මෙහෙයවීමට හැකි වීම මහා ජයග්‍රහණයකි. විජයග්‍රහණයකි. ගිහි පැවිදි සැවොම ආදර්ශයට ගත යුත්තකි. සිව්පසය රැස් කිරීම, ගොඩගසා ගැනීම, අතහැර ගැනීමට නොහැකිවීම හේතුවෙන් ලාභ සත්කාරවලට ගිජු වීම හේතුවෙන්, අපවත් වීමෙන් පසු භික්ෂු ප්‍රේතයන් ලෙස ජීවත් වන පිරිස් ආරණ්‍ය ආශ්‍රිතව භික්ෂුවට දර්ශනය වී ඇත. එහෙයින්

ඉහත දඹරන් දෙව්යා කාලයට අනුරූපීව ජයග්‍රාහී උපතකි. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ යම් හෙයකින් මුල් සද්දන්ත ප්‍රේත උපතින් මිදීමට නොහැකිවූවානම් සතර අපායේ දිගින් දිගටම රැඳී සිටීමට තරම් අවදානමක් සහිත තැනකට පත්වීමය. එහෙත් තමාගේ අතීත කුසල්වල ශක්තිය නිසා සතර අපායේ උපතින් මිදිණ. කල්‍යාණ මිත්‍ර ඇසුරකින්, ගුරුවර ඇසුරකින් තොරව තමා තුළ පවතිනවා යැයි විශ්වාස කරන අධි අවබෝධාත්මක තත්ත්වයන් ගැන වැරදි වැටහීම් ඇතිකර ගැනීම නිසා මෙවැනි තත්ත්වයන්ට තමන් පත්වීම ස්වාභාවිකය. හුදෙකලාව මෙන්ම, පැවිදි ජීවිතයේ ලැබෙන සැපත්, දුකත් නිසා ඔබ ඇලීමට, ගැටීමට හෝ උපේක්ෂාවීමට යා යුතු නැත. ඔබ දැකිය යුත්තේ ඉහත ධර්මතාවල අස්ථිර භාවයයි.

වනවාසී, එකලා, හුදෙකලා ප්‍රතිපදාවට ඔබ යොමුවීම, මාරයා දැඩි ලෙස පීඩනයට පත්වන සිද්ධියක්, රූපයට ඇති ඇලීමත්, ගැටීමත්, උපේක්ෂාවත් යන මේවා මාර ධර්මයේ ශබ්දකෝෂයයි. ඔබ මෙතෙක් දේව භාෂිතයක් ලෙස රැක්කේ මාර ශබ්දකෝෂයේ අර්ථයයි. වනවාසී, නිවීමේ ප්‍රතිපදාව යනු ඉහත අර්ථයේ විරුද්ධාර්ථයයි. පින්වත් ඔබ එම අර්ථයට විරුද්ධව යන විට මාරයාගේ කිපීම සාධාරණය. එහෙත් මාරයා කිපෙන්නේ මනුෂ්‍යයා කිපෙන ආකාරයට නොවේ. උපක්‍රමශීලීවය. මාරයා වැඩිපුර සිනාසෙන්නේ වැඩිපුර කිපුන වෙලාවටය. මෙය හඳුනා ගැනීමට දුෂ්කර, අති භයානක චරිත ස්වභාවයකි. මෙහිදී ඔබ දුකද සැපද, තැනද නොතැනද, මෛත්‍රියද වෛරයද පටලවා ගනී. අර්ථයන් වෙනස්ව දකියි. පින්වත් ස්වාමීන් වහන්සේ සැතපෙන කොට්ටය යටට වැඩිය ධාතූන් වහන්සේලාද, චෛත්‍ය කර්මාන්තයද, සෙලියුලර් දුරකථනයද හුදෙකලාව වැඩ සිටි වනවාසී ස්වාමීන් වහන්සේට මාරයා ලබා දුන් භව තෑගිය. මෙම භව තෑගි පාර්සල් එපා නොකියා ලබාගැනීම මාර ධර්මයේ ස්වභාවයයි. එපා කීමට ඔබට සිත නොදෙන්නේ මේවා පාර්සල් කර ඇති විසිතුරු දවටනයන් නිසාමය. දවටනය නිර්මාණය කරන්නේ

මාර දූ වරුන්ය. තණ්හා, රතී, රඟා සුරූපී යුවතියන් තිදෙනාගේ ඇස් කොණින් ප්‍රකාශ වන කාමයේ, රූපයේ, ආශ්වාදයේ වින්දනයට ඔබ මුළා වනවා ඇත. මෙම තණ්හා, රතී, රඟා මාර දූ වරුන් තිදෙනා වරෙක උපාසිකාවන් සේද, වරෙක නිළියන් සේද, වරෙක නාටිකාංගනාවන් සේද, තවත් වරෙක රෝගියෙක්, මිනිස් දුවක් ලෙසද ඔබ ඉදිරියට එනු ඇත. මේ චරිතයන් එම දූ වරුන්ගේ ලැජ්ජා නැති කමය. තණ්හාවට, රාගයට, රතියට ලැජ්ජාවක් නැති බව ඔබද හොඳින්ම දන්නා කරුණකි. ඔබ රූපය අවබෝධ කරගන්නා තාක්කල් මාර දූ වරුන්ගේ ග්‍රහණයෙන් ඔබට මිදීමට නොහැකිය. යම් මොහොතක පින්වත් ඔබ රූපය අවබෝධ කරගතහොත් මාර දූවරුන්ට සිදු වන්නේ ඔබ ඉදිරියෙන් පලා යෑමට පමණක්මය.

ඉහත අපවත් වූ පින්වත් ස්වාමීන් වහන්සේටද පසුකාලීනව සෙලියුලර් දුරකථනයක් පරිහරණයට ගැනීමට තරම් පරිසරයක් නිර්මාණය කළේ ඉහත මාර ධර්මයන්මය. එහෙත් උන්වහන්සේ තම ජීවිතය තුළින් ආරක්ෂා කරගත් සීලයද තණ්හාව, මාන්නය විසින් ග්‍රහණයට ගන්නා ලද ස්වභාවයක් දක්නට තිබිණි. එහෙත් උන්වහන්සේගේ පරලොව සැපය සඳහා එම සීලය කල්‍යාණ මිත්‍රයෙක් සේ උපකාර කළේ යැයි භික්ෂුව විශ්වාස කරයි.

මේ කථා පුවත මෙහි සටහන් කළේ පින්වත් ගිහි පැවිදි ඔබට, සීලයේ අගය, සීලයේ සෘද්ධිමත් භාවය පැහැදිලිකර පෙන්වීමටය. සීලය සෘද්ධියක් වන්නේ එය ඔබව ලෞකික සැපයේ ඉහළටම ඔසවා තබන බැවිනි. ඔබත් සශ්‍රීක දිව්‍ය තලයක දඹරන් කැටයමින් කළ සුන්දර දෙව්යෙක් වීමට ජීවිතය තුළින් උතුම් සීලයක් ආරක්ෂා කරගන්න. ආර්යකාන්ත සීලයක් ලෙස එය ආරක්ෂා කරගන්න. සතර අපායෙන් මිදී ඔබ කැමති කාලයකදී නිවී සැනසී යන්න.

මේ කථාවේ සඳහන් එම සද්දන්ත ප්‍රේතයාට තද කළු පැහැති ශරීර වර්ණයක් ලැබී තිබුණේ කුරිරු අලි ප්‍රහාරයේදී ඇති වූ

දැඩි ක්‍රෝධය නිසාම විය යුතුය. දිව්‍ය ස්වභාවයේදී එම දෙවියාට දඹරන් පැහැය ලැබුණේ යටපත් වී තිබූ සීලයේ ආනිසංස නිසාම විය යුතුය. ක්‍රෝධයේ කළු පැහැයත්, සීලයේ දඹරන් පැහැයත් පින්වත් ඔබට කියාදෙන පාඩම අති විශිෂ්ටය.

මේ කථා පුවත කියවා ඔබද ඔබ කැමති වර්ණය තෝරා ගන්න. ඊට අනුරූපීව ජීවිතය ක්‍රියාත්මක කරන්න. ඔබ තුළ නිරතුරුවම රාග, ද්වේෂ, මෝහ වැඩෙන්නේ නම් ඒ තුළින් වැඩෙන්නේ ප්‍රේතානුස්සතියයි. ඔබ තුළින් දානය, සීලය, මෛත්‍රිය නිරතුරුවම වැඩෙන්නේ නම් ඒ තුළින් වැඩෙන්නේ දේවානුස්සතියයි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළ එම ධර්මය ඉහත ස්වාමීන් වහන්සේ අපවත් වීමෙන් පසු ලැබූ ජීවිත දෙකෙන් ඉතා නිවැරදිව අත්දැකීමට ඔබට හැකිය. එහෙයින් තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුතුව ලොව්තුරා බුදු සමිඳුන් දේශනා කර වදාළ සත්පුරුෂ ධර්මයන් ජීවිතය තුළින් වැඩීමට උත්සාහ ගන්න. වර්තමාන සමාජය තුළ පවතින දැඩි තරගකාරීත්වය, සංකීර්ණ බව නිසා අනපේක්ෂිත ආකාරයෙන් ඔබ මිය ගියද, ජීවිතය තුළදී ඔබ රැස් කරගත් දාන, සීල, භාවනා වල ශක්තිය, පින, කුසලය කුමන අභියෝගයක් හමුවේ වුවද ඔබට සසර පිහිටට පැමිණෙන බව, ඔබව අතහැර නොයන බව මේ සිද්ධියෙන් පැහැදිලි වනු ඇත. භව ගමන නිමාකර ගන්නා තුරු ඔබට සසර පිහිටට සිටින එකම කල්‍යාණ මිතුරා තෙරුවන් සරණ විනා අන් කුමන සරණක්ද? පිහිටක්ද?

තෙරුවන් සරණ නැමැති පුණ්‍ය කෙතේ ඔබ දානය, සීලය, මෛත්‍රියේ බීජයන් අඩු වැඩි බවකින් තොරව වපුරා ගතහොත් එහි නියත සශ්‍රික අස්වැන්න ආයුෂ, වර්ණ, සැපය, බලය වනු ඇත. ඉහත කරුණු පැහැදිලි කරගෙන ඔබ ප්‍රඥාව වඩවා ගත යුතුය. ලොව්තුරු බුදුරජාණන් වහන්සේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, දානය, සීලය, මෛත්‍රීය නිරතුරුවම ජීවිතය තුළින් වඩන්න කියලයි දේශනා කර වදාළේ, ඉහත ධර්මතාවයන් ඔබට සතර අපායෙන් මිදීම සාක්ෂාත් කරදෙන ධර්මතාවයන් නිසාය.

මුලින්ම ඔබ සතර අපායෙන් මිදෙන්න. ඒ සඳහා ඉහත ධර්මයන් ඔබේ ජීවිතයේ හවුල්කරුවා කරගන්න. කොටස්කරුවෙක් කරගන්න. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, දානය, සීලය, මෛත්‍රිය ජීවිතය තුළින් වඩන විට පින්වත් ගිහි පැවිදි ඔබ විශේෂයෙන් අවධානයෙන් ඉන්න ඕනේ, මාර ධර්මයන් පිළිබඳව. තණ්හාව, මාන්නය, දිට්ඨිය සෑම විටම ඔබේ මේ පිරිසිදු ක්‍රියාවන් අපවිත්‍ර කරනවා. ඒවායේ ශක්තිය හීන කරනවා.

සක්කාය දිට්ඨිය නැමැති මමත්වයේ දැඩිභාවය මාර දූවරුන් ඔබට පලන්ඳන කටු ඔටුන්නක්. ඔබ මහත් උජාරුවෙන් එම කටු ඔටුන්න පැළඳගෙන තමාවත් තමාටම අයිති නැති, නිරතුරුවම අනිත්‍ය භාවයට යන ලෝකයක රජ කම් කරනවා. ඉහත සඳහන් කළ අලි ප්‍රහාරයෙන් අපවත් වූ පින්වත් ස්වාමීන් වහන්සේ අපවත් වීමෙන් අනතුරුව සද්දන්ත ප්‍රේත උපතකට වැටෙන්නේ උන්වහන්සේ සතර අපායෙන් නොමිදී සිටි නිසායි. දැඩි ලෙස සීලයක් ආරක්ෂා කරගෙන ජීවත් වුවත් සතර අපායෙන් මිදීමේ මග හරස් කළේ තණ්හාව, මාන්නය, දිට්ඨිය නැමැති මාර සමීකරණයට උන්වහන්සේ නොදැනුවත් භාවයෙන් එකඟවී සිටි නිසාම යැයි භික්ෂුව අනුමාන කරයි. එහෙත් පින්වත් ඔබ සීල, සමාධි, ප්‍රඥා මාර්ගයේ ඉදිරියට ගියද, දාන සීල භාවනා මාර්ගයේ ඉදිරියට ගියද ඔබ වෙහෙස වී ලබාගන්නා එහි ප්‍රතිඵලයන් කිලිටි කරන, හීන කරන, තණ්හාව, මාන්නය, දිට්ඨියේ සතර අපායගාමී දූකටම අයිති පාප මිතුරන් ඔබ ඔබේ කල්‍යාණ මිතුරන් කර නොගන්න. ඔබේ ජීවිතය තුළ ඔබ ඔවුනට අවස්ථාවක් නොදෙන්න. එවැනි සිතක් මතු වූ සැනින් එම සිත ඔබේ නොවේ යැයි අතහැර දමන්න. එම සිත දූකට අයිති බව සිතන්න. සතර අපායට අයිති බව සිතන්න. පාප මිතුරන්ට ඔබේ ගෘහයේ නවාතැන් නොදෙන්න.

# කළණ මිතුරුබවේ අගය නිමක් නොවේ

මේ සටහන ලියන මොහොතේ භික්ෂුව වැඩ සිටින්නේ අගනුවරට ආසන්නව පිහිටි ආරණ්‍යයක. මේ ආරණ්‍ය බිමේ වඳුරන් 15 ක පමණ රංචුවක් සිටිනවා. සවස ඇඳිරි වැටීගෙන එනවිට භික්ෂුව දුටුවා, මේ වඳුරු රැළ රාත්‍රිය ගතකිරීම සඳහා තෝරාගෙන තිබුණේ, භික්ෂුව වැඩ සිටින කුටියට ඉහළින් තිබෙන විශාල ගස් කිහිපය. සවස ඇඳිරි වැටීගෙන එන විටත්, මේ සතුන් කොළ කමින් හැසිරෙන ශබ්දය ඇසුණා. දැන් රාත්‍රී 8 පමණ වෙලා. පැය දෙකක පමණ කාලයක සිට හොඳටම වහිනවා. තද සුළඟත් සමග විදුලි කොටනවා. අහස වේගයෙන් ගොරවනවා. මේ සියලු සිදුවීම් සිදු වුවත්, ගසේ වඳුරන් සිටින බවක්වත් ඇසෙන්නට නැහැ. ඒ තරමටම මේ සිදුවීම් හමුවේ වඳුරන් නිහඬයි. පුංචි පැටව් බඩේ එල්ලා ගත් වඳුරු අම්මලා මේ රංචුවේ සිටියා. සීතල නිසා, ගෙරවිල්ල නිසා පුංචි පැටවෙක්වත් කෑගසන්නේ නැහැ. මේ සතුන් සතුටින් මේ දුක විඳිනවා වගෙයි. මනුෂ්‍ය දරුවෙක්, වැඩිහිටියෙක් මේ වහින වැස්සට, සීතලට, විදුලි කෙටිල්ලට හසු වුනොත් මොන තරම් එයට එරෙහිව ප්‍රතික්‍රියා දක්වයිද? ඒත් ඒ සතුනට ඒ දුක ගැන කිසිම හැඟීමක් නැහැ. ප්‍රතිචාරයක් නැහැ.

ඒ තරමටම මේ තිරිසන් සතුන්ට දුක පත්තියන් වෙලා.

දීර්ඝ කාලයක් සතර අපායේ ඉඳලා, ඒ සතුන්ට දුක හුරුයි. දුක සැපෙන් භාර ගන්නවා. මේ තරම් ගොරවමින්, විදුලි කොටමින්,

සුළඟ හමමින් වැසි වසින විටත් දුකක් නොදැනෙන මේ සතුනට සංසාරය කොතෙක් දුර වෙයිද?

ඒ සතුන් දුක කියන වචනයේ සැබෑ අර්ථය දන්නේ නැහැ. ඒ නිසාම කල්ප ගණනාවක් ගියද මේ සතුනට සුගතියේ සැප ඇති දිව්‍ය, මනුෂ්‍ය උපතක් සිදුවන්නේ නැහැ. නමුත් මනුෂ්‍ය දරුවෙක්ට මේ ස්වභාවය නැහැ. වැස්සකදී, සීතලකදී ක්ෂණිකව ප්‍රතිචාර දක්වනවා. ඒ අයට දුක දැනෙනවා. එහෙම දැනෙන්නේ දුක පිළිබඳව හැඟීමක් ඇති නිසා. මේ තිරිසන් සත්ත්ව ජීවිතත්, ඔබගේ උතුම් මනුෂ්‍ය ජීවිතයත් සංසන්දනය කරලා බලන්න. මනුෂ්‍යයා දුක හඳුනා ගැනීමේ, අවබෝධ කර ගැනීමේ හැකියාව අතින් මොන තරම් ඉදිරියෙන්ද සිටින්නේ කියලා. සසර දුක ගැන වැටහීමක් ඇති කරගත් නිසාමයි ඔබට මේ පුණ්‍යවන්ත මනුෂ්‍ය ජීවිත ලැබිලා තිබෙන්නේ. නමුත් හැම මනුෂ්‍යයාටමත් මේ හැකියාව ලැබී නොමැති බව අපි අත්දැකීම් තුළින්ම තේරුම් ගන්න ඕනේ. දිනක් භික්ෂුව හමුවට බොහොම සැපට හැදුණු, සුරතල් ලොකු තරුණ ඇල්සේෂන් බල්ලෙක් සමග පැමිණි නෝනා කෙනෙක් මෙහෙම ප්‍රශ්නයක් ඇසුවා. 'හාමුදුරුවනේ මට ප්‍රශ්නයක් තිබෙනවා, ඔබ වහන්සේගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා' කියලා. භික්ෂුව සිතුවා ධර්මය ගැන ප්‍රශ්නයක් වෙන්න ඇතිය කියලා. 'හාමුදුරුවනේ මේ මගේ සුරතල් බල්ලා ඊළඟ ආත්මයේදී මගේ දරුවෙක් කරගන්න මට ඕනේ. ඒක කරගන්නේ කොහොමද?' ප්‍රශ්නය ඇය ඇසුවේ කිසිම චකිතයකින් තොරවයි. ඇයට දිය යුතු එකම පිළිතුර නම් 'ලබන ආත්මයේ මේ බල්ලා ඔබේ දරුවෙක් කරගන්න ඉඩක් නැහැ. හැබැයි ඊළඟ උපතේදී ඔබ සුනඛයකුගේ කුසේ බැල්ලි පැටවෙක්ව ඉපදෙන්න හොඳටම ඉඩ තිබෙනවා. මේ සුනඛ සංඥාව ඔබ සිතින් ඉවත් කර නොගත්තොත්.....' කියලා.

බලන්න මේ බුද්ධෝත්පාද කාලයකදී ලැබූ මනුෂ්‍ය ජීවිතයත්, තිරිසන් යෝනියේ උපත ලද සතෙකුත් අතර තිබෙන පරතරය දකින්න දක්ෂ නැහැ. ඇය සමාජයේ ඉහළ තලයේ

සමාජ තත්ත්වයක් හිමි කාන්තාවක්. තමා සසර කළ මහා පුණ්‍ය ශක්තියකින් ලබා ගත් මේ මිනිසත් බව දක්ෂ භාවයෙන් කළමනාකරණය කිරීමට ඇති නොහැකියාව නිසාමයි සත්ත්වයා සතර අපායට වැටෙන්නේ. මේ දක්ෂ භාවය මතුකර දෙන්නේ කල්‍යාණ මිත්‍ර ආශ්‍රය මගින්මයි. වර්තමාන සමාජයේ අලුත්ම විලාසිතාව තමයි සමහර පින්වතුන් කල්‍යාණ මිත්‍රයින් ලෙස ඇසුරු කරන්නේ තිරිසන් සතුන් වීම. මනුෂ්‍යයන්ට වඩා තිරිසන් සතුන් හොඳ යැයි කියා තිරිසන් යෝනියේ සතුන් කල්‍යාණ මිත්‍රයන් ලෙස ඇසුරු කිරීම.

කල්‍යාණ මිත්‍ර සතුන් ගැන කථා කිරීමේදී ගෙවල්වල ඇති කරන සුරතල් විසිතුරු මාළු ගැනද මතකය අවදි උනා. ඔක්සිජන් නල ක්‍රියාත්මක වන මාළු ටැංකි නිවාසවලට විලාසිතාවක් සේ එකතුවී තිබේ. සමහරවිට ගෙදර පිහිටි කෘත්‍රිම මැද මිදුලේ ඇති පොකුණේ මාළු ඇති කරයි. ගෙදර පින්වත් නෝනා මහත්මයා මාළු ටැංකිය ඉදිරිපිට හාන්සි පුටුව තබාගෙන විවේකය ගත කරන්නේ මාළුන්ගේ හැසිරීම් රටා දෙස බලමිනුයි. පින්වත් නෝනා මහත්වරු දවසේ වැඩි වේලාවක් මාළු ටැංකියේ චමත්කාරය නරඹයි. මෙය සමාජයේ පැතිරීගෙන යන අලුත් 'භාවනාවකි'. මේ භාවනාවට අපි 'මාළු ටැංකි භාවනාව' යැයි කියමු. මේ භාවනා කිරීම නිසා අධික රුධිර පීඩනය, මානසික ව්‍යාධීන් අඩුවන බව වෛද්‍ය මතයක් ලෙස ඔවුන් දක්වයි. එය ඔවුන් තරයේ විශ්වාස කරයි. ඒ නිසාම විවේක කාලයේ 'මාළු ටැංකි භාවනාව' කරයි. සැබැවින්ම මෙය භාවනාවකි. ඒ කියන්නේ වැඩීමකි. නමුත් වැඩෙන්නේ තිරිසන් සත්ත්ව සංඥාවයි. මාළුන් පිළිබඳ කැමැත්තයි. ඡන්ද රාගයයි. ඒ කියන්නේ ඔබ නොදැනුවත් භාවයෙන් වඩන්නේ සතර අපායයි. එහි මාළු බිත්තරයක ප්‍රතිසන්ධියයි. දහස් ගණනින් වියදම් කරලා, විසිතුරු මාළු සුරතලයට හදලා, රුධිර පීඩනය, මානසික ව්‍යාධීන් අඩු කරගන්න ගිහිල්ලා ඔබ වැටෙන්නා වූ අගාධයක ගැඹුර කොපමණක්ද? මේ පින්වත් නෝනා මහත්වරුන්, තමන්ට නිරෝගීභාවයට පාර පෙන්වන, කල්‍යාණ මිත්‍රයින් වශයෙන්

සලකන්නේ තිරිසන් යෝනියේ මාළුන්ය. එම කල්‍යාණ මිත්‍රයා තිරිසන් යෝනියට යෑමට ඔබට පාර කියා දෙනු නියතය. 'කල්‍යාණ මිත්‍රයා' යන්නෙහි අරුත පවා අප නිවැරදිව හඳුනාගත යුතුව ඇත. කල්‍යාණ මිත්‍රයා යනු කල්ප සිය ගණනක් ඔබට දුක් දෙන, සතර අපායෙන් ඔබව මුදා ගැනීමට මාර්ගය පහදා දෙන උත්තමයාය. ඔහු අවිද්‍යාවේ අඳුරෙන් ඔබව දුරස්කොට, ප්‍රඥාවේ ආලෝකය දෙසට යොමු කරයි. මෙවැනි කල්‍යාණ මිත්‍රයෙක් ඔබ සොයා ගැනීමට නම්, මුලින්ම ඔබ ඔබට කල්‍යාණ මිත්‍රයෙක් විය යුතුය. ඔබ ඔබට කල්‍යාණ මිත්‍රයෙකු වන්නේ බාහිර කල්‍යාණ මිත්‍රයකු ආශ්‍රය කිරීමට, සොයා ගැනීමට පෙරාතුව එවැනි සත්පුරුෂ කල්‍යාණ මිත්‍රයෙකු ඇසුරු කිරීම වළක්වන ඔබ තුළ ඇති මාන්නය පරාජය කර නිහතමානීකම ඇති කරගැනීම තුළින්ය. ඔබ තුළ ඇති අහංකාරකම, මාන්නය පරාජය නොකොට, ඔබ නිහතමානී නොවුන හොත් සත්පුරුෂ කල්‍යාණ මිත්‍රයින් සිය ගණනක් ඔබට මුණගැසුනද, ඔබ ඔබගේ මතවාද, දෘෂ්ටිවල පැටලී තව තව අකුසල් රැස්කර ගන්නවා විනා, යහපත කරා ධර්ම මාර්ගයේ ගමන් නොකරයි.

සැබෑ කල්‍යාණ මිත්‍රයා මතවාදයක, දෘෂ්ටියක එල්ලී ගත් අයකු නොවේ. ඔහු සම්මා සම්බුද්ධ ඥාණයෙන් අවබෝධ කර වදාළ ශ්‍රී සද්ධර්මය, එකම මාර්ගය කරගත්තෙක්. එය දෘෂ්ටි මතවාද නැති විවෘත ධර්මයකි. භික්ෂුවගේ භික්ෂු ජීවිතය තුළදී, මේ අහංකාරභාවය නිසා මොන තරම් ගිහි පැවිදි පිරිසක් අකුසල් කරගන්නවා දැකලා තිබෙනවාද. වචනයෙන් කියන්නට අකමැති අකුසල් කරගෙන තියෙනවාද. භික්ෂුව මේ මොහොතේ යම් අවබෝධාත්මක ස්වභාවයක සිටිනවා නම් එහි මුල්ම ගෞරවය හිමි වන්නේ භික්ෂුව තුළ ගොඩනගාගත් නිහතමානී කමටමයි. එම නිහතමානීකම භික්ෂුව ඇතිකර ගත්තේ සද්ධර්ම ශ්‍රවණය නිසාමයි. ඒ තුළින් වැඩුනු තෙරුවන් කෙරෙහි වූ ශ්‍රද්ධාව නිසාමයි. සංසාරිකව වැඩූ පුරුදු නිසාමයි. ඒ නිහතමානීකම භික්ෂුවට නොතිබුණා නම් භික්ෂුව තවමත් අසරණයෙකි.

මුලින්ම භික්ෂුව, භික්ෂුවට සත්පුරුෂයෙක් වුණා. දෙවනුව සත්පුරුෂ ආශ්‍රය සොයාගෙන ගියා. සාධු.. සාධු.. ඒ නිහතමානී භාවයට මාගේ නමස්කාරය වේවා..

තෙරුවන් නමස්කාරය කළාට අනතුරුව මා නමස්කාරය කරන්නේ ඒ නිහතමානී භාවයටමයි. නමුත් ඔබ අදක්ෂනම් සංසාරික පුරුදු හිඟ නම් මේ ප්‍රතිපදාව තුළ වැඩෙන්නේ අහංකාරකමමයි. මේ අවාසනාවන්ත භාවයෙන් ඔබ වහ වහා මිදිය යුතුයි.

# මේ බිහිසුණු සිර දඬුවමින් නිදහස් නොවුන හොත්..

භික්ෂුව ඉදිරියට පැමිණි එක් පින්වත් මහත්මයෙක්, තමා තුළ තෙරුවන් කෙරෙහි ඇති ශ්‍රද්ධාව ගැන විස්තරයක් ඉදිරිපත් කළා. 'හාමුදුරුවනේ මා තුළ ඇති ශ්‍රද්ධාව නිසා අලියෙක් ඉදිරියට වුණත් යන්න මට පුළුවන්' කියලා. තමා තුළ වඩවා ගත් ශ්‍රද්ධාව මමත්වය, මාන්නය තුළින් මොන තරම් අපවිත්‍රභාවයට පත් කරගෙන තිබෙනවාද?

මෙය මෝහ මූලික ශ්‍රද්ධාවකි. ඔබ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකරගන්නේ අලි ඉදිරියට යෑමට නොවේ. අලියා ඉදිරියට යන්නය කියලා අපව මෙහෙයවන සිත අනිත්‍ය වශයෙන් දැකීමට පුරුදු වීමටයි. අලි ඉදිරියට යෑමට නම් ඔබ කළ යුත්තේ සත්වෝද්‍යානයට ගොස් ඇත්ගොව්වකු වීමට අදාළ පාඨමාලාවක් හැදෑරීමයි. තෙරුවන් සරණ යන්නේ ධර්ම මාර්ගයේ ඉදිරියට යෑමටය. වීරයන් වීමට නොවේ. ඔබව වීරයෙක් කිරීමට හදන්නේ මාරයාමය. වීරත්වය ඔබට ආරෝපණය කර සක්කාය දිට්ඨිය පෝෂණය කිරීම මාර ධර්මයයි. භික්ෂුව එම පින්වත් මහත්මයාට කියා සිටියේ 'මහත්තයෝ, සිත නැවත ඔවැනි ප්‍රකාශයක් ප්‍රකාශ කරන්න හදනකොට, තමා තමාටම ටොක්කක් ඇනගන්න' කියායි. මෙය 'හරක් සිතක්' යැයි සිතන ලෙසයි. යම් හෙයකින් එම මහතා, එම මෝහ මූලික ශ්‍රද්ධාව දරාගෙන වල් අලියෙක් ඉදිරියට ගියා නම් එය ඔහුගේ විනාශය වීමටද ඉඩ තිබිණි. දැඩි වීර්යයෙන් ධර්ම මාර්ගයේ ඉදිරියටම යෑමට උත්සාහ කරන

පින්වතුන්ව, මාරයා එම ගමනින් ආපස්සට හරවන්නේ තණ්හාව, මාන්නය, දිට්ඨිය කියන ධර්මතාවයන් හරහාමය.

ඔබ මේ භව ගමනින් නිදහස් වෙනවාට මාරයා අකමැතිය. මේ බව ඔබ හොඳින් තේරුම්ගෙන තණ්හාව, මාන්නය, දිට්ඨිය කියන අසත්පුරුෂ ධර්මයන් පරාජයට පත් කළහොත්, ලෝකය නැමැති මාරයාගේ හිර ගෙදරින් නිදහස් වීමට ඔබට හැකිය. ඔබ ලබන එම නිදහස, ජීවිතාන්තය දක්වා ලැබූ සිර දඬුවමකින් නිදහස් වීමට වඩා ලක්ෂ වාරයක නිදහස් වීමකි. කල්ප සියක් කෝටි, ප්‍රකෝටි ගණනක සිට අතීතයේදී ගෙවන ලද, අනාගතයේදී ගෙවා දැමීමට නියමිත අති බිහිසුණු සිර දඬුවමකින් නිදහස් වීමක්ය.

විත්තිකරුවාත්, පැමිණිලිකරුවාත්, වැරදිකරුවාත්, විනිසුරුවරයාත්, ඔබම වූ ලොවක, නිදහස් වීම පසෙක තබා, බන්ධනාගාරගතව සිටීම සැපයක් කොට දකින, සිරකරුවකුගේ මනෝභාවයෙන් මිදීමට කාලයයි මේ. සම්මා සම්බුද්ධ මාර්ගයයි මේ. සිරකාර මනෝභාවය ඔබ තුළ ඇති කරන්නේ තන්හාව, මාන්නය, දිට්ඨිය විසින්මය. මමත්වයේ දැඩි භාවය නිසාමය. ඔබට රිදුම් දෙන මේ භව තුවාලය, සුවපත් කරගැනීම සඳහා වෙහෙසෙන සෑම මොහොතකම, සුවපත් වෙමින් යන තුවාලය මත මාරයා විසින් තණ්හාව, මාන්නය, දිට්ඨිය නැමැති ඉහත විෂබීජ තබයි. තුවාලයේ වේදනාව මතට, මාර දූවරුන්ගේ සියුමැලි ඇඟිලි තුඩුවලින් ලැබෙන පහස, සැපය නිසාම ඔබ ඒ විෂබීජයන්ට කැමතිය. ප්‍රියය. මේ පහස, සැපය අනිත්‍ය වශයෙන් දැකීමට අප ප්‍රමාද වෙන්නේ විදීමට ඇති ඡන්දරාගය නිසාමය. තුවලයත්, වේදනාවත් ඔබගේමය. ප්‍රශ්නය වන්නේ එය ඔඩු දුවවා ගන්නේ ඔබ විසින්ම වීමය. ඔඩු දිවීම යනු කුණුවීමයි. මේ කුණු වූ අධ්‍යාත්මය අයිති සතර අපායටය.

භික්ෂුව ඉහත සටහන සටහන් කළේ අදක්ෂ භාවය නිසා සතර අපායට වැටුණු මනුෂ්‍යයෙක් පිළිබඳ කරුණු සඳහන්

කරන්නටය. එක්තරා මහත්මයෙක් සිටියා, ඔහු දක්ෂ පිහිනුම් කරුවෙක්. නිරතුරුවම ගැඹුරු දියේ පිහිනන්න දක්ෂයි. ඔහු ගැන දන්න කිසිවෙක් සිතන්න නැතුව ඇති මොහු කවදාකවත් දියේ ගිලී මිය යයි කියලා. අපි නොසිතන දේවල්, හේතුඵල ධර්මයන් නිසාම සිදුවන ලෝකයේ මේ මහත්මයා මුහුදේ පිහිනීමට ගොස් ජලයේ ගිලී මිය යනවා. බලන්න ස්ථිර ශක්තිමත්භාවයෙන් ගන්නා වූ ලෝකය, 'මම' මොහොතින් බිඳී විසිර ගිය ස්වභාවය.

පිහිනුම් දක්ෂයෙක්ය කියන නොබිඳෙන විශ්වාසය, මොහොතකින් බිඳී ගියා. මොහුගේ කකුලේ කෙණ්ඩ පෙරළීම හේතුවෙන්. මොහු ගොඩාක් පින් දහම් කරගත්ත අයෙක් නොවෙයි. විනෝදශීලීව ජීවත් වූ අයෙක්. මේ මරණය සිදුවෙලා මාස 4 කට විතර පස්සේ මේ මියගිය මහත්මයා අරමුණු කොට සිටියදී භික්ෂුව ඉදිරියට පාවෙන ස්වභාවයේ මිනිස් රුවක් පැමිණියා. මේ සත්ත්වයාට තිබුණේ බොහෝම සියුම් කයක්. පොළොවෙන් මීටර 8 ක් පමණ උසිනුයි භික්ෂුව ඔහුව දැක්කේ. පාවෙන ස්වභාවයේ සත්ත්වයෙක්. මිනිස් රුවක්. හරියට භූත ස්වභාවයක් වගේ. මේ මිනිස් කයක් සහිත සියුම් සත්ත්වයාගේ මුහුණේ ස්වභාවය ඔබට විස්තර කරනවා. ඔබ මෙහෙම සිතන්න. ඔබ යමෙකුගේ බෙල්ල මිරිකනවා. එතකොට ඔහුගේ මූනේ ස්වභාවය ඔබට මතකද? ඇස් ලොකු වෙලා, උඩ ගිහිල්ලා, නළල රැළි වෙලා... මරණ බිය රැඳුණ මුහුණක් නේද ඔබ දකින්නේ. මෙන්න මේ ස්වභාවයේ මරණ බිය රැඳුණු, ඇස් ලොකු වී ගිය, නළල රැළිවැටුණු ස්වභාවයක් තමයි මේ භූත සත්ත්වයාට තිබුණේ. මොහු තුෂ්නිම්භූතව සිටියේ හරියට බිරාන්ත වෙලා වගේ. ඔබ එය මෙහෙම සිතන්නකෝ. මනුෂ්‍යයෙකුගේ හිසට පොල්ලකින් ගැසුවහොත් ඔහුට මොහොතක් යනතුරු සිතා ගන්න බැහැ නේද මොකක්ද වුණේ කියලා. මෙවැනි ස්වභාවයකුයි මේ භූත සත්ත්වයා තුළ දිස්වුණේ. විනාඩි 2 කින් පමණ එම භූත සත්ත්වයා දර්ශනයෙන් නොපෙනී ගියා.

භික්ෂුව සමාධියෙන් පසුවෙන විට දුටුව එම භූත සත්ත්වයා ගැන තබන පහත සටහන අනුමාන වශයෙනුයි ගලපා සටහන් කරන්නේ.

තමා තුළ තිබු පිහිනීමේ හැකියාව නිසා දියේ ගිලී මිය යන මොහොතේ මොහුට හිතා ගන්නවත් බැරි වෙලා තිබෙනවා තමාට මොකද වුණේ කියලා. තමාගේ හැකියාවන් ගැන නිත්‍යභාවයෙන්, ස්ථිරභාවයෙන් මමත්වයේ දැඩිභාවයෙන් ගන්න අයට එම හැකියාවන් වරදින විට පරදින විට විශාල තැතිගැනීමක් හට ගන්නවා. ජලය තුළ ජීවිතයත් මරණයත් අතර සටනක් කරන විට ශක්තිමත් කුසල් හෝ අකුසල් සිතක් පහළ වන අවස්ථා අඩුයි. මැරෙන මොහොතේ ශක්තිමත් කුසල්, අකුසල් චිත්තයක් සකස් නොවුන නිසා පාවෙන භූත ස්වභාවයේ සත්වයෙක් ලෙස තමන් මියගිය නිවස ආශ්‍රිතව ජීවත් වෙනවා. මෙය භවයේ උපතක්. මෙම සත්වයාට ආයතන හය පිහිටා තිබෙනවා. ඒවා බාහිර රූප සමග පස්සය වී පංච උපාදානස්කන්ධය සකස් වෙනවා. සමහරු මෙයට අන්තර්භවය කියල කියනවා. අන්තර්භවය බුදුදහම ප්‍රතික්ෂේප කරනවා. භවයේ උපතක් වන මෙම භූත ස්වභාවයේ සත්වයාට තමයි පාංශකූල පින්කම, සත් දවසේ පින්කම හුගාක් වටින්නේ. නිදාගෙන ඇහැරුණු දරුවෙකුගේ මුහුණට වතුර ටිකක් ඉහිනකොට දරුවා අවදිවෙනවා සේ පාංශකූල පින්කමේ හෝ සත් දවසේ පින්කමෙන් ශක්තිමත් චිත්තයක් සකස් කොටගෙන මොහු නැවත උපතකට යනවා.

# ආරක්ෂා වීමේ අරුත...

ඔබ මොන තරාතිරමක කෙනෙක් වුවත්, ඔබගේ ආරක්ෂාව උදෙසා ඔබ මොන තරම් උනන්දු වෙනවාද? අපිට මගතොට ගමන් කරන සමහර විටක පෙනෙනවා වේගයෙන් ධාවනය වන අධිවේගී වාහන. සන්නද්ධ භටයන්, නවීන අවි ආයුධ... මේසා විශාල ආරක්ෂක ක්‍රම උපයෝගී කරගෙන ආරක්ෂාව සොයන ස්වභාවය.

තම ආරක්ෂාව උදෙසා, දරුපවුලේ, ව්‍යාපාරයේ, තනතුරේ ආරක්ෂාව උදෙසා මනුෂ්‍යයා දෙවියන් සරණ යනවා. ග්‍රහ තාරකා, ජෝතිෂ්‍යය, මිථ්‍යාදෘෂ්ටික දේශකයන් සරණ යනවා. යමකින් පිහිටක් ලැබෙයි කියලා විශ්වාසයක් තිබෙනවා නම් මහා කලුගල් පර්වතයක් යටින් කෝටු කැබැල්ලක් ගහල හරි පිහිට බලාපොරොත්තු වෙනවා. මේ අංශයෙන් ඉතාමත් ප්‍රාථමික ඇදහිලි විශ්වාසයන් ඇතිව සමාජයේ සමහරු ක්‍රියා කරනවා. මේ ආරණ්‍යයේ පිහිටි කඳුගැටය මුදුනේ සිට ඈත පරිසරය දෙස රාත්‍රියේ බලන විට සිය ගණනාවක් විදුලි ආලෝක ඇසට පෙනෙනවා. ඈත කඳුගැට සිසාරා දැල්වෙන මේ සෑම ආලෝකයක්ම දැල්වූ මිනිසුන් සොයන්නේ ආරක්ෂාවයි. සත්ත්වයා කාමයට ඇති කැමැත්ත නිසා එය අත්විඳීමට ජීවත් වීම සඳහායි ආරක්ෂාව සොයන්නේ. වැඩි කලක් ජීවත් වෙන්න, වැඩිපුර ඇසට, කනට, නාසයට, දිවට, මනසට, කයට ආහාර ආශ්වාදය අයිති කර දෙන්න.

මේ සැවොම ආරක්ෂා වෙන්නේ 'මම' පෝෂණය කිරීම සඳහාය. අනිත්‍යභාවයට පත්වෙන දෙයක් ආරක්ෂා කිරීමට

අපි ගන්නා වූ වෙහෙස නිසා කවදා හරි දිනක අප දුකට පත් වෙනවා. අප පාරක තොටක ගමන් කිරීමේදී ජේනවා පින්වත් ඔබ යන වේගය. මේ වේගයේ තරමටම තමන්ගේ ජීවිතය තුළ බලපවත්වන තෘෂ්ණාවද වේගවත්. ඇසට, කනට, නාසයට, දිවට, කයට, මනසට ආශ්වාදය අයිති කර ගැනීමේ ස්වභාවය මනින මිනුම් දණ්ඩ තමයි මේ වේගය. ඒ නිසා ඔබ වේගවත් නම් ඔබට බොරු කරන්න බැහැ. ඔබ ගොඩාක් දේවල් රැක ගන්න, ලබා ගන්න, අයිති කර ගන්න යන කෙනෙක්මයි. මේ වේගය පින්වත් ඔබට පුදුම ආශ්වාදයක් දනවනවා. 'අනික් අයට වඩා මම ඉහළින්' කියලා දැනෙනවා. මේ සැප තව තව විඳින්න, තව තව ඉහළට යන්න, තව තව ආරක්ෂා වෙන්න අවශ්‍යයි කියලා දැනෙනවා. මෙවැනි අදහස්වලින් ඔබ මත් වෙලයි ඉන්නේ. ආශ්වාදයේ සතුට මිස කාමයේ ආදීනවයන් ගැන හිතන්න ඔබලාට විවේකයක් නැහැ. මෙය මනුෂ්‍ය ස්වභාවයයි. මෙම මනුෂ්‍ය ස්වභාවය තුන් කාලයටම පොදුයි. ඒ නිසා ඉහත ස්වභාවයන් වෙනස් කරන්න සමතෙක් නැහැ. ඔබ නායකයෙක්, පාලකයෙක්, විධායකයෙක් වෙන්නේ, පෙර සංසාරිකව රැස් කළ පින් නිසාමයි. ඔබ පින නිසා ඔය තැනට පත් වුවත්, පිනෙන් ලැබූ ජීවිතය, එහි සශ්‍රික භාවය ඔබව විනාශය කරා රැගෙන යන්න පුළුවන්. ඉන් මිදෙන්න නම් ධර්මානුකූල ජීවිතයකට ඔබ යොමු වෙන්න වෙනවා.

ධර්මානුකූල ජීවිතයක් සඳහා පින්වත් ඔබ වගකීම්, ව්‍යාපාර, තනතුරු, අතහැරිය යුතු නැහැ. තමාට පැවරෙන වගකීම් නිවැරදිව ඉටු කරමින් තමා මෙලොව පරලොව දෙකෙහිදීම ආරක්ෂා වෙන්නේ කෙසේද කියලා සිතීම වැදගත් වෙනවා. එයට ඉතා ප්‍රත්‍යක්ෂ මාර්ගය ලොව්තුරා බුදු සමිඳුන් දේශනා කර තිබෙනවා. යමෙක් තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව, සීලය, දන් දීම, මෛත්‍රීය තම ජීවිතය තුළින් වැඩුවහොත් එයට වඩා ආරක්ෂාවක් මෙලොව, පරලොව වශයෙන් නැහැය කියලා. ඔබ නිරතුරුවම පළවෙනියා වීමට අයුතු ආකාරයෙන් උත්සාහ නොගන්න. නිරතුරුවම ජයග්‍රාහකයෙක් වීමට උත්සාහ ගන්න.

එවිට ඔබ අතින් වන අකුසල් අඩු වෙනවා. ඔබ ධර්මය විශ්වාස කොට අවිචාරයෙන් පළවෙනියා වීමට උත්සාහ නොකොට, ජයග්‍රාහකයෙක් පමණක් වීමට උත්සාහ කළොත් කවදාහරි දවසක ධර්මය විසින් ඔබව පළවෙනි තැනට ඔසවා තබනවාමය. ඔබට ඒ තැන හිමි නම්, මේ ආකාරයෙන් ඔබ හික්මීමට නම්, අර්ථවත් ලෙස තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් යුක්ත විය යුතුය. සීලය, දන්දීම, මෛත්‍රිය ඔබ ජීවිතය තුළින් වැඩිය යුතුය. එවිට ඔබට එම ධර්මතාවයන් ඔබේ ආරක්ෂාව පිණිස හොඳම සහකරුවා කර ගැනීමට ඔබ දක්ෂ වනු ඇත.

ඔබ කවුරුන් වුවද, යම් තැනකදී ඔබ ආරක්ෂා වූවා නම්, අනතුරකින් බේරුණා නම්, ඒ ඔබ ආරක්ෂා වූයේ ඔබ වැඩූ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, දාන, සීල, මෛත්‍රියේ ශක්තිය නිසාමය. නමුත් ඔබ සිතන්නේ ඔබ ආරක්ෂා වූයේ, අනතුරින් බේරුණේ තමාට යොදා සිටින ආරක්ෂක විධිවිධාන, එසේත් නැතිනම් වෙනත් බාහිර හේතුවක් නිසාය කියලා, එය සත්‍යයක් නොවේ. ඔබ දැකලා තිබෙනවා, අහලා තිබෙනවා විශාල ආරක්ෂක වළලු දමාගෙන සිටියත් එක මොහොතකින් බෝම්බ කරුවෙක් මේ සියල්ල විනාශ කරගෙන තමනුත් විනාශ වෙනවා. ඒ කියන්නේ මොන තරම් ආරක්ෂක පවුරු තිබුණද ප්‍රහාරකයා උපක්‍රමශීලී නම්, මරාගෙන මැරෙන අයෙක් නම් ආරක්ෂක උපක්‍රම අසාර්ථක බවයි.

කෝටි ගණන් මුදල් වියදම්කර කරන ආරක්ෂක ක්‍රම අසාර්ථක නම්, අපි බලමු ලොව සාර්ථකම ආරක්ෂාව ලබන්නේ කොහොමද කියලා. ඒ සඳහා ඔබ ඔබ තුළින් අවංකවම තෙරුවන් කෙරෙහි විශ්වාසය තබමින් දානය, සීලය, මෛත්‍රිය ජීවිතයට පුරුදු කර ගන්න වෙනවා. ඔබ නිරතුරුවම දන් දෙන කෙනෙක් නම්, සීලයක පිහිටා එම සීලය ආරක්ෂා කරන අයෙක් නම් සත්ත්වයා කෙරෙහි මෙත් වඩන අයෙක් නම්, ඔබේ ආරක්ෂාව ගැන ඔබ බිය වෙන්න අවශ්‍ය නැහැ. හැබැයි ඉතින් සංසාරිකව යම් අකුසල කර්මයක් විපාක දෙන්න තිබෙනවා නම්, ඔබට එයට මුහුණ

දෙන්න වෙනවා. ඔබ දක්ෂ නම් එතැනදීත් ඔබට විපාකයන්ගේ ස්වභාවය හීන කිරීමට සමහරවිට අවස්ථාව තිබෙනවා.

දැන් අපි බලමු දන්දීම, සීලය, මෛත්‍රිය වඩන කෙනා ඒ තුළින් ආරක්ෂාව ලබන්නේ කොහොමද කියලා. ඔබ එය මේ විදිහට ගලපා ගන්න අවශ්‍යයි. ඔබ දන්දෙනවා නම්, සීලයක් ආරක්ෂා කර ගන්නවා නම්, මෛත්‍රිය වඩනවා නම් නිරතුරුවම ඔබ කරන මේ පින්කම් දෙස සම්‍යක්දෘෂ්ටික දෙවියන්, සම්‍යක්දෘෂ්ටික යක්ෂයන් බලාගෙන සිටිනවා. ඒ අය ඔබ කරන පින්කම් දැකලා සතුටු වෙනවා. එම පින් අනුමෝදන් වෙනවා. දිනපතා නැවත නැවත මෙය සිදුවන කොට ඉහත දිව්‍ය බලවේග, විශේෂයෙන්ම සම්‍යක්දෘෂ්ටික යක්ෂ බලවේග පින් අනුමෝදන්ව තම ශක්තියද වර්ධනය කරගන්නවා. සම්‍යක්දෘෂ්ටික යක්ෂ බලවේග යනු පෙර ජීවිතවල රට ජාතිය ආගම උපාදානය කරගෙන මියගොස්, රට ජාතිය ආගම රැකීමට උපකාරී වන මනෝ භාවයන් දරාගත් ස්වභාවයේ යක්ෂ කොට්ඨාසයකි. මේ අය පෙර ජීවිතවලදී රට, ජාතිය, ආගම උදෙසා දිවි දෙවැනිකොට කැපවුණ, සටන් කළ ගිහි පැවිදි මනුෂ්‍යයන්. මේ අයද ඔබට ප්‍රිය වෙති. ඔවුන් ඔබට ප්‍රිය වන්නේ ඔබ තෙරුවන් සරණ ගිය, දාන සීල භාවනා මාර්ගය වඩන අයෙකු නිසාය. ඔබට නොපෙනුනාට දැන් මේ බලවේග නිරතුරුවම ඔබ පසුපසින් ගමන් කරයි. ඔබ නිවසේ සිටියද, කාර්යාලයේ සිටියද, වාහනයක ගමන් කළද, යුද බිමක සිටියද මේ බලවේග ඔබ වටා ඔබට නොපෙනෙන්නට සිටියි. ඔබත් සමග ගමන් කරයි. අවදානම් අවස්ථාවකදී මැදිහත්ව ඔබව අනතුරුවලින් ගලවා ගනියි. මේ බලවේග, ඔබ වාහනයක ගමන් කරද්දී එම වාහනය තුළ ගමන් කරයි. බෝම්බකරුවෙක් වාහනයට පැන්නහොත් ඔහුගේ ඉලක්කය වරද්දයි. ඉලක්කය වරදවන පරිදි ඔහුව ඉක්මන් කරවයි. එක්කෝ ප්‍රමාද කරවයි. ඔබ නොදන්නවාට මෙම බලවේග සතුරාට ඉලක්කය වැරැද්දීමට ඔබගේ වාහනයේ ඇක්සලේටරයට බර දී වේගය වැඩි කරවයි. අනතුරින් ඔබ ගැලවෙයි. එහෙත් ආරක්ෂාවට සිටි අය, එසේත්

නැතිනම් මහමග සිටි අය අනතුරට පත්වේ. සම්‍යදෘෂ්ටික දිව්‍ය යක්ෂ බලවේග මෙලෙස ඔබව ආරක්ෂා කරයි. මේ ආරක්ෂාව ඔබට ලැබුණේ ඔබ තෙරුවන් සරණ ගිය, දාන සීල භාවනා මාර්ගය වඩන අයකු නිසාය. ඔබව ආරක්ෂා කළේ පිනට කැමති, පින් කරන අයට කැමැති රට, ජාතිය, ආගම උපාදානය කරගත් සම්‍යක්දෘෂ්ටික දිව්‍ය, යක්ෂ බලවේගය. ඒ නිසා ඔබත් රට, ජාතිය, ආගම උදෙසා ජීවිතය කැප කරන කෙනෙක් නම්, ලෝකයේ ඇති සැබෑම ආරක්ෂක ක්‍රමයෙන් ආරක්ෂා වෙන්න දක්ෂ වෙන්න. මේ ආරක්ෂක ක්‍රමයේ ඇති සුවිශේෂී ලක්ෂණය වන්නේ මින් ආරක්ෂාවන්නේ ඔබගේ මෙලොව ජීවිතය පමණක් නොව පරලොව ජීවිතයද ඉන් ආරක්ෂා වන නිසාය. මරණින් මතුව සතර අපාය නමැති අණක් ගුණක් නොමැති ත්‍රස්තවාදයෙන්ද ඔබව ආරක්ෂා කර ගැනීමට ඉහත ප්‍රතිපදාව හේතු වනු ඇත.

ඒ නිසා රට ජාතිය ආගම නාමයෙන් ඇසට, කනට, නාසයට, දිවට, කයට, මනසට ආහාර හොයන පින්වත් ඔබ රට ජාතියේ නාමයෙන් සැබෑ ලෙසම ධර්මයේ හික්මෙන්න. ධර්මය ඔබේ සැබෑ ආරක්ෂකයා බව හොඳින් සිහියේ තබාගන්න. සැබැවින්ම ඔබ තෙරුවන් සරණ ගිය අයෙක් නම්, රට ජාතිය සුරකින අයෙක් නම් මෙලොව සේම පරලොවද ජය ගැනීම ඔබගේ අරමුණ විය යුතුය.

# උතුරේ ත්‍රස්තවාදයට වඩා භයානක ත්‍රස්තවාදයක් ඔබ ඉදිරියේ ඇත

තාවකාලිකව රට තුළ පැවති ත්‍රස්තවාදය පරාජය කිරීම හේතුවෙන් රට පුරා එල්ලා තිබූ බැනර්, තොරණ, පෝස්ටර්, දැන්වීම්, පිදූ ගෞරව සම්මාන, පැවත්වූ ආචාර, ඇතිවූ සෝෂාව, පුපුරා ගිය රතිඤ්ඤා හඬ දෙස බැලීමේදී වසර 30 ක් තරම් කාලයක් සමස්ත ජනතාව පීඩාවට පත්කළ ත්‍රස්තවාදය පරාජයට පත් කිරීම හේතුවෙන් ජනතාව මෙපමණ සතුටක් ලැබුවා නම්, ඔබට කල්ප ගණන් දුක, වේදනාව, ම්ලේච්ඡත්වය, අවිචාරය, ගින්දර, ලෝදිය සමග දුක් විඳීමට සැලැස්වූ අතීතයේ ඔබ විඳි සතර අපායේ ත්‍රස්තවාදය ඔබ පරාජය කළහොත් මොන තරම් සතුටක් ලබයිද?

වසර 30 ක පමණ කාලයක් පමණක් ඔබ විඳි මරණ බිය නැති වීම හේතුවෙන් මේ තරම් සතුටු වෙනවා නම්, යුද්ධයේ දුක මේ තරම් කටුක ලෙස දැනී තිබුණා නම් ඒ සැබවින්ම ඔබ සතර අපායේ ඇති දුක ගැන නොදන්නා නිසාමයි.

උතුරේ යුද්ධයෙන් දිනන්න තරම්වත් උත්සාහයක් සතර අපායෙන් මිදීම සඳහා නොගන්නේ රටත්, ජාතියත්, සම්බුද්ධ ශාසනයත් ඔබේ ග්‍රහණයේ තබා ගත නොහැකි දෙයක් බව නොදන්නා නිසාමයි. ඔබවත් ඔබේ පාලනයේ තබා ගත නොහැකිය. යුද්ධයක ජය පරාජය හැමදාම නිත්‍යභාවයේ තබා ගත හැකි දෙයක්ද? නොවේමය. මනුෂ්‍යයා තුළින්ම අවුළුවා ගන්නා යුද ගිනි මනුෂ්‍යයා විසින්ම නිවා දමයි. නිෂ්පාදකයාත්

එම නිෂ්පාදනයෙන් දුකට පත්වන්නාත්, විනාශ කරගන්නාත්, නිවා දමන්නාත් මනුෂ්‍යයාමය. මේවා උදෙසා ඔබලා රැස් කරගන්නා අකුසල් ඔබ පසුපසින් සෙවණැල්ලක් සේ විපාක දෙමින් පැමිණෙනවාමය. යුද බිමකදී ඔබට යම් අනතුරක් සිදු වුනොත් ඔබගේ උපකාරයට රජයක් ඇත, වෛද්‍ය සේවා ඇත, නොයෙක් සමාජ සේවා ආයතන ඇත. එහෙත් සතර අපායට වැටෙන සත්ත්වයාට ඒ දුක වේදනාව, කුසගින්න විඳීමට සිදු වන්නේ තනිවමය. කඳුළු පිස දැමීමට, ලේ පිස දැමීමට, බෙහෙත් දැමීමට, සුවදුක් විචාරීමට සතර අපායේ සත්ත්වයාට කිසිවෙක් නොමැත. හේ තනිවම අපා දුක් විඳිය යුතුය.

මනුෂ්‍ය ලෝකයේ ත්‍රස්තවාදයට වඩා සතර අපායේ ත්‍රස්තවාදය අති බිහිසුණුය, තියුණුය, අති දීර්ඝය. ඔබ සැබෑ ජයග්‍රාහකයෙක් වන්නේ අනාගතයේ යම් දිනයක නැවත ඇති වන යුද්ධයක් ජය ගැනීමෙන් නොව නිරතුරුවම ඔබට අත වනන සතර අපායේ යුද්ධයෙන් ඔබ ජයගතහොත් පමණක්මය.

මනුෂ්‍යයා යුද්ධය කරද්දී, මාරයා සාමයට අත වනයි. මනුෂ්‍යයා සාමය උදාකර ගනිද්දී, මාරයා යුද්ධයට අත වනයි. යුද්ධයත් සාමයත් දෙකම මාරයාගේය. මේ දෙක අතර පරතරය මනුෂ්‍යයෙකුගේ සිතක් අනිත්‍යභාවයට පත් වී තව සිතක් හටගැනීමට ගන්නා කෙටි කාලයයි. ඒ කාලය තුළ ඔහු යුද ඇඳුම ගලවා සුදෝ සුදු ජාතික ඇඳුම ඇඟලා ගනී. මේ ඇඳුම් දෙකම මාරයාගේමය. මාරයාගේ මේ විකට ඇඳුම් තරග වලින් මිදී සතර අපායේ ත්‍රස්තවාදයෙන් මිදීමේ මග ලොව්තුරා බුදු සමිඳුන් බොහොම පැහැදිලිව දේශනා කර ඇත.

තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව, තෙරුවන් ගුණ අර්ථ වශයෙන් දැනගෙන එම ගුණයන් කෙරෙහි ඇති කරගන්නා විශ්වාසය 'ජීවිතයේ එකම සැනසීම ලොව්තුරා බුදුරජාණන් වහන්සේය' කියන විශ්වාසය, සසර දුකින් මිදීමේ එකම මාර්ගය ධර්ම රත්නය කියන විශ්වාසය, සංඝ රත්නයේ අනන්ත වූ

ගුණයන් පිළිබඳ විශ්වාසය. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තිබෙන කෙනා තමන්ගේ ජීවිතයට කුමන ප්‍රශ්නයක් කරදරයක් පැමිණියද තෙරුවන් කෙරෙහි විශ්වාසය පළුදු කරගන්නේ නැහැ. ඔබ සිතන්න ඔබේ රුපියල් දාහක් නැති වුණාය කියල. එවිට ඔබ සිතනවා නම් 'මගේ රුපියල් දාහක් නැති වුණේ මම තෙරුවන් සරණ ගොස් ඇති නිසාමයි. නැතිනම් රුපියල් දහ දාහක පාඩුවක් වෙන්න තිබුණා'ය කියලා. 'මට තනතුර පමණක් අහිමි වුණේ තෙරුවන් සරණ යන නිසාමයි. නැතිනම් මට ජීවිතයත් අහිමි වෙන්න තිබුණා'ය කියලා. මේ ආකාරයෙන් ඔබගේ ජීවිතයට කුමන අභියෝගයක් පැමිණියද තෙරුවන් සරණ පිළිබඳ විශ්වාසය තමන්ගේ ජීවිතයේ එකම සරණ, විශ්වාසය කරගන්න. ධර්මයේ සන්දිට්ඨික ගුණය පිළිබඳ නිරතුරුවම ඔබ විශ්වාසය තබන්න. ඊට එරෙහිව අදහස් ප්‍රකාශ නොකරන්න. මේ ජීවිතයේදීම ධර්මය අවබෝධ කර ගැනීමට, සතර අපායෙන් මිදීමට නොහැකිය කියන මිථ්‍යා මතවලින් මිදෙන්න. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ 'ධර්මය සන්දිට්ඨිකයි' වශයෙන් දේශනා කර ඇති නිසා එම සන්දිට්ඨික ගුණය කෙරෙහි අචල විශ්වාසය තබා ධර්ම මාර්ගයේ පෙරට යන්න. බුදුරජාණන් වහන්සේගේ උතුම් දේශනා ඉක්මවා යෑමට, සැකයන් ඇති කිරීමට ඉවහල් වන මාරපාක්ෂික සිතුවිලිවලින් ඔබ මිදෙන්න. මහා සංඝ රත්නය යනු ආර්ය අෂ්ටාංගික මාර්ගයේ චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීම උදෙසා ගමන් කරනා පිරිසක් බව දකින්න. මහා සංඝරත්නයට උපදෙස් දීමට අවවාද අනුශාසනා කිරීමට පින්වත් ගිහි ඔබ උත්සාහ නොගන්න. නිරතුරුවම අතීතයේ වැඩසිටියා වූ ගුණයෙන් ඥානයෙන් පරිපූර්ණ වූ මහා සංඝ රත්නයේ එම ගුණයන් ඥානයන් දකිමින් සිහි කරමින් වර්තමාන මහා සංඝරත්නය කෙරෙහි විශ්වාසය ඇතිකර ගන්න.

දෙවැනිව ඔබ සීලය ආර්යකාන්ත සීලයක් ලෙස ආරක්ෂා කර ගන්න. තමා අතින් සිල් පදයක් බිඳුනොත් ඒ මොහොතේම එම සිල් පදය නිවැරදි කර ගැනීම, ආර්යකාන්ත සීලය ආරක්ෂා කරන

පින්වතාගේ ලක්ෂණයක්. ඔහු තමා අතින් වූ වරද හෙළි කිරීමට මැළිවෙන්නේ නැහැ. ආර්යකාන්ත සීලය රකින කෙනා තමාගේ ආත්ම ගරුත්වයට වඩා, තමා සතර අපායෙන් මිදීමට කැමති වෙනවා. සිල් පදයක් බිඳ දමා ලබන තාවකාලික අසත්පුරුෂ ආශ්වාදයට වඩා සතර අපායට වැටුණොත් එහිදී ලබන දීර්ඝ විපාකයන් ගැන මෙනෙහි කරනවා. නිතරම ඔබේ ඇසට පෙනෙන තිරිසන් ලෝකයේ සතුන් විඳින දුක මට නම් එපා යයි සිතනවා. සීලයෙන් ලැබෙන්නා වූ ආනිශංසවල අනිත්‍යභාවය නුවණින් දැකීම ආර්යකාන්ත සීලයේ අර්ථය වෙනවා.

තෙවනුව ඔබ තනතුරු, නායකත්වය මේ ආදී වශයෙන් රැස්කොටගෙන ඇති ''මගේ ගොඩ'' මේවා මගේ වසඟයේ තබා ගත නොහැකි දේවල් බව සිතීමට පුරුදු විය යුතුයි. අතීතයේ මේ රටේ සිටි සෑම පාලකයෙක්ටම, නායකයෙක්ටම, විධායකයෙක්ටම එම තනතුරු අහිමි වූ ආකාරය, ජනතා ප්‍රතිචාරයන් හීනවී ගිය ආකාරය, රෝගී වී දුක් විඳ මිය ගිය ආකාරය සිහි කිරීමට පුරුදු විය යුතුය. මේවායේ අනිත්‍ය ස්වභාවය දැකීමට උත්සාහ කළ යුතුය. දැන් ඔබට ප්‍රශ්නයක් මතුවනු ඇත 'හාමුදුරුවෝ කියන්නේ මේවා අතහරින්නද?' කියලා. නැත. සතර අපායේ ත්‍රස්තවාදයෙන් මිදීමට ඔබ කිසිවක් අතහැරිය යුතු නැත. තනතුරු, බිරිඳ, දරුවන් දේපළ අතහැරිය යුතු නැත. ඔබ වෙනදාට වඩා තෙරුවන් කෙරෙහි විශ්වාසයෙන් තම වගකීම් ඉටුකළ යුතුය. වෙනදාට වඩා වගකීම් යුතුකම් ඉටු කිරීමේදී ජවසම්පන්න විය යුතුය. ඔබ සමාජයේ ජීවත් වන උද්‍යෝගිමත්ම ජවසම්පන්නම පුද්ගලයා බවට පත්විය යුතුය. ඔබ තුළ ගොඩනැගෙන ආත්ම විශ්වාසය නිසා ඔබ ආත්ම අභිමානයකින් යුතුව කටයුතු කරනු ඇත. මෙය හුදෙක් මාන්නය හෝ අහංකාරකමක් නොවේ. එය ධර්ම මාර්ගය වැඩීමේදී ඇතිවන නිහතමානී ආත්ම ශක්තියකි. මේ නිහතමානීබව මමත්වයේ දැඩි භාවය නැමති මහා කළුගල සිදුරු වී නැගෙන සියුම් ජල ධාරාවන්ය. මේ සියුම් දිය දහර මහා ජල ප්‍රවාහයක් බවට ඔබට පත් කරගත හැක්කේ තමා, මගේ

කරගෙන තිබෙන සියල්ල අනිත්‍ය බව දකිමින් ජීවත් වීමෙන්ය රූපය ඇසුරු කරමින් රූපය කෙරෙහි ඇති තෘෂ්ණාවයි ඔබ සියුම්කොට ගත යුත්තේ. දැන් ඔබට තේරෙනවා ඇති සතර අපායේ ත්‍රස්තවාදයෙන් මිදීමේ මාර්ගය, ඔය රටේ කරපු යුද්ධය ජය ගැනීමට වඩා මොන තරම් පහසුද කියලා. මිනිස්සු මැරෙන්නෙ නැහැ. අංගවිකල වෙන්නේ නැහැ. කෝටි ප්‍රකෝටි ගණන් මුදල්, අවි ආයුධ, වැටුප්වලට වියදම් වෙන්නේ නැහැ. බංකර් තනන්න, වාහන පරීක්ෂා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. වෛරය ක්‍රෝධය ඇති වෙන්නේ නැහැ. මේ සියල්ල නැති වෙද්දී ඔබ තුළ ඇති වෙන එක දෙයක් තිබෙනවා, ඒ තමයි සතිය සහ සිහිය. සිහිබුද්ධියෙන් යුතුව ඔබ සැබෑ මග සැබෑ ජයග්‍රහණය තෝරා ගන්න දක්ෂ වෙන්න.

# ඔය කඩුල්ල පැන ගන්න ඇයි බැරි?

අප මහා පීඩාවක් ලෙසින් ගත් උතුරේ පැවැති දශක තුනක ත්‍රස්තවාදයට වඩා සතර අපායේ කල්ප ගණන් පීඩා විඳින සතර අපායේ 'ත්‍රස්තවාදය' මොන තරම් භයානක වුවත්, මිනිසුන් ඒ අති භයානක තත්ත්වය ගැන නොසිතීම මහා අවාසනාවක්. සතර අපායෙන් මිදීමේ සැබෑ මග ධර්මය විසින් හොඳින් එළි පෙහෙළි කර පෙන්වා දී තිබියදීත් සතර අපායේ ත්‍රස්තවාදයෙන් නොමිදුණු අවාසනාවන්ත මහත්මයෙකුගේ නොපෙනෙන ලෝකයේ කථාවක් භික්ෂුව මෙහිදී සටහන් කරනවා, ඔබගේ හිතසුව පිණිස. සතර අපායෙන් මිදීමේ ඔබේ උත්සාහයට ශක්තියක්, ධෛර්යයක් ලබාගැනීම උදෙසා.

දිනක් භික්ෂුව හොරොව්පතාන ප්‍රදේශයේ පෞරාණික වනගත ආරණ්‍යයක වැඩ සිටියා. එක්තරා දිනක රාත්‍රියේ සමාධියෙන් පසු වෙද්දී, රටේ තනතුරක් දැරූ මහත්මයෙක් රෝගීව සිට මිය ගොස්, සතර අපායට අයිති ප්‍රේත ලෝකයේ ප්‍රේත ජීවිතයක උපත ලබා සිටින අයුරු දර්ශනය වුණා. මේ ප්‍රේත මහත්මයාගේ රූපය විකෘති ස්වභාවයක් තිබුණේ නැහැ. ඔහු මනුෂ්‍ය ලෝකයේ සිටියදී තිබූ රූපයේ ස්වභාවය සහිතවමයි ප්‍රේත ලෝකයේත් සිටියේ. ඔහු එහි දුක් විඳින බවක් බාහිරව පෙනුනේ නැහැ. ගුප්ත ස්වභාවයක් මුහුණේ තිබුණා. ඇඳුම්, ආහාරවලින් හිඟ බවක් පෙනුනේ නැහැ. විරූපී බවක්ද තිබුණේ නැහැ. මනුෂ්‍ය ලෝකයේ ජීවත්ව සිටියදී ගෙදරට අඳින සරම සහ කමිසයක් සහිතවම තමයි ප්‍රේත ලෝකයේද සිටියේ. අපි මොහුට 'ප්‍රේත ඇමැතිවරයා' යැයි කියමු.

මේ ප්‍රේත ඇමැතිවරයා භික්ෂුවට දර්ශනය වන විට, හොඳින් නඩත්තු කරන ලද ගෙමිදුලක් අයිනේ වූ කාණුවක තබා තිබූ, ලීයෙන් තැනූ ඇඳි දෙකක් සහිත පුටුවක තමයි වාඩි වෙලා සිටියේ. හොඳින් සිහියට ගන්න. මෙය කුණු කාණුවක් නොවේ. තණකොළ සහිත අලංකාර ගෙමිදුලේ කපන ලද කාණුවක්. කාණුව පතුල සමතලා ස්වභාවයක් නොගත් නිසා මේ පුටුව කිසිම අවස්ථාවක සමබරව තිබුණේ නැත. නිරතුරුවම පුටුවේ කකුල් හතරෙන් තුනක් පමණයි පොළොවේ ගැටී තිබුණේ. ඉතිරි කකුල පොළොවේ නොගැටෙන සමබර නොමැති ස්වභාවය නිසා ප්‍රේත ඇමැතිවරයා බරවෙන, බරවෙන පැත්තට පුටුව ඇල වෙයි. මොනම අවස්ථාවකවත් ප්‍රේත ඇමැතිතුමාට පුටුවේ සුවපහසුවෙන් හිඳගෙන සිටීමට අවස්ථාවක් නොමැත.

මෙසේ අපහසුවෙන් හිඳගෙන සිටින ප්‍රේත ඇමැතිවරයා අසල පෝලිමකි. එහි ප්‍රේතයෝ සහ ප්‍රේතියෝ හත් දෙනෙක් පමණ තම වාරය එන තෙක් බලා සිටිති. ඔවුන් එකිනෙකා ප්‍රේත ඇමැති හමුවට ගොස් මොනවාදෝ කියයි. ප්‍රේත ඇමැතිවරයා මොනවාදෝ ලියයි. ඔහුගේ වැඩේම ලියන එකය. ඒ කියන්නේ ලියුම් දෙන එකය. මේ අවස්ථාවේදී මෙතැනට ප්‍රේතියන් දෙදෙනෙකු අලුතෙන් එක් වේ. එක් ප්‍රේතියක් වයස අවුරුදු 65 ක පමණ වයසක් පෙනෙන සාරියක් ඇඳගත් තැනැත්තියකි. අනෙක් ප්‍රේතිය වයස අවුරුදු 30 ක පමණ පෙනුමක් ඇති, අනෙක් ප්‍රේතියගේ දියණියවන් ස්වභාවයකිනුයි භික්ෂුව හඳුනා ගත්තේ. මේ වයසක ප්‍රේතිය පෝලිමේ නොසිටම, ප්‍රේත ඇමැතිවරයා ළඟට පැමිණ මහා වේදනාත්මක අඳෝනාවක් තබන්නට පටන් ගත්තා. ඇය තම ඇඟිලි වලින් තම දෑස් විවෘත කර මෙන්න මේ විදිහට අඳෝනා තැබුවා. 'අනේ මම ලියුම අරගෙන නගර සභාවට ගියා කණ්ණාඩි කුට්ටම ගන්න. නගර සභාවෙන් කියනවා මගේ කට ගඳයි, ඒ නිසා කණ්ණාඩි දෙන්න බෑ කියලා. කණ්ණාඩි දෙන්න නම් කටේ ගඳ නැතිකරගෙන එන්නය කියලා. අනේ මගේ ඇස් අන්ධ වීගෙන එනවා. මට කණ්ණාඩියක් ලබා දෙන්න'

කියලා ප්‍රේතිය, ප්‍රේත ඇමැතිවරයා ඉදිරියේ දුක්බර, වේදනාත්මක ලෙසින් හඬා වැටෙනවා. ඔබ හිතන්නකෝ, ඔබේ දෑස් අන්ධ වීගෙන එනවා නම් ඔබට මොනවාගේ දුකක්, වේදනාවක් දැනෙයිද? ඒ බිය තමයි ප්‍රේතියට තිබුණේ. ඇයගේ කථාවෙන් පෙනෙන්නේ ඇය ඊට පෙරත් ප්‍රේත ඇමැති ගාවට ඇවිත් ලියුම් අරන් ගිහින් තියෙනවා කණ්ණාඩි ගන්න. ඒත් කට ගඳ නිසා ඇයට කණ්ණාඩි ලැබිලා නැහැ. මේ සිද්ධිය වෙනකොටත් ප්‍රේත මව සමග පැමිණි අවුරුදු 30 ක පමණ පෙනුමැති උස, කළු, හීන්දෑරි ප්‍රේත දුව පෝලිමේ සිටියා තම වාරය පැමිණෙනතුරු. ඇය හරිම ගුප්තයි. ඒ දර්ශනය එතැනින් නොපෙනී ගියා.

අපි දැන් කර්මය කර්මඵලවලට අනුව මේ සිද්ධිය ගලපා බලමු. මේ ගැලපීම භික්ෂුව කරන්නේ අනුමානයෙන්. ඔබ භික්ෂුවගේ අනුමානය වැරදි යැයි දකිනවා නම් ඔබේ අදහසට භික්ෂුව ඉඩ දෙනවා.

මනුෂ්‍ය ලෝකයේ දරන ලද ඇමැති සැපයට ඇති වූ තෘෂ්ණාව නිසා, සැප ලබන්න, සැප අයිති කරගන්න තිබූ තෘෂ්ණාව නිසා, වින්ද සැපයෙන් නොසෑහුන නිසා, මැරෙණ මොහොතේ ඒවා කෙරෙහි ඇති කරගත් ඡන්ද රාගය නිසා ඔහු කැමති කළ ආකාරයට ප්‍රේත ලෝකයේ ප්‍රේත ඇමැතියෙක් ලෙස උපත ලැබුවා. මේ ඇමැතිවරයා මනුෂ්‍ය ලෝකයේ ජීවත්ව සිටින විට ජනතාවට පරිත්‍යාගයෙන්, සමාජ සේවය - දන් දීම් ආදිය කළ නිසා ප්‍රේත ලෝකයේ ආහාර, ඇඳුම් පැළඳුම්වලින් අඩුවක් නොමැතිව, විරූපී නොවූ ශරීරයක් සහිතව ඉපදුනා. විරූපී නොවූ ශරීරයක් ලැබීමට විශේෂ හේතුවක් මොහු ක්‍රෝධය වෛරය වැඩියෙන් වඩපු අයෙක් නොවීම. මොහු මනුෂ්‍ය ලෝකයේදී දන්දුන්නේ, සමාජ සේවය කළේ කර්මය කර්මඵල විශ්වාසයෙන් නොවේ. දේශපාලන ප්‍රයෝජනයන් සඳහායි. නිරතුරුවම හිතේ ක්‍රියාත්මක වුණේ තම දේශපාලන අනාගතය ශක්තිමත් කරගැනීමයි. කල්‍යාණ මිත්‍ර ඇසුරක් නොමැතිකම නිසා, සැප

සඳහාම හේතු කර ගැනීමට තිබූ දේවල් දුක සඳහාමයි ප්‍රාර්ථනා කළේ.

මේ ප්‍රේත ඇමැතිවරයාට ලස්සන ගෙම්දුලක් තිබුණත්, ඔහුට උරුම වෙලා තිබුණේ කාණුවක තැබූ, සමබර නොවූ පුටුවක්. මොහුගේ ප්‍රේත ජීවිත කාලය පුරාම, මොහුට අර ලස්සන ගෙම්දුලේ සමබර පුටුවක ඉඳගන්න ලැබෙන්නේ නැහැ. එය කර්ම විපාකයක්. කර්මය තමයි තමා ඇමැතිකම් දැරූ කාලයේ ගිහි පැවිදි සිල්වතුන්ට, ගුණවතුන්ට ගරු නොකිරීම, ඔවුන් පහළ අසුන්වල වාඩිකොට තමා උස් අසුන්වල වාඩිවී සිටීම. සිල්වතුන්ට ගරු නොකර ඔවුන් ඉදිරියේ රාජ තේජසින් හැසිරීම ආදිය. හැබැයි මේ ඇමැතිවරයා එක වරදක් කරලා නැහැ. ඒ තමයි අනුනට, විරුද්ධවාදීන්ට අපහාස, අවමන්, චරිත ඝාතන කරලා නැහැ. එහෙම කරලා තිබුණා නම්, ප්‍රේත ඇමැති පුටුව පිහිටා තිබෙන කාණුව කුණු කාණුවක්, අසූචි කාණුවක් වෙන්න තිබුණා යැයි භික්ෂුව අනුමාන කරනවා. වර්තමානයේ දේශපාලනයේ එල්ල කරගන්නා මඩ ප්‍රහාර, චරිත ඝාතන, අපහාස දෙස බැලීමේදී එවැනි දේ කිරීමට පෙර දෙවරක් හිතා බැලිය යුතුයි ඒවායේ විපාකයන් ගැන. ඒ නිසා පින්වත් ඔබලාගේ පෙර පිනට ලැබුණු ඔය නිල-බල, රාජ තේජස්, තමාට වඩා ගුණයන්, සීලයන් වඩන ගිහි පැවිදි පින්වතුන් ඉදිරියේ පරෙස්සමින් පරිහරණය කරන්න වගබලා ගන්න. ඒ නිසාමයි ඔය ප්‍රේත ඇමැති තම ප්‍රේත ජීවිතය පුරාම කාණුවක තැබූ සමබර නොවූ අසුනක හිමිකරුවෙක් වුණේ. මෙය හරියට මුත්‍රා අශුචි ගොඩේ කැමැත්තෙන් දඟලන පුංචි ළදරුවෙක් වගේ. එතැනින් ගොඩට එන්න එයාට දැනුමක් අවබෝධයක් නැහැ. ළදරුවා එය සැපක් කරගෙනයි දකින්නේ.

ඔබ අහල ඇති සමහරු දේශපාලනයේදී කියනවා 'මම මැරුණත් කොළ පාටයි, නිල් පාටයි, රතු පාටයි. මම කැපුවත් කොළ පාටයි ජාති ජාතිත් නිල් පාටයි' මේ වගේ දේශපාලනය මෝහයෙන් උපාදානය කරගත් පිරිසක් රටේ සිටිනවා. තමන් මැරුණත් කොළ, නිල් පාටයි කියන අය මැරුණත් එම පාටම

තමයි. භික්ෂුවට දර්ශනය වෙලා තිබෙනවා ඔය කොළ, නිල් කම්ස ඇඳපු ප්‍රේතයෝ. ඔය කණ්ණාඩි ඉල්ලා හඬා වැටෙන ප්‍රේතියත් ඔය 'මම මැරුණත් කොළ පාටයි, නිල් පාටයි' කියපු ජාතියේ ප්‍රේතියක් තමයි. ඇය මනුෂ්‍ය ලෝකයේ ජීවත්වනවිට ඇය දේශපාලන පක්ෂයක ප්‍රාදේශීය සංවිධායක වරියක් ලෙස කටයුතු කරන්න ඇති. ඔබ දැකලා ඇති ඇමැතිවරුන්ගේ අනුග්‍රහයෙන් කණ්ණාඩි බෙදා දෙනවා. මේවා බෙදා දෙන්නේ ප්‍රාදේශීය සංවිධායකයින්ගේ ලැයිස්තුවලට. මේ විදියට කණ්ණාඩි දෙන අවස්ථාවක සිල්වත්, ගුණවත් කෙනෙක් අවංකවම තමන්ගේ පෙනීම අඩු නිසා කණ්ණාඩි දෙකක් ගන්න එනවා. එතකොට අර ප්‍රාදේශීය දේශපාලන සංවිධායිකාව කියනවා ඔයා අපට ඡන්දෙ දීල නැහැ, පෙළපාලි යන්න ඇවිත් නැහැ, ඒ නිසා කණ්ණාඩි දෙන්න බැහැ කියලා. ඔබ අහල ඇති අවංකවම එවැනි අයට කණ්ණාඩි දෙන්නේ නැහැ, දරුවෙක් පාසලකට ඇතුල්කර දෙන්නේ නැහැ, රක්ෂාවක් දෙන්නේ නැහැ. මෙන්න මේ වැරදිවල කර්ම විපාක තමයි අර ප්‍රේතිය අත්විඳින්නේ. අත්‍යවශ්‍ය දෙයක් උදෙසා තමා ළඟට එන කෙනාට, තමන් වෙනුවෙන් යුතුකම් ඉටු නොකළ බව පෙන්නා අවශ්‍යතාවය ඉටු නොකර සිටිනවා. කණ්ණාඩි දෙකක් ගන්නයි ප්‍රේතිය නගර සභාවට යන්නේ. කර්මානුරූපව සකස් වුණු ස්වභාවයක් අනුව ප්‍රේත ලෝකයේ නගර සභාව කියනවා ඔබේ කට ගඳ නිසා කණ්ණාඩි දෙන්න බැහැය කියලා. එය හරියටම ඡන්ද දායකයාට ඡන්දය නොදුන් නිසා කණ්ණාඩි දෙන්න බැහැ කියනවා වගේ. ප්‍රේතියගේ කටේ දුර්ගන්ධය නොයන්නේ ඇය මනුෂ්‍ය ලෝකයේ දේශපාලනය කළ කාලයේ අනුනට මුසාවාද, බොරු පොරොන්දු, මඩ ප්‍රහාර, චරිත ඝාතන කළ නිසා. එය තමයි කර්ම විපාකයේ ස්වභාවය. ඡන්දය නොදීම හේතුවක් කර ගනිමින් ජනතා උවමනාවන් ඉවත දමන දේශපාලන ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ට මෙය හොඳ පාඩමක්. මේ ප්‍රේතිය තම ප්‍රේත ජීවිත කාලය තුළදීම, මේ විදිහට කණ්ණාඩි නොලැබීමේ වේදනාවෙන්, ඒ දුක අත්විඳිමින් පෙර කර්මයේ විපාක විඳිනවා. හැම තත්පරයකම ප්‍රේතිය තුළ

වැඩෙන්නේ වෛරය, ක්‍රෝධය. මේ හේතුවෙන් ඇය තව තව අකුසල් සිදු කරගෙන අවසානයේ වැටෙන්නේ නිරයට.

ප්‍රේත මව සමග පැමිණි ඉතා කළු, හීන්දෑරි, සාරියක් ඇඳගත් තරුණ ප්‍රේත දියණිය පෝලිමට පැමිණියේ ප්‍රේත ඇමැතිවරයා හමු වීමටය. භික්ෂුව ඇය හඳුනා ගත්තේ පෙර මනුෂ්‍ය ජීවිතයේදී මැති ඇමැතිවරුන් ඇසුරු කළ කාන්තාවක් ලෙසය. වර්තමානයේදීද මෙවැනි කාන්තාවන් මැති ඇමැතිතුමන්ලා ගැවසෙන තැන්වල ඔබ දැක ඇත. තමාගේ ඇමැති සම්බන්ධකම් නිසා මේ අය ගාම්භීරය. අහංකාරය. ඔය සමහර අය සිතන්නේ 'ලොක්කට වැඩිය අරයා ඉදිමිලා' කියලා. මෙන්න මේ ආකාරය උඩගු වුණු කෙනෙක් විය යුතුයි ඔය තරුණ ප්‍රේතිය. පෙර ජීවිතයේ දේශපාලනඥයින් ඇසුරු කළ පුරුද්දට ප්‍රේත ලෝකයේදීද ප්‍රේත ඇමැති සමග මිත්‍ර වීමට ඇය උත්සාහ ගනී. එහෙත් ඇයගේ කළු ස්වභාවය නිසා ප්‍රේත ඇමැතිද ඇයව මායිම් නොකරයි. මේ දෙදෙනා පෙර මනුෂ්‍ය ජීවිතයේදී එකට මුණ ගැසුණු අය නොවේ. ඇය කළුම කළු ප්‍රේතියක් වූයේ පෙර ජීවිතයේ අහංකාරව අනුන් පහත් කොට සැලකීම නිසා විය යුතුය. ඇයට ප්‍රේත ලෝකය තුළදී හිමි, බලාපොරොත්තු කඩවීම සහ දුකමය. ඇය තුළ වැඩෙන්නේද වෛරය සහ ක්‍රෝධයයි. අවසානයේ නිරයට වැටීමයි. ඉහත කථාවෙන් කියවෙන සතර අපායේ අති බිහිසුණු ත්‍රස්තවාදයෙන් මිදීමට ඔබ තවම ප්‍රමාද නොමැත. එය මනුෂ්‍ය ලෝකයේ යුද්ධ දිනනවාක් මෙන් අපහසුද නැත. එහෙත් මොකක්දෝ පුංචි කඩුල්ලක් ඔබ ඉදිරියේ මාර්ගය අහුරා ඇත. එම පුංචි කඩුල්ල ඔබව සංකීර්ණවූ ලෝකයේ සිරකරුවෙක් කර ඇත. එම පුංචි කඩුල්ල වෙන කිසිවෙක් නොව 'මම' ය. මමත්වයේ දැඩිභාවයමය. මමත්වයේ දැඩිභාවය යනු සතර අපායේ හිර වීමයි.

# ලෝකය අයිති කාටද?

භික්ෂුවක් දකුණු ප්‍රදේශයේ ආරණ්‍යයක වැඩසිටින විට වන්දනාවේ පැමිණි මැදි වියේ දායක මහත්මයෙක් ප්‍රශ්නයක් ඇසුවා 'හාමුදුරුවනේ ලෝකය අයිති දෙවියන්ටද? බ්‍රහ්මයාටද?' කියලා. එවිට භික්ෂුව ඔහුගෙන් විමසුවා 'මහත්මයා මොකද මේ ලෝකයේ මැවුම්කරු සොයන්නේ?' කියලා. එතකොට ඒ මහත්මයා කියනවා 'හාමුදුරුවනේ, ජීවිතේ මතක තිබෙන දවසේ පටන්ම මම මේ ප්‍රශ්නයත් සමගයි ජීවත් වුණේ. සෑම දේවාලයකටම ගියා, සෑම පන්සලකටම ගියා. ප්‍රශ්න වැඩි වුණා මිසක් අඩුවක් නම් සිදු වුණේ නැහැ'ය කියලා. 'කියලා කියලා දැන් මගේ ප්‍රශ්න කියන්න වෙන කෙනෙක් නැහැ. ඒ නිසා මම ඔබවහන්සේගෙන් විමසන්නේ? කාගෙන්ද මම පිළිසරණක් පතන්නේ?' කියා ඔහු විමසුවා. හරිම ආවේගශීලී බවකින් නැගෙන ප්‍රශ්නයක්.

කාටද මම මේ දුක පිළිබඳ අවනඩුව කියන්නේ? කවුද ලෝකයේ අයිතිකරු? කවුද මේ දුක මට දුන්නේ?

මේ පින්වත් මහත්මයා අසන ප්‍රශ්නයයි.

භික්ෂුව ඇසුවා ඔබ ඇයි මේ පුද බිමට පැමිණියේ කියලා. ඔහු කියනවා බෝධීන් වහන්සේට චෛත්‍ය රාජයාණන් වහන්සේට භාරයක් වෙන්න කියලා. ඒ වෙලාවේ භික්ෂුව ප්‍රකාශ කළා 'මහත්මයෝ, ලෝකය කව්රුත් මැව්වේ නැහැ. ඔබතුමාගේ ප්‍රශ්න වෙන කව්රුවත් ඇති කළේත් නැහැ. ඔබ විසින්ම සසර කරන ලද අකුසල් හේතුවෙන් ඔබ ලබන ඵලය තමයි ඔය බලාපොරොත්තු කඩවීම' කියලා. මේ ප්‍රශ්නය සමාජයේ හුඟ

දෙනෙකුට තිබෙනවා. සමහර දරුවො දෙමාපියන්ට චෝදනා කරනවා. දෙමාපියෝ දරුවන්ට චෝදනා කරනවා, බිරිඳ ස්වාමි පුරුෂයාට චෝදනා කරනවා. සමහරු රජයට චෝදනා කරනවා. ඔබ නිසාය මට මේ දුක කියලා. අතීතයේ යම් දවසක අනුන් නිසාම තමයි ඔබ මේ දුකට හේතුව නම් සකස් කරගත්තේ. තමන්ගේ සැපය උදෙසා තවත් කෙනෙකුට පීඩා කිරීමෙන් ඔබ ලබපු සැපය සෙවණැල්ලක් සේ පසු පසින් එනවා විපාක පිණිස. ඔබ මෙහෙම සිතන්න. පින්වත් අම්මා කෙනෙකුයි තාත්තා කෙනෙකුයි සිටිනවා. මේ දෙදෙනාම කළු පැහැතියි. ඒ කියන්නේ සමේ පැහැය කළුයි. මේ දෙදෙනාට දරුවෙක් උපදිනවා දරුවාගේ පැහැයත් කළුයි. මේ දරුවා ළමා වයසට පැමිණෙන කොට දෙමාපියන් කෙරෙහි ද්වේෂයක් ඇති කරගන්නවා ඔය දෙදෙනා නිසා මමත් කළු වුණාය කියලා. මෙතැනදී දරුවා කළු පැහැති වුණේ අම්මා තාත්තාට කළු පැහැති සමක් තිබුණ නිසා. එහි ජාන බලපෑම් හේතුවෙන්. නමුත් එවැනි කළු පැහැති සමක් ඇති අම්මා කෙනෙකුගේ මව් කුසකට දරුවා බැස ගන්නේ දරුවා පෙර ජීවිතයේ කරන ලද අකුසල කර්මයක් නිසා. ඊට විපාක වශයෙන්. පෙර ජීවිතයේදී දරුවා ද්වේෂය වඩන්න ඇති. පරවුණ මල් බුදු සමිඳුන්ට පුජාකරන්න ඇති. මෙවැනි හේතුන් නිසා අවලස්සනව ඉපදීමට හේතු සකස් වෙමින් සම කළු පැහැති දෙමාපියන්ට දාව ඉපදුණා. මේක දෙමාපියන්ගේ වරද නොවේ. තමාගේ කර්ම විපාකය. සුදු පැහැති අම්මා කෙනෙක්ට දාව සුදු පැහැති ලස්සන දරුවෙක් උපදිනවා. එම අම්මාගේ මව්කුසට දරුවා බැස ගන්නේ කුසල විපාකයක් වශයෙන් වර්ණවත් සමක් ඇති ලස්සන දරුවෙක් ලෙස උපදින්න හේතු සකස් වී තිබුණ නිසා. ඒ හේතුව මෛත්‍රිය වැඩීම, සිල්වතුන්ට ගරු කිරීම, සුවඳ මල් පුජා කිරීම. ආසන වැලි මළු ඇමදීම. මෙවැනි කුසල් විපාකයන් ඉස්මතු වී එම සැප විපාක සකස් වෙනවා. එතකොට මේ ස්වභාවයන් සකස් වුණේ ඔබ කරගත්ත කුසල් අකුසල් නිසා මිසක් අම්මා තාත්තා නිසා නොවේ. අම්මා තාත්තා පොහොසත් වත්කම් ඇති නිසාම නොවේ දරුවා පොහොසත් වෙන්නේ. එම දරුවා එවැනි

සශ්‍රීක ජීවිතයක් ලැබීමට පෙර ජීවිතයේ සම්පූර්ණ කර ගත් කුසල් තිබුණ නිසායි. ඊට අනුරූපීව පොහොසත් දෙමාපියන්ට දාව දරුවා උපදින්නේ. දෙමාපියන් දුප්පත් වුණාය කියලා සමාජයේ පොහොසත් අය සමග සංසන්දනය කරලා දුප්පත් දෙමාපියන්ට චෝදනා කරලා එලක් නැහැ ‘අම්මා තාත්තා නිසා මම දුක් විඳිනවා’ කියලා. ඔබට සැප ලබන්න පෙර පින් අවම නිසයි ඔබ දුප්පත් මව් කුසක ප්‍රතිසන්ධිය ලබන්නේ. එම නිසා එම අහිංසක දෙමාපියන්ට චෝදනා කිරීම, දුක් දීම තව තවත් අකුසල් සකස් කරගැනීමක්. තමන්ට ලැබුණ දෙය තමන්මයි ලබා ගත්තේ කියලා ධර්මානුකූලව ජීවිතයට ගලපා ගන්න දක්ෂ වෙන්න. අඩු තැන, වැරදුන තැන බලලා නිවැරදි කරගන්න.

ඔබේ ඔය දුක වෙන කව්රුවත් මැව්වා නොවේ. ලෝකය දෙවියන්ටවත්, බ්‍රහ්මයන්ටවත් අයිති දෙයක් නොවේ. මොකද දෙවියොත්, බ්‍රහ්මයෝත් යම් මොහොතක තම දිව්‍ය බ්‍රහ්ම ජීවිත වලින් චුතව යනවා. තමාවත් තමාට අයිති නැති විට ඒ අය කොහොමද ලෝකයේ මැවුම්කරුවන් හිමිකරුවන් වෙන්නේ. එහෙම නම් කාටද ලෝකය ඇත්තටම අයිති?

ලෝකය අයිති සතර මහා ධාතුන්ටයි. පඨවි, අපෝ, තේජෝ, වායෝ ඉහත ස්වභාවයන් හතරද ලෝකයේ හිමිකරුවන්ය. නිරතුරුවම මහා ප්‍රවේගකාරී වේගයකින් අනිත්‍ය භාවයට පත්වෙන සතර මහා ධාතුව ක්‍රියාත්මකභාවයට පත් කරන ක්‍රියාකරුවෙක් ද සිටිනවා. ඒ තමා විඤ්ඤාණ ධාතුව. මේ විඤ්ඤාණ ධාතුවට බැසගැනීමට නම් අත්‍යවශ්‍යයෙන්ම රූපයක් අවශ්‍ය වෙනවා. විඤ්ඤාණය බැසගැනීමෙන් අනතුරුව සකස් වෙන නාම රූපයන්ගේ ස්වභාවයන් වේගයක්ම පමණයි. ඒ වේගය යනු අනිත්‍යභාවයයි. එසේ නම් මේ ලෝක ධාතුව තුළ පරම හිමිකරු අන් කිසිවෙක් නොව අනිත්‍යයයි.

# තාක්ෂණයට නොපෙනෙන ප්‍රඥාවේ විද්‍යාව

භික්ෂුවක් එක්තරා කැලෑබද ආරණ්‍යයක වැඩසිටියදී, සමාධියෙන් පසුවන විට විඥ්ඥාණ ධාතුවේ ප්‍රවේගකාරී බව පින්වත් ඔබට මැනවින් අවබෝධ කරගැනීමට හැකි ධර්මතාවයක් දර්ශනය වුණා. ඒ තමයි ඕපපාතිකව උපත ලබන යක්ෂයකුගේ ඉපදීම, එසේත් නැතිනම් පහළ වීම.

පින්වත් ඔබ මවකට දරුවෙක් බිහි වන හැටි, තිරිසන් සතෙක් විසින් පැටවෙක් බිහි කරන සැටි. කිකිළියෙක් බිත්තර දමන හැටි දන්නවා. නමුත් මේ ජීවිතය සකස්වීම සඳහා මුල් හේතු කාරණය වූ සංස්කාර හේතුවෙන්, කර්ම ශක්තිය, විඥ්ඥාණය කොයි ආකාරයෙන්ද ඕපපාතිකව බ්‍රහ්මයෙක්, දෙවියෙක්, යක්ෂයෙක්, ප්‍රේතයෙක්, උපද්දන්නේ, මව්කුස ඇති කලල රූපයට කොහොමද විඥ්ඥාණය බැසගන්නේ කියලා දැකලා නැහැ. එය පියවි ඇසෙන් දකින්නත් බැහැ. අවිද්‍යාවක්ම වූ පෘථග්ජන ලෝකය විසින් 'විද්‍යාව' ලෙසින් හඳුන්වන දෙයටත් බැහැ. ප්‍රඥාවේ විද්‍යාවෙන් පමණයි එය දැකිය හැක්කේ. සමාධිය ප්‍රගුණ කළ සිතකින් පමණක් දැකිය හැකි විෂයක්මයි. මොකක්ද මේ විඥ්ඥාණය කියන්නේ? එහි හැඩය, වර්ණය, ස්වරූපය හැසිරීම් රටාව මොකක්ද? අපි මේවාට පිළිතුරු දකින්න හරි කැමතියි.

මේවා නිසාම නොයෙක් දෘෂ්ටි වල බැසගන්නත් හරිම කැමතියි. මේවා ගැන නොදැනීම නිසා සිදුකර ගන්නා අකුසල්ද

අප්‍රමාණයි. යක්ෂයාගේ ඕපපාතික පහළ වීමේදී භික්ෂුවට මුළින්ම දර්ශනය වුණේ වේගයෙන් භ්‍රමණය වන සුළං සුළියක්. මෙය හරියට දිය සුළියක ස්වභාවයෙන් වේගයෙන් භ්‍රමණය වුණා. පොළොවේ සිට අඩි 6 ක් පමණ ඉහළින් මෙම සුළිය ඇති වුණේ. මේ සුළං සුළියේ වේගය, ප්‍රවේගය කිසිදු යන්ත්‍රයකින් මැනිය නොහැකි තරම් අති ප්‍රවේගකාරීයි. මෙම වේගය විසින් යක්ෂ රූපය නිර්මාණය වුණා. දැන් භික්ෂුව ඉදිරියේ සිදු වූ වේගවත් ක්‍රියාවලිය නිමා වී කළු පැහැති යක්ෂ රූපයේ කඳ කොටස පැහැදිළිව දර්ශනය වුණා. සියල්ල සිදුවීමට තත්පර දහයකට වඩා ගියේ නැහැ. මේ වේගය ඔබ සමාධිය තුළින්ම දැකිය යුත්තක්. මෙහිදී භික්ෂුවට දර්ශනය වූයේ ඕපපාතිකව උපත ලද යක්ෂයාගේ කඳ කොටස පමණයි. බෙල්ලෙන් ඉහළ කොටස ඒ මොහොතේ පහළ වුණේ නැහැ. කළු පැහැති අඩි 7 ක් පමණ උසැති හැඩි දැඩි යක්ෂ රූපයේ කය සහ මනස පහළ වීම, ඉපදීම එම මොහොතේ සිදු වූවද, ඇස, කන, දිව, නාසය ඒ මොහොතේ පහළ වුණේ නැහැ. මේ යක්ෂයාගේ පෙනුමෙන් භික්ෂුව අනුමාන කළේ මොහු සම්‍යක්දෘෂ්ටික යක්ෂයෙක් බවයි. භික්ෂුව අනුමාන කළේ ප්‍රේත ජීවිතයක් ගත කරමින් සිටි පින් ගැනීමට හැකි ප්‍රේතයෙක්. භික්ෂූන් වහන්සේලා නිතිපතා අනුමෝදන් කළ පින් අනුමෝදන්ව ප්‍රේත ජීවිතයෙන් අතමිදී, ආරණ්‍ය ආරක්ෂක සම්‍යක්දෘෂ්ටික යක්ෂයෙක් ලෙස උපත ලද බවයි. ප්‍රේතයාගේ සිතේ ඇති වූ අවසාන චුතිසිත, ඊට කැමති උපාදානය තුළ බැස ගත්තා. නව යක්ෂ ප්‍රතිසන්ධිය සකස් වෙන මොහොතේ එම සිත අනිත්‍යභාවයට පත්වෙනවා, මොකද එම සිත ක්‍රියාත්මක වී අවසන්. ඒ ක්‍රියාත්මක භාවයම තමයි භික්ෂුව දැක්කේ. භික්ෂුව සමාධියෙන් මෙතනදි අත්දැක්කේ එම චුති සිත ක්‍රියාත්මකභාවයට පත් වී අනිත්‍ය වන විට යක්ෂයාගේ ආයතන හය බාහිර රූප සමග ඵස්සය වීමෙන් නැවත නැවත සිත් සකස් වීමක්. ඕපපාතික සත්වයෙක් මරණයට පත්වෙන විට සකස් වුණ අවසාන සිත ඊට උපාදානය වු කර්මයට අනුරූපීව සකස් වුණ

කර්මශක්තිය 'සංස්කාර පච්චයා විඤ්ඤාණං' කියන ධර්මතාවයට අනුවයි මේ උපත සකස් වුණේ.

දැන් මොහු ජීවමාන යක්ෂයෙක්. මෙතනදි භික්ෂුවට ඉතාමත් පැහැදිලිව අරමුණු වුණා විඤ්ඤාණ ධාතුව හැඩයක් වර්ණයක් ඇති රූපයක් නොවේ. විඤ්ඤාණ ධාතුව වශයෙන් භික්ෂුව දැක්කේ අති ප්‍රවේගකාරී වේගයක් පමණයි. වේගය නිසාම එතන ශක්තියක් ගැබ් වෙලා තිබෙනවා. හරියටම සුළං සුළියක් වගේ වේගයෙන් භ්‍රමණය වෙමින් යක්ෂ රූපය නිර්මාණය වුණා. මේ මොහොතේ මේ සිද්ධිය මතකයට එන විට භික්ෂුවට සිනහවක් පහළ වෙනවා. මොකද මෙතන ගතයුතු ඡන්දරාගයෙන් උපාදානය කරගත් කිසිවක් තිබුණේ නැහැ. වේගයක් පමණක්මයි තිබුණේ. මේ වේගය කියන්නේ අනිත්‍යය. මේ අනිත්‍යය දකින පින්වතා විඤ්ඤාණයට බැසගන්නේ නැහැ. ඔහු අවබෝධයෙන් දන්නවා බැසගන්න දෙයක් එතන නැහැ කියලා. අල්ලා ගන්න ස්ථිරත්වයක් එහි නැහැ කියලා. විඤ්ඤාණය කියන්නේ වීදුරු පෙට්ටියක් තුළ, ගල් ගුහාවක් තුළ, සීල් කරපු පෙට්ටියක් තුළ, සිදුරක් නැති කාමරයක් තුළ කොටු කරන්න සිර කරන්න පුළුවන් දෙයක් නොවේ. විඤ්ඤාණය කියන්නේ ධාතුවක්. එහි එකම ස්වභාවය වේගයෙන් අනිත්‍ය භාවයට පත්වීමයි. එතකොට පඨවි, ආපෝ, තේජෝ, වායෝ සතර මහා ධාතුවේ ස්වභාවයත් වේගයෙන් අනිත්‍යභාවයට පත්වීමයි. මේ ධාතූන් අනිත්‍යභාවයට පත්වීමේ වේගය තුළ, අවකාශ ධාතුවකුත් එහි සකස් වෙනවා. මේ අවකාශ ධාතුව තුළින් විඤ්ඤාණ ධාතුව ඕනෑම රූපයක් විනිවිද ගමන් කරනවා. අඩි 100 ක් ඝන කමැති ලෝහ කුට්ටිවලින් තැනූ සිදුරු නොමැති කාමරයක් තුළට නිමේෂයකින් ගමන් කිරීමට විඤ්ඤාණ ධාතුවට හැකියි. මොකද ලෝහ කුට්ටියද නිරතුරුවම අනිත්‍යයේ වේගයට නතුව තිබෙන නිසා.

අපේ සමාජයේ සමහර පින්වතුන් විශේෂයෙන්ම යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම් කරන අයගේ මතයක් තිබෙනවා ප්‍රේතයෙක්, යක්ෂයෙක් බෝතලයක සිර කර තැබිය හැකිය කියලා. තොවිලයක් නටලා, රුපියල් දහස් ගණනක් වියදම් කරලා අමනුෂ්‍යයන්ව සිර

කෙරුවා කියලා කට සීල් කරන ලද බෝතල් මුහුදට දමනවා ඔබ දැකලත් ඇති.

අමනුෂ්‍යයෙක් කියන්නේ ඇස, කන, නාසය, දිව, මනස, ශරීරය කියන ඉන්ද්‍රියන් හයෙන් පරිපූර්ණ සත්ත්වයෙක්. එම ශරීරයේ ඝනභාවයක් නැහැ. සියුම් ශරීරයකුයි තිබෙන්නේ. මේ ඉන්ද්‍රියන් බාහිර රූප සමග ඵස්සය වීමෙන් අමනුෂ්‍යයින්ගෙත් පංචඋපාදානස්කන්ධය සකස් වෙනවා. අමනුෂ්‍යයා තුළත් කාය සංස්කාර, වචී සංස්කාර, මනෝ සංස්කාර සිද්ධ වෙනවා. මෙවැනි අමනුෂ්‍යයෙක් බෝතලයක් තුළ සිර කෙරුවොත් අනිවාර්යයෙන්ම කාය සංස්කාර, ආශ්වාස-ප්‍රශ්වාස නොමැති වීමෙන් පීඩා විඳිමින් මිය යනවා. එහෙම මිය ගියා කියලා අවසාන වශයෙන් එම අමනුෂ්‍යයා තුළ සකස් වෙන චුතිසිත විඤ්ඤාණය බෝතලය තුළ සිර වී තිබෙන්නේ නැහැ. බෝතලය කියන්නේ සතර මහා ධාතුන්ගෙන් සැදුන රූපයක්. එහි ස්වභාවය වේගයෙන් අනිත්‍ය භාවයට පත්වීමයි. ඒ අනිත්‍යයේ වේගය තුළින් විඤ්ඤාණ ධාතුව ගමන් කරනවා, උපාදානය සකස් වුණ බැස ගැනීම වෙත. මෙවැනි අවස්ථාවක අමනුස්සයා තමාව බෝතලයේ සිර කිරීමට කටයුතු කළ පුද්ගලයන් කෙරෙහි ද්වේෂයක් සකස් කරගැනීම නිසා, වඩා නපුරු, රෞද්‍ර වූ ප්‍රේත, යක්ෂ ජීවිතයක් ලබන්න පුළුවන්. එම අයගෙන් පළිගැනීම උදෙසා. ඒක නිසා වෙන්න ඇති යන්ත්‍ර, මන්ත්‍ර ගුරුකම් කරන අයත්, එම මිථ්‍යාදෘෂ්ටික සේවාවන් ලබන අයත්, දියුණුවක් නොමැති, පීඩාකාරී ජීවිත ගත කරන්නේ. මේවා තමාගේ මෝහය නිසා සිදුවන තත්ත්වයන්. මෙතැනදී වඩාත් බරපතළ තත්ත්වය නම් එවැනි අමනුෂ්‍යයෙක් බෝතලයක් තුළ සිර කොට මරා දැමීමේදී බරපතළ අකුසලයක්ද සිදු වීමයි.

පින්වත් ඔබ මෙහෙම සිතන්න. ඇමරිකාවේ ජීවත් වන ශ්‍රී ලාංකිකයෙක් සිටිනවා. මොහු රැකියාව සඳහා ඇමරිකාවේ ජීවත් වෙන්නේ මොහුගේ බිරිඳ, දරුවෝ ජීවත් වෙන්නේ ශ්‍රී ලංකාවේ. විශාල දේපළක්ද මව් රටේ මොහුට තිබෙනවා. මොහු හදිසි අනතුරකින් ඇමරිකාවේදී මිය යනවා. මිය යන මොහොතේ මොහු

තුළ ඇතිවන්නේ බිරිඳ, දරුවන්, දේපළ කෙරෙහි ඡන්ද රාගයක්. කුසල් සිතක් මතුවුණේ නැහැ. දීර්ඝ කාලයක් විදේශගතව සිටි නිසා කළ පින්කම් තිබුණේ නැහැ. සීලයක පිහිටියෙත් නැහැ. එම නිසාම තෘෂ්ණාවෙන් තෙත් වුණ සිත ප්‍රේත ප්‍රතිසන්ධියක් ලබනවා. තමන්ගේ බිරිඳ, දරුවන්, දේපළ සහිත නිවසේම. මේ ජීවිත මාරුව තත්පර දහයක් තුළ සිදු වෙලා ඉවරයි. තත්පර දහයකට පෙර ඇමරිකාවේ සිටි මනුෂ්‍යයා ඊළඟ නිමේෂයේදී ශ්‍රී ලංකාවේ තම නිවසේ ප්‍රේතයෙක්. ඇමරිකාවේ මැරුණා කියලා පාර, මග, දිශාව සොයාගන්න අපහසු වුනේ නැහැ. එය තමයි විඤ්ඤාණ ධාතුවේ ප්‍රවේගකාරී විනිවිද ගමන් කිරීමේ ශක්තිය. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ විඤ්ඤාණය මැජික්කරුවෙක් යැයි උපමා කර ඇත්තේ මොන තරම් අර්ථයකින්ද? ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමකට හැර අන් කවරෙක් නම් මෙම මැජික්කරු හඳුනා ගන්නද?

චතුරාර්ය සත්‍ය ධර්මයන් ලෙස, පටිච්චසමුප්පාද ධර්මයන් ලෙස උන්වහන්සේ දේශනා කර වදාළ එම මැජික් කරු නිරෝධය කිරීමේ මාර්ගය මොන තරම් නිරවුල්ද, පැහැදිලිද අවබෝධාත්මකද. ඇසට නොපෙනෙන උපකරණයකට හසුනොවෙන විඤ්ඤාණ ධාතුවේ සියුම් ක්‍රියාකාරීත්වය ලෝකයේ නිර්මාණකරුවාය. මොහුගේ සූක්ෂම භාවය ලොව්තුරා සම්මා සම්බුද්ධ ඥානයෙන් අවබෝධකර ලෝකයාට පහදා දුන්නා මිස වෙන කව්රුන් කෙසේ නම් හඳුනා ගන්නද? මෙම ඉහත කෙටි සටහන විඤ්ඤාණ ධාතුවේ ප්‍රවේගකාරී අනිත්‍යභාවය හඳුනා ගැනීමට ඔබට ප්‍රයෝජනවත් වේවි. මෙම සටහනේ මුලින් සඳහන් කළ ඕපපාතික යක්ෂයාගේ උපතේදී එම යක්ෂයාගේ ඉපදීම සිදු වූයේ බෙල්ලෙන් පහළ කොටස් පමණි. එසේ වූයේ ඇයිද යන්න භික්ෂුව නොදනී. එය අපට දැනගත හැක්කේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමකගෙන් පමණි. අපි කෙසේ නම් කියන්නද?

# දිව්‍ය ලෝකෙ සැපයි... ඒත්?

අවිද්‍යාව පැත්තට ලෝකය බර වෙන්න බර වෙන්න ලෝකයා බර වෙන්නේ තණ්හාව දෙසටයි. අවිද්‍යාවේ දරුවා තමයි තණ්හාව. අවිද්‍යාවේ බර නිසා තණ්හාවේ ගොඩ සැප ලෙසයි සත්ත්වයා දකින්නේ. ඒ නිසා සත්ත්වයා නිරතුරුවම පින්කම් කරමින් ප්‍රාර්ථනා කරන්නේ දිව්‍ය ලෝක, මනුෂ්‍ය ලෝක සැපමයි. මොකද සැපයට ඇති තණ්හාව නිසා අවිද්‍යාව විසින් ඔබව නිරතුරුවම දැනුවත් කරනවා, ලෝකය තුළ සැප තිබෙනවා කියලා. ඔබව ඉදිරියට පදවනවා සැප ස්පර්ශ කරන්න.

මනුෂ්‍ය ලෝකයේ සැප ගැන ඔබට අත්දැකීම් තිබෙනවානේ. දුක් කන්දක් විසිතුරු දවටනයක ඔතා, විසිතුරු ඇඳුම් ආයිත්තම්, සුවඳ විලවුන්, යාන වාහන, ගෙවල් දොරවල්, දරුවන් සමඟ සැප යැයි සිනාසෙමින් කරගසාගෙන යන මනුෂ්‍ය ලෝකයේ සැප, ඔබ අත්දකිනවා බොහොම කැමැත්තෙන්.

මේ කියන්න යන්නේ දිව්‍ය ලෝක සැප ගැනයි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා එක දුප්පත් මනුෂ්‍යයෙක් සිටිනවා, ඔහුට තිබෙන්නේ දිරාගිය පැල්පතක්. එහි වහළයෙන් අහස පෙනෙනවා. බිරිඳ හරියට දර ඉපලක් වගේ. අභේනිය නිසාම විරූපී වෙලා. ධාන්‍ය මල්ලේ අඩියේ ධාන්‍ය ටිකක් තිබෙනවා. මේ මනුෂ්‍යයාට තිබෙන්නේ ඔය ටික පමණයි. මේ මනුෂ්‍යයාට පැවිදි වෙන්න සිතක් ආවත්, මේ දිරා ගිය පැලත්, විරූපී බිරිඳත්, හිස් ධාන්‍ය මල්ලත් අත හැරීමට ඔහුට නොහැකියි. බලන්නකෝ තණ්හාවේ ස්වභාවය.

අනවබෝධය නිසාම, කෑදර සිත් ඇතිව පිළුණු වී යන ආහාර බුදින, දෙතිස් කුණපයකින් යුතු කයක් දරන, දූවිලි අව් වැසිවලින් පීඩා විඳිමින් සැප සොයන අපි, ආහාර, නින්ද, විවේකය නොලබා සැප සොයන අපි, සිතූ සිතූ සම්පත් පහළ වන දිව්‍යලෝකයට ගියහොත් කුමකින් කුමක් වෙයිද?

දිව්‍ය ලෝකය කියන්නේ කාම පුරයක්. එහිදී සිතූ සිතූ සම්පත් ඔබට ලැබෙනවා. ඒ සියල්ල ඔබට ලැබෙන්නේ දිව්‍ය ඕජාව වශයෙන්. ඔබ කළ පින් වල ප්‍රමාණයට ඔබ ඉපදෙන දිව්‍යතල වල පන්ති භේදයක්, පන්ති පරතරයක් තිබෙනවා. මේ භේදය නිසා දෙවියනුත් ගැටෙමින් අකුසල් කරගන්නවා. අතීතයේ කළ කුසල් අනුව තමයි ඔබට සැප ලැබෙන්නේ. ඔබ මෙහෙම හිතන්න. මනුෂ්‍යයෙක් ඉන්නවා... ඔහු දුප්පත්, උදේ සිට රාත්‍රිය වනතුරු ඔහු කුලී වැඩක් කරලා කීයක් හරි සොයාගෙන ගොස් බතුයි පරිප්පුයි කාලා ජීවත්වෙනවා. තව මනුෂ්‍යයෙක් ඉන්නවා, ඔහු හොඳ රජයේ රැකියාවක් කරලා හොඳ වැටුපක් අරගෙන අර කෙනාට වඩා හොඳ ජීවිතයක් ගතකරනවා. තව මනුෂ්‍යයෙක් ඉන්නවා ඔහු කෝටිපතියෙක්. ඔහු තරු පහේ හෝටලයකට ගොස් අවන්හලේ වාඩි වී වේටර්වරයෙක් පිළිගන්වන ආහාර වට්ටෝරුවට ඇඟිල්ල තබනවා. මොහොතකින් ලෝකයේ රසවත්ම ආහාර වේලක් ඔහුගේ මේසයට එනවා. බලන්න මේ තුන් දෙනාම මනුෂ්‍ය ලෝකයේ ඉපදුණ මනුෂ්‍යයෝ. නමුත් සංසාරයේ කළ කුසල් අකුසල් නිසා සැප ලැබීමේ පරතරයක්, සීමාවක් තිබෙනවා. මිනිසුන් දස දෙනෙක් ගතහොත් එම දස දෙනාට ලැබීමේ ස්වභාවයන් දස ආකාරයක් වෙනවා. දිව්‍ය ලෝකයෙත් මේ වගේමයි. අර කෝටිපති ව්‍යාපාරිකයා ආහාර වට්ටෝරුවේ ඇති තමා කැමැති ආහාර වර්ගයට ඇඟිල්ල තැබූ සැනින් තමන් කැමතිම ආහාරය ලැබෙනවා වගේ දෙවියන්ට යම් සැපක් අවශ්‍ය යැයි සිතූ සැනින් එම සැපයෙන් දෙවියාව තෘප්තිමත් වෙනවා.

සුපිරි වෙළඳ සලකට ගොස් කෙනෙක් රුපියල් දෙසීයක් ගෙවලා අයිස් ක්‍රීම් එකක් කනවා. තව දුප්පත් අයෙක් ගමේ කඩේට ගිහින් රුපියල් දහයේ අයිස්පලම් එකක් කනවා. දෙදෙනාම මනුෂ්‍යයෝ. දෙදෙනාම කන්නෙත් අයිස් ක්‍රීම්. නමුත් දෙදෙනා ලබනා රසයේ ස්වභාවයන් වෙනස්. ඒ දෙදෙනාගේ ලැබීමේ විවිධත්වයයි. පින්කර ඇති ස්වභාවයන්ට අනුව දෙවියන් දිව්‍ය ඕජාවෙන් තෘප්තිමත් වෙනවා. දෙවියන්ට තිබෙන්නේ ඕලාරික කයක්. එම ඕලාරික කය ඝනභාවයට පත් කරගැනීමට දිව්‍ය ලෝකවල දෙවියන්ට පුළුවන් වගේම, සමාධියෙන් පරිපූර්ණ, ප්‍රඥාව වඩන භික්ෂුවටද ඕලාරිකභාවයෙන් මුදවා ඝන ස්වභාවයෙන් දෙවියන් දර්ශනය වෙයි. ඕලාරික කයක් තිබුණද දෙවියන්ට ආයතන හයක් (සලායතන) මනුෂ්‍යයාට සේම ඕලාරික කය ඇසුරු කොටගෙන පිහිටා ඇත. එහෙයින් මනුෂ්‍යයාට සේම නිරතුරුවම ඇති වෙමින් නැති වෙන සිත් දෙවියාටද හටගනී. කාම ලෝකයක සැප විහරණය කරන දෙවියාද සතර මහා ධාතුන්ගෙන් නිර්මාණය වූ, අනිත්‍ය ඕලාරික කයක්ද, නිරතුරුවම ඇති වෙමින් නැති වී යන සිතක්ද ඇති සත්ත්වයෙකි. දෙවියන් තුළද සත්ත්වයෙක් පුද්ගලයෙක් නැත්තේය. දෙවියන් සැප විඳිනවා යනු, ක්‍රියාත්මක වෙනවා යනු ස්පර්ශය නිසා ඇතිවන වේදනාවක් පමණක්මය. මනුෂ්‍යයින් වශයෙන් මහා පින්කම් කරමින් ඔබ යන්නට ප්‍රාර්ථනා කරනා සුර පුරය ඔතැනය. දිව්‍ය ලෝක වල දිව්‍ය සැපය ලැබෙන්නේ දිව්‍ය ඕජාව ලෙසින්ය. දිව්‍ය ඕජාව යනු සුන්දර අත්දැකීමකි. දෙවියන් මෙම දිව්‍ය ඕජාව අතහැරීම උපරිමයෙන් පූර්ණ කළ භික්ෂුවටද, නිවන් අවබෝධය ලබාගත් භික්ෂුවටද අත්‍යවශ්‍යම අවස්ථාවලදී ලබා දෙයි.

ඔබ මෙහෙම සිතන්න. භික්ෂුවක් හුදෙකලා වනයේ කුටියක වැඩ සිටින විට ආහාර මඳ බව නිසා ලේ වල සීනි අඩු වී අසනීප වෙනවා. මෙය සිදු වන්නේ රාත්‍රියේදී. භික්ෂුව දැඩි වේදනාවට පත් වෙනවා. කුටිය තුළ ගිලන්පසක් සාදා ගැනීමට සීනි තේකොළවත් නැහැ, අත්හැරීමේ උපරිමය නිසා. භික්ෂුව මොකද

කරන්නේ. රිදුම් දෙන, කලන්තයෙන් අප්‍රාණික වන කයත්, සිතත් මගේ නොවෙයි. මට අයත් දෙයක් නොවේ කියලා අතහරිනවා. ලෝකයේ ශ්‍රේෂ්ඨම අතහැරීමේ ප්‍රතිපදාවේ යෙදෙන භික්ෂුවක් සිත කය අතහරින මොහොතේ ලෝකය කම්පා වෙනවා. ලෝකය නිරුද්ධ වෙනවා. එය දිව්‍ය ලෝකවලට දැනෙනවා. දෙවියන් සොයනවා මොකක්ද වුණේ කියලා. දෙවියන් දකිනවා අසවල් තැන වැඩ සිටින භික්ෂුවගේ අතහැරීමයි මේ දැනුනේ කියලා. ඒ මොහොතේම දිව්‍ය ඕජාව දෙවියන් එම භික්ෂුවට සමාධිය තුළින් ලබා දෙනවා. දිව්‍ය ඕජාව භික්ෂුව විඳින්නේ මනසින්. සීනි අවශ්‍ය නම් භික්ෂුවගේ දෝතට රන්වන් පාට සීනි අහුරක් ලැබෙනවා. අත රන් වගේ දිලිසෙන භික්ෂුව මනසින් එය විඳිනවා. වළඳනවා. පියෙවි සිහියෙන් අවදියෙන් නොවෙයි මෙය වෙන්නේ. සමාධිගත නින්දේදියි. භික්ෂුව පැය කිහිපයකින් අවදි වන්නේ ශරීරයේ තිබූ රෝගී බව දුරු වී පූර්ණ සුවය ලැබීමෙන්. මොකද ශරීරයට අවශ්‍යව තිබූ සීනි ප්‍රමාණය දිව්‍ය ඕජාව වශයෙන් භික්ෂුවගේ ශරීරයට ලැබුණු නිසා. හැබැයි දෙවියන් ඕජාව දෙන්නේ සිත කය අතහැරියොත් පමණයි කියලයි භික්ෂුව සිතන්නේ. ප්‍රඥාව හොඳින් වැඩීමෙන් පමණයි, අවංකවම කය, සිත අතහැරිය හැක්කේ. එහෙම වුණොත් තමයි එම කම්පනය දිව්‍ය ලෝකයට දැනෙන්නේ.

දිව්‍ය ලෝකයේ නිරතුරුවම සජ්ජායනා කරන හඬ, විටෙක පිරිත් හඬේ ස්වභාවයෙන්ද තවත් වේලාවන්ට කෝවිල්වල පූජාව තබනකොට ශබ්ද පූජාවේදී ලොකු නලාවකින් නැගෙන හඬේ ස්වභාවයෙන්ද ඇසෙනවා. වනයේ හුදෙකලා කුටිවලදී මෙම හඬ රාත්‍රී යාමයේදී හොඳින් ඇසිය හැකිය. මුහුද ගංගා දිය ඇලි අසල අපි වාඩි වී සිටියදී මොන තරම් මිහිරි රිද්මයන් අපට ඇසෙනවාද? කැලයක රාත්‍රියට සුළඟ ඇති වෙලාවට අපූරු සංගීතයන් මැවෙනවා. මේවා කවුරුවත් කරන, වයන දේවල් නොවේ. ඵස්සය නිසා ඇතිවන වේදනාවන්. කාම ලෝකයක් වුවද පිනැති දෙවියන් ජීවත් වන නිසා එම පින් මහිමය නිසාම

මෙවැනි සජ්ජායනා, සංගීත රිද්ම ස්වභාවයන් දිව්‍ය තලවල රැව් දෙනවා. අර ගඟේ මුහුදේ දිය ඇල්ලේ රිද්මය වගේ. පිනේ ආශ්චර්යය නිසාම දෙවියන් ආස කරන හඬ රිද්මය, ඒ මොහොතේම ඇති වෙලා දෙවියන් තෘප්තිමත් වෙනවා. දැන් ඔබ සිතන්නකෝ මෙවැනි කාම ලෝකයක ඔබ උපත ලැබුවොත් මෙම කාමයෙන් ඔබට අත්මිදෙන්න පුළුවන් වෙයිද?

ඔබ මනුෂ්‍ය ලෝකයේ පින්කම් කර ලැබූ දිව්‍ය කාම සම්පත් නිසාම පිරිහීමට පත්වී නැවත සතර අපායට වැටීමේ ඉඩකඩ ඉතාමත් වැඩිය. දිව්‍ය ලෝකවල බුද්ධ රත්නයද, සංඝ රත්නයද වැඩ සිටින්නේ නැත. නමුත් ධර්ම රත්නය වැඩ සිටියි. එහෙත් ධර්මය මතුකර පෙන්වීමට බුද්ධ රත්නයද, සංඝ රත්නයද වැඩ නොසිටින නිසා දෙවියෝ අනාථයෝය. එහෙත් දෙවියන් දක්ෂ නම් සංඝ රත්නය වැඩ සිටින මනුෂ්‍ය ලෝකයට පැමිණ සද්ධර්මය ශ්‍රවණය කර අවබෝධය ලැබිය හැකිය.

භික්ෂුවක් කැලයේ හුදෙකලා කුටියක වැඩසිටින විට රාත්‍රියේ පැමිණි දිව්‍යාංගනාවක් ගැන ඔබට කියන්නම්. එක් රාත්‍රියක භික්ෂුවක් සමාධියෙන් පසුවන විට දිව්‍යාංගනාවක් දර්ශනය විය. ඇය සිටියේ පාවෙමින්ය. වැඩි ඉහළක නොවේ. ඇයගේ ස්වභාවය අති සුන්දරය. ඇය සිහින්ය. දිගැටිය. දිග කේශ කලාපයකින් යුක්තය. එය පාදාන්තය දක්වා දිගය. ඇය ප්‍රභාෂ්වර සුදු පැහැතිය. පැහැදිලි සුදු වලාකුළක පාටය. ඇයගේ සියුම් ඝන කය ප්‍රභාෂ්වර සුදු පැහැයෙන් යුක්ත විය. හරියට ශරීරයට හිර වෙන සුදු දිග ගවුමක් ඇඳ සිටියා සේය. ඇයගේ ශරීරයේ දෙපා ප්‍රදේශය සිහින් වී ගොස් තිබිණි. ඇය භික්ෂුව ඉදිරියේ තරමක ඉහළින් සරුංගලයක් පාවෙනවා සේ පාවෙමින් සිටියාය. මෙවැනි රූප දර්ශනය වීමේදී භික්ෂුවගේ ස්වභාවය මේ ආකාරයට පින් දීමය. "මෙම භික්ෂුවගෙන් ඔබට යම් කුසලයක්, පිනක් ගතහැකි නම් එය භික්ෂුවගේ යයි නොසිතා ඔබේ යයි සිතා ඔබ අනුමෝදන් වී සුවපත් වෙන්න" භික්ෂුව මෙසේ සිතූ විට ඇය නැතිව ගියා.

දෙවැනි දවසේ රාත්‍රියේත් ඇය පෙර දින සේම දර්ශනය විය. පෙර දින සිටි ස්වරූපයෙන්ම. එදාද භික්ෂුව පෙර සේම පින් දුන්නා. ඇය නැවතත් නොපෙනී ගියා. මැය මෙසේ දර්ශනය වුවද භික්ෂුවට ඇය ගැන කුතුහලයක්, ඇය දැකීමේ කැමැත්තක් නොතිබිණි. ඇය ගැන මතකයක්ද, අවධානයක්ද නොතිබිණි. නොසිතූ මොහොතක ඇය දර්ශනය වනවා පමණි. මේ වන විට භික්ෂුව සිටියේ දිව්‍ය ලෝක සංඥාවලින් මිදීය. දිව්‍ය ලෝකයත්, එහි ජීවත් වන දෙවියනුත් අසූචි ගොඩක් මත ජීවත් වන පණු කැළක් ලෙස භික්ෂුව අවබෝධයෙන් දැන සිටියේය. එනිසා දිව්‍යාංගනාව භික්ෂුවට තවත් අනිත්‍යභාවයට පත්වන රූපයක් පමණක් විය. මෙසේ පසු වෙද්දී තුන් වැනි දින රාත්‍රියේ ඇය පෙර සේම දර්ශනය විය. තුන් වැනි දිනයේදී භික්ෂුව ඇයට පෙරසේම පින් දුන්නේය. ඇය නොපෙනී ගියාය. ඇය පැමිණි විට විනාඩි දහයක පමණ කාලයක් භික්ෂුව ඉදිරියේ පාවෙමින් සිටින්නීය. හතර වැනි දිනයේදී ඇය පෙර ස්වභාවයෙන්ම භික්ෂුවට දර්ශනය විය. භික්ෂුව දැන් ඇය ගැන අවබෝධය ලබා අවසන්ය. ඇයට දින තුනක් පින් දුන්නද ඇයට පින් අනුමෝදන් වූයේ නැත. ඇයට භික්ෂුව දුන් පින් අනුමෝදන් වූවා නම් පළවෙනි දිනයට වඩා දෙවැනි දිනයේදී ප්‍රභාෂ්වර විය යුතුය. ඇයගේ දිව්‍යශ්‍රීය ධනාත්මක බවක් විද්‍යාමාන විය යුතුය. එහෙත් එය එසේ නොවිණ. ඇය මුල් දිනයේ දර්ශනය වූ ස්වරූපයෙන්ම හතර වැනි දිනයේදීද දර්ශනය විය. මෙයින් පැහැදිලි වන්නේ ඇය පින් අනුමෝදන් නොවූ බවයි. මෙම දිව්‍යාංගනාව අනුන්ගේ පින් අවශ්‍ය නැති, පිනෙන් පිරුණු සශ්‍රීක දිව්‍ය ලෝකයක වැඩ වසන දිව්‍යාංගනාවක් බවයි. ඇයට භික්ෂුව දුන් පින් අවශ්‍ය නැත. ඇයට අවශ්‍ය භික්ෂුව දකිමින් සතුටු වීමටය. නැතහොත් භික්ෂුවට ගරු කිරීමට, නමස්කාර කිරීමටද විය හැකිය. මේ දෙකින් කුමක් සඳහාද යන්න භික්ෂුවට ඇයගේ ඉරියව්වලින් දැනගත නොහැකි විය. ඇය සතුටින් ප්‍රමෝදයෙන් සිටින බව පමණක් භික්ෂුව හඳුනා ගත්තේය. හතර වැනි දිනයේදී භික්ෂුව ඇයට මෙසේ අවවාද කළේය. "ඔබ මොකක්ද මේ කරන්නේ. ඔබ විහිළුවක් කරනවාද?

ඔබ කව්ද? සමහර විට ඔබ භික්ෂුවගේ මිය ගිය මවුද දන්නේ නැහැ. වෙන දිව්‍යාංගනාවක්ද දන්නෙත් නැහැ. මේ භික්ෂුව හෙට අපවත් වෙන්න පුළුවන්. එහෙම වුණොත් ඔබට භික්ෂුව දැකලා සතුටු වෙන්න පුළුවන් කමක් නැහැ. ඔබට පින් අවශ්‍ය වුවද දෙන්න කෙනෙකුත් නැහැ. ඔබ ඔය දිව්‍ය සැප අවසන් වුණාම අසරණ වේවි. නැවත සතර අපායට වැටේවි. එදාට ඔබව බේරාගන්න කවුරුවත් නැහැ. ඒ නිසා ඔබ මේ පින් අනුමෝදන් වෙලා සැපවත් වෙන්න. සතර අපායෙන් මිදෙන්න. මේ භික්ෂුව සේම අනිත්‍ය වඩන්න" කියලා භික්ෂුව අනුමෝදනාවක් කළා. මෙසේ අවවාද කළද ඇය පස්වැනි දිනයේ රාත්‍රියේද පෙර ස්වභාවයෙන්ම භික්ෂුව ඉදිරියේ පාවෙමින් සිටියාය. ඇයට පින් අනවශ්‍ය බව දැන් ස්ථිරය. ඇයට දිය යුත්තේ පින් නොව, ප්‍රඥාව වැඩීමට සංඥාවක් බව භික්ෂුවට අවබෝධ විය. මන්ද අනුන්ගේ පින් අනවශ්‍ය, මහා පිනැති දිව්‍යාංගනාවක් නිසාය. ඇය සසර ප්‍රඥාව වඩා ඇත. එහෙත් දිව්‍ය ලෝකයේ කාම සම්පත් මැද කෙළිලොල් දිවියක් ගත කරන නිසා ප්‍රඥාව යටපත් වී සැඟවී ගොස් තිබේ. භික්ෂුව දිව්‍යාංගනාවගේ සැඟවී තිබූ ප්‍රඥාව මතු කර දීමට ඇයව මෙසේ දැනුවත් කළේය.

"පුතේ ඔබට මේ භික්ෂුව කථාකරන අවසාන අවස්ථාව. ඔබට දෙන අවසාන අවවාදය. දින හතරක්ම භික්ෂුව ඔබට පින් දුන්නා. ඔබ ඒවා අනුමෝදන් වූයේ නැහැ. ඔබ භාග්‍යවන්තියක්. ඔබ මේ භික්ෂුව දෙස හොඳින් බලන්න. භික්ෂුව පරිහරණය කරන තුන් සිවුර දෙස හොඳින් බලන්න. එක වේලෙන් පමණක් පිණ්ඩපාතයෙන් යැපෙන මේ භික්ෂු ජීවිතය දෙස හොඳින් බලන්න. මේ සයනය, මේ කුටිය දෙස බලන්න. භික්ෂුවගේ ප්‍රතිපදාව දෙස බලන්න. භික්ෂුවගේ අතහැරීම දෙස බලන්න. මේ භික්ෂුව අනිත්‍ය වඩන්නේ යම් සේද ඔබද ඔය දිව්‍ය සැප, දිව්‍ය ඕජාව, දිව්‍ය ශරීරය, ඔය රූපය අනිත්‍ය බව දකින්න. ඔය ඇස, කන, නාසය, දිව, ඕලාරික ශරීරය, සිත අනිත්‍ය බව දකින්න. කවදාහරි දිනයක ඔය දිව්‍ය සැප අනිත්‍යභාවයට පත්වී

ඔබ දිව්‍ය ලෝකයෙන් චුතවේවි. දිව්‍ය සැප අහිමි වන බව දැකලා ඔබ එදාට හඬා වැටේවි. ඔබ ඔය සැපෙන් මිදිලා සතර අපායට වැටේවි. ඔබ ඔය විඳින සිත ඔබේ නොවෙයි කියලා අතහරින්න. ඔය ස්වර්ණ හංසියක් බඳු කය ඔබට අයිති නැති අනිත්‍යයට අයත් දෙයක් යැයි කියලා අතහරින්න. සියල්ල අනිත්‍ය බව දකින්න. මේ භික්ෂුව ඔබව දකින අනිත්‍ය සංඥාවෙන්ම ඔබ භික්ෂුව දෙස බලන්න. මේ භික්ෂුවද මැරෙන, ලෙඩ වෙන, වයසට යන ස්වභාවයෙන් යුක්ත බව දකින්න. මේ භික්ෂුව දෙස නැවත නැවත බලන්න. ඔබ අවබෝධය ලබන්න. ධර්මය දැක්ක කෙනෙක් වෙන්න. ඔබ සෝවාන් ඵලයට පත්වෙන්න. දිව්‍ය ලෝකයෙන්, සතර අපායෙන් මිදෙන්න. බ්‍රහ්ම ලෝකයට ගොස් කල්ප ගණනක් වුවද ගතකරන්න. ඒකට ප්‍රශ්නයක් නැහැ. මොකද කවදාවත් ඔබ නැවත සතර අපායට වැටෙන්නේ නැහැ. භික්ෂුවට අවශ්‍ය ඔබව සතර අපායෙන් මුදවන්න. භික්ෂුව කියන දෙය ඔබ අසන්න" භික්ෂුව රාත්‍රියේ පැය කාලක් පමණ ඉහත බණ ශබ්ද නගලා දේශනා කළා. එදායින් පසු නැවත එම දිව්‍යාංගනාව නොපැමිණියාය. නොදුටුවේය. ඇයට කුමක් වූයේදැයි භික්ෂුව නොදනී. එහෙත් ඇය සසර ප්‍රඥාව වඩා පුරුදු දිව්‍යාංගනාවක් නිසා භික්ෂුව විසින් දේශනා කරන ලද අනිත්‍ය සංඥාව ඒ මොහොතේම අවබෝධ වීමෙන් ඇය සතර අපායෙන් මිදී මාර්ගඵලලාභී දිවයාංගනාවක් වෙන්නට ඇතැයි, භික්ෂුව අනුමාන කරයි. එහෙත් එය නිවැරදිව නොදනිමි.

භික්ෂුවට දිව්‍යාංගනාව දර්ශනය වන්නේ සමාධිය තුළ සිටියදීය. එහෙත් ඇයට බණ කියන විට ඇය සමඟ කථා කරන විට සමාධිය නැතිවන නිසා ඇයව දර්ශනය නොවේ. එහෙත් ඇය එහි සිටින බව භික්ෂුව දනී. එම දිව්‍යාංගනාවගේ සුකුමාල බව, සැහැල්ලුව, ලාලිත්‍යය, රිද්මය කොතෙක්ද කිවහොත් ඇය පෘථග්ජන ස්වභාවයේ කෙනෙකුට කාමයේ පාරාදීසයකි. දිව්‍ය ලෝකය යනු එවැනි කාම පාරාදීසයකි. මෙවැනි කාම ලෝකයක් ඔබ නිරතුරුවම ප්‍රාර්ථනා කරන්නේ නම් එය මහා මුලාවකි.

දිව්‍යසැප නිරතුරුවම ඔබට අකුසල් රැස්කර දෙන්නකි. මන්ද ඔබ තුළ භවයට ඇති කැමැත්ත නිසා නිරතුරුවම තණ්හාවෙන් සිත පිරී පවතී. දිව්‍ය සැප විඳීම යනු මෙම කාම ලෝකය තණ්හාවෙන් බදා ගැනීමයි. රස විඳීමයි. ඒ තණ්හාව නිසා ඇතිවන අකුසල් වලින් ඔබව නැවත සතර අපායට ගාල් කරයි. එහෙත් මෙම දිව්‍යාංගනාව මිනිස් ආත්මවල ඉපිද ප්‍රඥාව වඩා තිබුණු නිසා ලැබුණු අවස්ථාවෙන් ප්‍රයෝජනය ගැනීමට ඇයට සමහරවිට හැකි විය. ඔබද කුමන පින්කම කළද එම පින්කම්වල අනිත්‍ය ස්වභාවය, අනිත්‍ය සංඥාව වැඩීමට සරලව හෝ පුරුදු වෙන්න. දිනකට ඔබ පැය කාලක් අනිත්‍ය සංඥාව වැඩුවොත් එය ඔබේ ආධ්‍යාත්මය තුළ තැන්පත් වෙලා කවදාහරි දවසක ඔබට සසර දුකින් ගැලවෙන්න උපකාර වෙනවා.

ඉහත දිව්‍යාංගනාවත් අතීත භවවල පින්කම් කරලා අනිත්‍ය සංඥාව සරලව හෝ වඩා තිබූ නිසයි පින්කම් නිසා දිව්‍ය සැපත්, අනිත්‍ය සංඥාව වැඩීම නිසා (ලැබුණා නම්) මාර්ගඵල සැපත් ලැබුණේ. දිව්‍ය ලෝකවල වැඩ සිටින දෙවිවරු තුළ මනුෂ්‍ය ලෝකයේදී වඩන ලද ප්‍රඥාව ඇත. එහෙත් දිව්‍ය ලෝකයේ කාම සම්පත් නිසා ප්‍රඥාව යටපත් වේ. මෙම දිව්‍යාංගනාවද භික්ෂුව ඉදිරියට පැමිණියේ සතුටු වීම සඳහාය. එහෙත් භික්ෂුව ඇයට සුදුසුම කමටහනින් යටපත්ව තිබූ ප්‍රඥාව මතුකර දුන්නා යැයි අනුමාන කරමි. මේ සෑම දෙයක්ම ධර්මයේ ආශ්චර්යයන්ය. භික්ෂුවගේ ආශ්චර්යයක් නොවේ. ඔබත් සියල්ල අතහරින්න. එවිට ඔබට සියල්ල ලැබේවි. සියල්ලම ඔබට ලැබෙන විට ඒ කිසිවක් ඔබට අවශ්‍ය නොවේ. මන්ද ඔබ සියල්ලම අනිත්‍ය වශයෙන් අවබෝධකර ඇති නිසාය.

ඔබ ලක්ෂ ගණන් ධනය කාලය වියදම් කර පින්කම් සිදු කරමින් ප්‍රාර්ථනා කරන ලෙස ස්ථිරවම ඔබ මහා සැප සහිත දෙවියෙක්, දිව්‍යාංගනාවක් වුනොත් මෙවැනි සුකුමාල දිව්‍ය කුමාරයන්, කුමරියන් ඔබව කුල්මත් කරාවි. ඔබව පිස්සු වට්ටාවි. අවසානයේ ඔබට හිමිවන්නේ භවයේ පිස්සන් කොටුව වන සතර අපායමය.

වර්තමානයේද භවයේ පිස්සන් කොටුවේ දුක් විඳින්නේ අතීතයේ අනන්ත අප්‍රමාණ දිව්‍ය මනුෂ්‍ය සැප විඳි කෙළිලොල් දිව්‍ය දිව්‍යාංගනාවන්ය. එදා දිව්‍ය ඕජාව, රාජ භෝජන වැළඳි ඔවුන් අද සතර අපායේ සෙම්, සොටු, මළ මුත්‍රා, ගින්දර, පුන්නක්කු, තණකොළ අනුභව කරයි. මෙය නිමා නොවන චක්‍රයකි. පටන් ගැන්මක්, අවසානයක් නොමැත. ඔබට ඇත්තේ වටේයෑම පමණකි. ඔබට මින් ගැලවීමට අවශ්‍ය නම් චක්‍රයම නිවා දැමිය යුතුය. ඔබම අවුලුවා ගන්නා ගින්න කවදා හෝ දිනයක ඔබම නිවාගත යුතුය. එය වෙන අයකුට කළ නොහැක්කකි. මන්ද ගිණි අවුලුවන්නේ ඔබම නිසාය. ඔබම අවුලුවා ගන්නා ගින්නකින් ඔබම දැවෙන අංක එකේ මෝහ බරිත සත්ත්වයා පෘථග්ජන සත්ත්වයාය.

ඔබට ඉහත කථාව කියවන විට හිතෙන්නට ඇති අනේ මටත් මේ අත්දැකීම ලබන්නට ඇත්නම් කියලා. ඔබ එහෙම සිතුවොත් ඔබට මෙම අත්දැකීම කවදාවත් ලබන්න බැහැ. ඔබට එම අත්දැකීම ලබන්න නම් ඇති වූ එම කෙලෙස් සිත අනිත්‍ය වශයෙන් දැකලා අතහරින්නට ඕනේ. එවිට ඔබට දිව්‍යාංගනාවක් නොව දිව්‍යලෝකයම දැකිය හැකිය. එහෙත් ඔබ ජයග්‍රාහකයෙක් වන්නේ දිව්‍යාංගනාවක්, දිව්‍ය ලෝකය දැකීමෙන් නොව දිව්‍ය ලෝකයම අතහැරීමෙන්ය. දිව්‍ය සැප දකින, පතන සිත තිබෙන තාක් ඔබට දිව්‍ය ලෝකය අත්හළ නොහැක. ඔබ එහි පදිංචිකරුවෙකි, සාමාජිකයෙකි. කුළිය, සාමාජිකත්වය ඉවර වුණු තැන, වෙන තැනක් සොයා යා යුතුය. අලුත් තැන සොයා ගන්නේද ඔබ විසින්මය. මේ මොහොතේ ඔබ ඉන්නා තැන තෝරා ගන්නේද ඔබමය. ඔබම තෝරා ගන්නා ජීවිතයට මොන තරම් ප්‍රශ්න තිබුණද ඔබ නොගැටෙන්න. ඔබ ගැටුණොත් ඔබේම තෝරාගැනීමට ඔබ කරන ද්‍රෝහිකමකි.

මිනිසුන් සියයට සියයක්ම රෝගී වන්නේ ඉන්ද්‍රියන් හය පිනවීමට යෑම නිසාය. දිවට, කයට රස පහස සොයන්නට

යැම නිසාය. දියවැඩියාව, අංශභාගය, කොලෙස්ටරෝල්, ලිංගික රෝග, සමේ රෝග...

රිය අනතුරකින් අංග විකල වන රෝගියාට එසේ වූයේ රියදුරා මත් වතුර බීම නිසාය, නැතිනම් අධික වේගය නිසාය. එසේත් නැතිනම් පදිකයාගේ නොසැලකිල්ල නිසාය. මේ සියල්ල තුළ තිබෙන්නේ තණ්හාවය. අපි වේගයෙන් යන්නේ යමක් ඉක්මනින් ස්පර්ශ කිරීමටය. වැඩිපුර අයිති කරගැනීමටය. පළවෙනියා වීමටය. සියල්ල තුළ තණ්හාවයි තිබෙන්නේ. සැප සෙවීමේ මෙහෙයුම නිසා මිනිසා දුකට පත්වී රෝගීභාවයට පත්වී අසරණ වනවා සේම, දිව්‍ය ලෝකයේ දෙවියන්ද දිව්‍යාංගනාවන්ද සැප පසුපස හඹා යැම නිසා මනුෂ්‍යයන් සේම පිරිහීමට පත්වී දුකට ඇද වැටේ. ඔබ පතන ආශ්චර්යමත් දිව්‍ය සැප ගැන ඔබ විවේකීව නැවත සිතා බලන්න. දිව්‍ය සැපත ඉහත ස්වභාවයමය. එහෙත් දිව්‍ය ලෝකයේද සීලයෙන් පරිපූර්ණ කුසල් ධර්මයන් වඩන මහේශාඛ්‍ය දෙව්වරු සිටිති.

# සැපයෙන් එහා ගිය
# නිදහස්වීමක හිමිකරුවෙකි ඔබ

විඤ්ඤාණ ධාතුවේ ආධිපත්‍යයට නතු වී ජීවත්වන ලෝකයේ බහුතරයක් ජනතාව අදහන ආගම්වල දෙවියන් බ්‍රහ්මයන් තමන්ගේ ගැලවුම්කරුවන් ලෙස දකිනවා. එම පින්වතුන් එහෙම කියන එක සාධාරණයි. මොකද එම ආගම්වල ශාස්තෘවරුන්, ආගම් නායක උතුමන්, පූජක උතුමන්, බ්‍රහ්ම දිව්‍ය සංඥාවලින් ඔබ්බට ගිය පින්වත් පිරිසක් නොවේ. ඒ නිසා ඒ අය දිව්‍ය සැප රූපී අරූපී බ්‍රහ්ම සැප උපාදානය කොටගත්තා. ඉන් ඔබ්බට යන්න ඒවායේ අනිත්‍ය දකින්න එම පින්වතුන්ට හේතු සකස් උනේ නැහැ. ඉහත සැප කෙරෙහි ඇති කරගත් ඡන්ද රාගය නිසා එම පින්වතුන් දිව්‍යතල, බ්‍රහ්මතලවල කොටු වුණා, හිරවුණා. එහි ප්‍රතිඵලය නැවත භවයක් සකස් වීමයි. ඒ කියන්නේ ජාති, ජරා, ව්‍යාධි, මරණවල හිමිකරුවන් වීම. ලෝකයේ යම් පුරුෂයෙක්, ස්ත්‍රියක් දෙවියෙක් ළඟට බ්‍රහ්මයෙක් ළඟට යන්න ප්‍රාර්ථනා කරනවා නම් ඔහු ප්‍රාර්ථනා කරන්නේ ජාති, ජරා, ව්‍යාධි, මරණවලින් යුත් භවයක්. මෙහි භයානකකම වන්නේ මොවුනට ලැබෙන්නේ මිථ්‍යාදෘෂ්ටික භවයක් වීමයි. අප බෝධිසත්වයන් වහන්සේද සංසාරයේ අනන්තවත් මිථ්‍යාදෘෂ්ටිකව ඉපදිලා තිබෙනවා. මේ යථාර්ථය ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධ ඥානයෙන් දැක්ක නිසයි දෘෂ්ටීන් හැට ගණනාවක් තිබුණ ඉන්දියාවේ මේ සෑම දෘෂ්ටියකටමත් එහි නිර්මාතෘවරුන්ටත් කරුණාව, මෛත්‍රිය දැක් වූවේ. අපටත් කරුණාව, මෛත්‍රිය දක්වන්න ඉගැන්නුවේ. මේවා ලෝකයේ ස්වභාව. ලෝකයේ

බහුතරයක් පින්වතුන් දිව්‍ය තල, බ්‍රහ්ම තල උපාදානය කරගැනීම සාධාරණයි. මන්ද දිව්‍ය, බ්‍රහ්ම සංඥාවලින් ඔබ්බට ගිය ලෝකය එම පින්වතුන් නොදැක්ක නිසා. ඒක එම පින්වතුන්ගේ වරදක් නොවේ. එයත් ජයග්‍රහණයක්. නමුත් මේ ජයග්‍රහණයේ ආශ්වාදය කෙළවර වන්නේ දුකෙන්. ඒ ඔවුන් සතර අපායෙන් නොමිදී ඇති නිසා.

මනුෂ්‍යයා ආශ්‍රිතව ජීවත්වන සතර අපායෙන් නොමිදුනු දෙවිවරු භික්ෂූන්ට අරමුණු වී ඇත. මේ දිව්‍ය තල, බ්‍රහ්ම තලවලින් නවතින කථාවක්. ඉන් ඔබ්බට ගිය දර්ශනයක් මේවායේ නැහැ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මේ දිව්‍ය තල, බ්‍රහ්ම තල ඉක්මවා ගොස් ලෝකයෙන් එතෙරවන මාර්ගය දේශනා කළ ශාස්තෘන් වහන්සේ නමක්. ගෞතම බෝධිසත්ත්වයන් වහන්සේ ජය ශ්‍රී මහා බෝධි මූලයේදී ඔය දිව්‍ය තල, බ්‍රහ්ම තල සැපයන්ට මුලා වුණේ නැහැ. වසවර්ති මාරයාගේ මාර දූවරුන් නොයෙක් කාමාභිනන්දන රැඟුම් දර්ශන ඉදිරිපත් කරමින් මෙම දිව්‍ය තල, බ්‍රහ්ම තල සශ්‍රික බව සැපය ගැන විසිතුරු පෙන්නුවද උන්වහන්සේ ඒවාට මුලා වුණේ නැහැ. උන්වහන්සේ සෑම දිව්‍ය, බ්‍රහ්ම තලයක්ම ප්‍රඥාවෙන් පීර පීරා බැලුවා. යම් තැනක හෝ ඉඳිකටු තුඩක් ගැසීමට තරම්වත් ප්‍රමාණයේ නිත්‍ය සැපයක් තිබෙනවාද කියලා. උන්වහන්සේ ප්‍රඥාවේ ඥාන දර්ශනයන් ලබමින් අවබෝධ කළා මේ සියල්ල අනිත්‍ය බව. ජාති, ජරා, ව්‍යාධි, මරණවල තෝතැන්නක් බව. සියලු ලෝකයන්ගේ අනිත්‍යභාවය ප්‍රඥාවෙන් අවබෝධ කර මේවාට ඇති කැමැත්තෙන් මිදෙන විට සිත පිහිටන්න උන්වහන්සේට වෙන තැනක් තිබුණේ නැහැ. ඒ සිත නැවතුනේ ලෝකයෙන් එතෙර වුණ නිවන අවබෝධය තුළමය.

ඉහත සටහනට උපකාර වශයෙන් භික්ෂුවක් සමාධියෙන් පසුවෙන විට දුටු දර්ශනයක් මෙහි සටහන් තබනවා. භික්ෂුවක් සිංහරාජයට යාබද ආරණ්‍යයකට පැමිණි දෙවැනි දින රාත්‍රියේ සමාධියෙන් පසු වෙද්දී භික්ෂුව ඉදිරියේ හැඩි දැඩි අඩි හය

හමාරක් පමණ උසැති මස්පිඬු හොඳින් වැඩුණු, තදින් පිහිටි තේජස් සහිත, ව්‍යායාම කළ ශරීරයක් සේ ශක්තිමත් ශරීරයක් සහිත දිව්‍යරූපයක් දර්ශනය වුණා. සුදු අත් කොට කමිසයක් සහ සුදු සරමක් ඇඳගෙන සිටියා. ප්‍රභාශ්වර, දිලිසෙන සුදු පැහැයක් ඇඳුමේ තිබුණා. ලා කහ පැහැති ප්‍රසන්න මන බඳනා රූපයක්. ඔහු භික්ෂුව දෙස නොසෙල්වී ඍජුව විනාඩි තුනක් පමණ නිහඬව බලාසිට නොපෙනී ගියා. මේ දිව්‍ය රූපය කාගේද කියන්න භික්ෂුව දන්නේ නැහැ. නමුත් එකක් විශ්වාසයි. මේ කන්දට ආරණ්‍යයට අධිපති අල්පේශාඛ්‍ය දෙවියෙක් බව. භික්ෂුව මේ ආරණ්‍යයට ආගන්තුක නිසාත් මෙවැනි දිව්‍ය ස්වභාවයන් මීට පෙර ආරණ්‍යයේ කිසිවෙක් දැක නොතිබූ නිසාත් මෙම දෙවියා කවරෙක්ද යන්න භික්ෂුව දන්නේ නැහැ.

සතියක් පමණ ගතවෙද්දී උදෑසන 4.30 ට පමණ භික්ෂුව පිටුපස විශාල ආලෝකයක් හැටියටද දිව්‍ය ආලෝකයක් පැමිණියා. මෙම ආලෝකය බස් රථය ඉදිරි ප්‍රධාන විදුලි ලාම්පුව තරම් විශාල ආලෝකයක්. එහෙත් මොහොතකින් මෙම ආලෝකය අතුරුදන්වීම නිසා මෙම ආලෝකය වශයෙන්ද පැමිණියේ ඉහත දිව්‍ය ස්වභාවයම බව භික්ෂුව අනුමාන කරා. අවශ්‍ය විටක මනුෂ්‍ය ස්වරූපයේ සියුම් ස්වභාවයෙනුත් අවශ්‍ය විටක ආලෝකයක ස්වභාවයෙනුත් පෙනී සිටීමට මෙම දෙවිවරුන්ට හැකියාව ඇතැයි ඉහත සිද්ධියෙන් භික්ෂුව අනුමාන කරයි.

ඉහත ආරණ්‍යයේ සති දෙකක් පමණ වැඩසිටියදී, දිනක් දහවල් දානය පූජා කළ පිරිස පින් අනුමෝදන් කිරීමට අවශ්‍ය අයගේ නම් කොළ කැබැල්ලක සටහන් කර නායක ස්වාමීන් වහන්සේ අතට දුන්නා. මෙහි සඳහන් වෙනවා මියගිය අම්මා, තාත්තාගේ නම් සහ වීදියබණ්ඩාර සෙනවිතුමාට පින් පිණිසයි කියලා. අන්න ඒ අවස්ථාවේ භික්ෂුව සොයල බැලුවා කවුද මේ වීදියබණ්ඩාර සෙනවිතුමා කියලා. මේ ආරණ්‍යයේ පිහිටි ගල් පර්වතයේ තමයි අතීතයේ වීදියබණ්ඩාර සෙනවිතුමා තම භේවා බලඇණි සමග පලාවිත් කඳවුරු බැඳගෙන තිබෙන්නේ. මේ

ගමේ සමහරු එම හේවා භටයින්ගෙන් පැවතෙන අය. ඒ නිසා මොවුන් වර්තමානයේදීත් සෙනවිතුමා සිහි කරලා පින් දෙනවා. මේ කරුණු ටික ඇසෙන විට භික්ෂුව අනුමාන කළා ඉහත ප්‍රතාපවත් දිව්‍ය ස්වභාවය සහ දිව්‍ය ආලෝකය වීදියබණ්ඩාර සෙනවිතුමාගේ පරලොව දිව්‍ය ජීවිතය බව. එම සෙනවිතුමා ජීවත්ව සිටි ස්වරූපයේ රූපයට සමාන ප්‍රතාපවත් රූපයක් සහිත සම්‍යක්දෘෂ්ටික අල්පේශාඛ්‍ය දෙවියෙක් ලෙස ආරණ්‍යය පිහිටි කඳු ගැටය උපාදානය කරගෙන ජීවත් වෙනවා විය හැකියි.

දැන් අපි බලමු මේ දිව්‍ය ස්වභාවය ඇයි මේ කඳු ගැටය උපාදානය කරගෙන මෙහි ආරක්ෂක දෙවියෙක් වශයෙන් ජීවත් වෙන්නේ කියලා. එයටත් අනුමාන වශයෙන් හේතුවක් භික්ෂුවට දැනගන්නට ලැබුණා. ඒ තමයි මේ කඳු ගැටය යම් ආරක්ෂිත ස්ථානයක ආභරණ සහිත නිධානයක් ඇතැයි කියන විශ්වාසය. මෙය ඇත්තක් නම් මෙම ආභරණ නිදන් කරන්නට ඇත්තේ පරාජය වීමකදී හෝ පලා යාමකදී ඒවයේ ආරක්ෂාවට වීමට පුළුවන. මැරෙන මොහොතේදී ඒවා කෙරෙහි ඇති වූ ඡන්ද රාගය නිසා සෙනවිතුමා මරණින් මතු ආරක්ෂක දෙවියෙක් ලෙස මෙම කඳු ගැටය උපාදානය කර උපත ලැබුවාද විය හැකියි.

දිව්‍ය ජීවිත ගත කළද මේ සියල්ලෝම ජාති, ජරා, ව්‍යාධි, මරණ සමග ලෝකය තුළම ජීවත් වන්නේය. සමහර විටක මේ අය ඔබට ලෞකික වශයෙන් උපකාරයන් කළ හැකිය. නමුත් මේ කිසිවෙකුට අන් අයෙකුට සසර දුකින් මිදීම සඳහා පිහිට විය නොහැක. මන්ද තමාද භවය උපාදානය කරගෙන ජීවත් වන නිසාය.

ඉහත දිව්‍ය ස්වභාවයන් සශ්‍රික දිව්‍ය ලෝකවල ජීවත් වන දිව්‍ය ස්වභාවයන් නොවේ. යම් යම් කැමැත්තන් කෙරෙහි ඡන්ද රාගය ඇතිකරගෙන ඒවා නිත්‍යභාවයෙන් ගැනීම නිසා මනුෂ්‍ය ලෝකයේම මනුෂ්‍යයන් ඇසුරේ පිරිසිදුභාවයෙන් ජීවත් වන දෙවිවරුන්ය. ලොව්තුරු බුදුරජාණන් වහන්සේගේ

ධර්මය ලෝකයාට ස්ථිර සැප ඇති තැනක් මේ ලෝක ධාතුව තුළ නැතැයි පැහැදිලිව දේශනා කර ඇත. හේතුඵල ධර්මයන් නිසා සකස්වුණ නිරතුරුවම අනිත්‍යභාවයට පත්වෙන ලෝකය උන්වහන්සේ ප්‍රඥාවේ අවබෝධයෙන් අභිබවා ගියහ. කවදාහරි දිනයක ඔබත් මමත් අපේක්ෂා කරන නිවීම තුළද ඇත්තේ සැපයක් නොව නිදහස් වීමක්මය. නිදහස ලබන්නේ දුක සහ සැපය යන දෙකින්මය. ලොව්තුරා සම්මා සම්බුද්ධ ඥානයෙන් අවබෝධ කර වදාළ මේ යථාර්ථය අන් දෘෂ්ටීන් සමග කෙසේ නම් සසඳන්නද? ගලපන්නද? ඉහත දෘෂ්ටීන් සතර අපායවල් ඉක්මවා නොගිය ස්වභාවයක්ය. එහෙත් මේ සටහන කියවන ඔබ සැබෑම වාසනාවන්තයෙකි, දක්ෂයෙකි. සතර අපායෙන් මිදීමේ මාවත පින්වත් ඔබලාට තවම විවෘතය. සමහරවිට පින්වත් ඔබ දැනටමත් අවබෝධාත්මකව සතර අපායෙන් එතෙරවූ දක්ෂයෙක් වීමටද එම මාර්ගයේ ගමන් කරන අයෙක් වීමටද පුළුවන. සැබවින්ම ඔබ එසේ නම් කෝටි ප්‍රකෝටි ගණන් මිනිසුන් අදහන දෙවියන් බ්‍රහ්මයන්ට වඩා ඔබ වැඳුම් පිදුම් ලැබීමට සුදුස්සෙකි. අන්‍යයන්ට මාර්ගය කියා දීමට සැබෑම ලොව්තුරු බුද්ධ වචනයම, අර්ථයම කියාදෙන කල්‍යාණ මිත්‍රයෙක් වීමට සුදුස්සෙකි.

# ඵලය ගැන දුක් වීම පසෙක තබා හේතුව ගැන සොයන්න

බෞද්ධයෙක් වේවා අබෞද්ධයෙක් වේවා කෙනෙක් මිය යෑමෙන් අනතුරුව දෙවියෙක් බ්‍රහ්මයෙක් ලෙස ලබන උපත භව නිරෝධයට ඇති මාර්ගය ලෙස පිළිගන්නවා නම් ඔවුනට සසරින් ගැලවීමට ඇති දුරද අසීමාන්තිකය. මන්ද ඔවුන් මනුෂ්‍ය ලෝකයේ මනුෂ්‍යයන් වශයෙන් ජීවත් වුවද සතර අපායෙන් ඔබ්බට සිත පිහිටුවීමට අපොහොසත් නිසාය. ඒත් මේ සෑම පින්වතෙක්ම ජීවත්වන ලෝකය තුළ ධර්මය සන්දිට්ඨිකව ඇත. මාර්ගඵලලාභී දෙවියන්, මාර්ගඵලලාභී බ්‍රහ්මයන් වීමට මාර්ගය විවෘතව ඇත. නමුත් බහුතරයක් අතරමග නවාතැන් පොළවල තාවකාලික සැපයන්ට මුලා වී නවාතැන් ගෙන ඇත. පින්වත් ඔබ කුමන ජාතියක ආගමක වුවද ධර්ම මාර්ගයේ නවාතැන් නොගෙන අවංකවම වීර්යයෙන්, සතියෙන්, සිහියෙන් හිරිඔතප් දෙක සහිතව පෙරට යන්න, ඔබට බොහෝ දේ හමුවනු ඇත. බොහෝ දේවල් යැයි සඳහන් කළේ රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන සියල්ලන්මය. සිත ක්ෂණයෙන් අනිත්‍ය වී ගියද අනිත්‍ය වූ සිත තුළ මේ ''ලොකු ගොඩ" ක්‍රියාත්මකව තිබේ. භවය සඳහා මග වියදම් ඉතිරිකර දෙන්නේ මේ ක්‍රියාත්මකභාවයයි. ඇති වෙමින් නැති වෙන එක සිතකට ඔබට මහා දුකක් හෝ මහා සැපක් උරුමකරදීමේ හැකියාව ඇත. ඔබ කැමැති දෙය ඔබේ කැමැත්ත පරිදි තෝරා ගැනීමට ඔබට හැකිය. මේ කැමැත්ත අකැමැත්ත දෙක වගේම ඒ දෙක අඩු තැන ඇති උපේක්ෂාව තුළද ඇත්තේ අනිත්‍යභාවයට පත්වෙන දුකක් හෝ සැපයක් බව

අවබෝධ කර ගතහොත් ඔබට ඉහත සියල්ල අවබෝධයෙන් අතහැරෙනු ඇත. මන්ද ඔබ ගොඩම, දුකේ නිර්මාණකරුවන් ලෙස අවබෝධයෙන් හඳුනාගත් නිසාය.

මේ සසරෙහි ඔබත් මමත් පැමිණි දුර ඉලක්කම් වලින් සටහන් කළ නොහැක්කකි. එහෙත් ඔබටත් මටත් දැනෙන්නේ අපි මේ ජීවිතයේදීත් පෙර ජීවිතයේදීත් පමණක් පැමිණි ගමනය. භවයේ දුර, ගැඹුර වසා දමන මාර අස්බැන්දුමෙන් අප මිදිය යුතුය. නිවීම ගැන සතර අපායෙන් මිදීම ගැන ධර්මය ඇසෙන, සැබෑම සද්ධර්මය සම්බුද්ධ වචනයම ඇසෙන මේ තීරණාත්මක අවස්ථාවේ පින්වත් ඔබ වීර්යය කළ යුත්තේ ලොව්තුරා බුදුසමිඳුන් දැක නිවන් දැකීමට නොවේ. නිවන් අවබෝධ කර අවම වශයෙන් සතර අපායෙන් මිදී ලොව්තුරා බුදු සමිඳුන්ව දැකීමටය. මෙවැනි ශාසන පරිහානියක් කරා යන යුගයක බුදුන් දැක නිවන් දැකීම යනු මාර ධර්මයකි. පින්වත් ඔබ දුකෙන් දුකට යෑමකි. මේ ලැබූ ජීවිතයේදී එහි දුක සැප ඔබ විසින්ම නිර්මාණය කරගත් එකකි. නිර්මාණය දුක නම් නිර්මාණය කළු නම් එහි සැබෑ නිර්මාපකයා සොයා පිළියම් කරනවා මිස තවත් පිටස්තරයකුට නිරපරාදේ චෝදනා නොකරන්න. ඵලය ගැන දුක් වීම පසෙක තබා හේතුව ගැන සොයා බැලීමෙන් ඔබට මේ තත්ත්වයෙන් මිදිය හැකිය. මේ මොහොතේ ඔබ ජීවිතය තුළින් අත්විඳින රූපයේ අවපැහැය, අල්පේශාඛ්‍යභාවය, වත්පොහොසත්කමේ අඩුව මේවා ගැන දුක් වීම පසෙක තබා මේවා මේ ජීවිතයේ නොලැබීමට හේතුවත් ඒවා ලැබීමට මාර්ගයත් සොයා බලන්න. ඔබ කැමති සැප ලැබීමේ මාර්ගය ලබන්න නම් නොලැබීමට හේතු වන්නාවූ අකුසලයන් ජීවිතයෙන් අතහරින්න. බොහෝම නිරවුල්ව ඔබට මෙය තෝරා ගන්න පුළුවන්.

බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළ ධර්මය තුළ ඔබ ජීවිතයේ වැඩිම වුවහොත් අවුරුදු 100 ක් ජීවත් වෙයි. එය තමයි උපරිමය. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ගන්නාවූ හුස්ම පොද ඉහළට අරගෙන පිට කරන මොහොතේ මරණය

සිදුවිය හැකිබව. එය තමයි අවමය. ඒ නිසා ඔබට ජීවත් වීමට ඇති කෙටි කාලයේදී බොහෝම ඉවසීමෙන් ජීවිතය නිවැරදි මගට ගන්න. ඊළඟ සුගතිගාමී ජීවිතය සඳහා මේ කෙටි කාලය කළමනාකරණය කරගන්න. තමා පෙර ජීවිතයේ කරගත් දෙයට තමා වර්තමානයේ වෛර කරන්න යන්න එපා. මේ ජීවිතයේ ඔබට ලැබුණු දුර්වල රූපය, අධ්‍යාපනය, රැකියාව, විවාහය, සමාජ තත්ත්වය ගැන නැවත නැවත දුක්වීම පසෙක තබා දානය, සීලය, මෛත්‍රීය, තෙරුවන් ගුණ ගැනම සිතන්න. නොලැබූ දෙය ලබා ගැනීමේ මාර්ගයට අවතීර්ණ වන්න. ඉවත් වීමට ඉතිරිව ඇති ඉතිරි කෙටි කාලය අවුරුදු ලක්ෂ ගණනින් ආයුෂ විඳින සශ්‍රික ප්‍රභාශ්වර ආයුෂ, සැප, වර්ණ, බලයෙන් අනූන දෙවියෙක් දිව්‍යාංගනාවක් වීම උදෙසා කැපකරන්න. මේ ජීවිතයේදී ඔබට අර්ථාන්විත ලෙස යෙදිය හැකි සැබෑම ලාභදායී ව්‍යාපාරය එය බව හඳුනාගන්න. පින්කම් සිදුකරමින් දේවානුස්සතිය වඩන්න. ඔබම වැටුණු වළෙන් ඔබම ගොඩ එන්න. ද්වේෂයේ, මෝහයේ උදැල්ලෙන් එම වළ තව තව ගැඹුරු නොකරගන්න. දානය, සීලය, මෛත්‍රීයෙන් එම වළ පුරවා ස්වඋත්සාහයෙන් ඔබම වළෙන් ගොඩ වී සුගතියේ සුර පුරයට ගොඩවදින්න. හැබැයි ඔබ සියලු යසඉසුරින් සපිරි දෙවියෙක් දිව්‍යාංගනාවක් ලෙස සශ්‍රීක දිව්‍ය තලයක උපත ලැබුවද එම දිව්‍ය තලයේම ජීවත්වෙන මහේශාඛ්‍ය දෙවිවරුන් දිව්‍යාංගනාවන්ගේ රූපශ්‍රීය අසිරිය ප්‍රභාශ්වර භාවය දැක එතැනදී ද ඔබට හීනමානය, ද්වේෂය ඇතිවීම ස්වභාවයක්මය.

අතීතයේ මනුෂ්‍යයන් ලෙස බුදුරජාණන් වහන්සේලාට මහරහතන් වහන්සේලාට සියතින් සිව්පසය පූජා කර සිල් ආරක්ෂා කරලා මෛත්‍රිය වඩා එම පිනෙන් දෙවියෙක් වූ අප්‍රමාණ පිනෙන් පිරි දෙවියන් දිව්‍ය තලවල වෙසෙයි. ඔවුනගේ සශ්‍රිකභාවයට ළං වීමට වර්තමානයේ හෝ අනාගතයේදී එම දිව්‍ය තලවල උපත ලබන කිසිවකුට නොහැකිය. මන්ද අතීතයේ කළ අති දුර්ලභ පින්කම් සිදුකර ගැනීමට බුදුරජාණන් වහන්සේද, මහ රහතන් වහන්සේලාද අපිට හමු නොවන නිසාය. එහෙත් ඔබ දක්ෂ නම්

සතිය සිහිය තියුණු නම් ඔබට ප්‍රතිහාර්යයන් සිදු කරගත හැකිය. මේ යථාර්ථයන් ඔබ අවබෝධකර නොගතහොත් සුගතියද ඔබට දුකක් විය හැකිය. මොකද ඔබ මනුෂ්‍යයෙක් ලෙස උපත ලබා තිබෙන්නේ සුගතියට අයත් වාසස්ථානයකය. එහෙයින් මෙතැන ඇත්තේ සුගතියේ ඔබ ඉපදෙන තැන ප්‍රශ්නයක් නොවේ. කොතනක ඉපදුනද එතැන දුකය කියන ප්‍රශ්නයයි. කුමන අඩුපාඩු ජීවිතය තුළ තිබුණද ඔබ දුකට හඬන්න එපා. හඬන්න හඬන්න දුකමයි තවත් වැඩිවන්නේ, දුකේ හිතවතා තමයි කඳුළ. කඳුළ තමයි දුකේ වටිනාකම වැඩිකර දෙන්නේ. ඔබ හඬනවා පසුතැවෙනවා කියන්නේ දුක පිළිගන්නවා කියන එකයි. දුකට වටිනාකමක් දෙනවා කියන එකයි. සතුටත් මේ වගේම තමයි. සතුටේදීත්, සැපයේදීත් ඔබ හෙළන්නේ සතුටු කඳුළු, ඇලීමත් ගැටීමත් දෙකටම හේතුව තෘෂ්ණාව නිසාම එකම ස්වභාවයේ කඳුළු ඔබ දුකටත් සැපටත් දෙකටම හෙළනවා. මෙයින් ඔබ තේරුම් ගන්න දුකත් සැපත් අතර තිබෙන පරතරය සමීප බව කොතරම් කෙටිද කියලා. සිතක් අනිත්‍යභාවයට පත්වෙන වේගය යම් සේ ප්‍රවේගකාරීද දුක සහ සැපය අතර පරතරය එතරම්ම කෙටිය.

මේ නිසාමයි පින්වත් ඔබ නිතරම දුක් සහ සැප වේදනාවන් අතර දෝලනය වන්නේ. මේ කෙටි බව ඔබට තාවකාලිකව ඇති කරගන්න පුළුවන් මාර්ගය ධර්මය තුළ තිබෙනවා. ඔබේ ජීවිතය තුළින් කුසල් දහම් සිදුකර ගැනීමෙන් දාන, සීල, භාවනා පින්කම් සිදුකර ගැනීමෙන් මේ ආකාරයෙන් දුකත් සැපත් අතර තිබෙන පරතරය වැඩිකරගෙන සැප වැඩියෙන් විඳින පිරිසක් තමයි සශ්‍රීක දිව්‍ය තලවල ජීවත් වන දෙවියන් දිව්‍යංගනාවන්. ඒ අතීතයේ ධර්මානුකූල ජීවිත ගත කරලා එහි ප්‍රතිඵලය වශයෙන් දිව්‍ය තලවල ඉපදිලා තාවකාලිකව දුක තුනීකොටගෙන ජීවත්වන පිරිසක්. දුකෙන් මිදිල නැහැ. දුක ජීවිතයෙන් ඈත් කරගෙන සැපමයි අත් විඳින්නේ. මේ අවස්ථාව තාවකාලිකයි. පින්වත් මනුෂ්‍ය ජීවිත ගතකරන ඔබ දක්ෂ නම් ඔබට පුළුවන් මේ තාවකාලික සැපය

නිවන් අවබෝධ කර ගන්නා තෙක් ස්ථිර සැපයක් බවට පත්කර ගන්න. ඒ ඔබ මාර්ග ඵලලාභී දෙවියෙක් දිව්‍යාංගනාවක් බවට පත් වුවහොත්. ඊට අදාළ ධර්මයන් වැඩුවොත්.

එම නිසා දුකට පසුතැවෙන හඬන ළතවෙන ඔබ දුකට පඬුරු බඳින, කොඩි එල්ලන ඔබ ඔබේ ජීවිතයෙන් අර්ථවත් ලෙසට දුක දුරුකර ගැනීමට, ඈත්කර ගැනීමට වෙහෙසවිය යුතුයි. සශ්‍රික දෙවියෙක් වීමට පෙර ඔවුන් මනුෂ්‍ය ලෝකයේදී ජීවිතයෙන් වැඩූ සැබෑම ධර්ම ප්‍රතිපදාව නුවණින් හඳුනා ගන්න. අතීතයේ කුසල් දහම් සිදු කරගෙන සශ්‍රික දිව්‍ය ජීවිත ගතකරන මහේශාඛ්‍ය දෙවිවරුන් පින්වත් ඔබලා දුකෙන් සහනය ලැබීමට පූජා වට්ටි ඔසවාගෙන යන විට පඬුරු බඳින විට සිනාසෙනවා මිස අන් කුමක් කරන්නද? පිනම තමයි සැපය. එය ජීවිතයේ කොටසක් කරගන්න. කර්මය, කර්මඵල විශ්වාසයෙන් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් තෘෂ්ණාවෙන් තොරව ඔබ පූජා කරන දාන වේලක ඔබට ආයුෂ, වර්ණය, සැපය, බලය මෙලොව පරලොව වශයෙන් ලැබෙන බව මෙනෙහි කරන්න. එහෙත් ඔබ කාමය උදෙසා තෘෂ්ණාවෙන් ගිල දමන ආහාර වේලක සැඟවී ඇත්තේ ප්‍රේතයෙක්ම බව දකින්න. ඔබම කැමති දෙය තෝරාගන්න. හැබැයි ඔබ වැරැදි දෙය තෝරා ගතහොත් මතු ජීවිතයේදී ඔබ ප්‍රේතයෙක් නොවී අහම්බෙන්වත් මනුෂ්‍යයෙක්ව ඉපදුන හොත් දුකට හඬන්නෙක් වීමටද පඬුරු බඳින, කොඩි එල්ලන මනුෂ්‍යයෙකු වීමද අනිවාර්ය බව දකින්න. පඬුරුත් කොඩියත් කඳුළුත් තුළ සැඟවුණු සංසාරික අකුසල් පිළිබඳ යථාර්ථය යම් මොහොතක ඔබ හෙළිකරගනී ද ඒ හෙළි කරගන්නේ සැප ලැබීමේ සැබෑම මාර්ගයයි.

# පඬුර බෙල්ලේ බැඳ ගන්න සීලයේ කොඩිය අතට ගන්න

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙන්නේ දුකට හේතුව වන කාමයන් කෙරෙහි ඇති තෘෂ්ණාව ළාමකයි, තුච්ඡයි කියලා. මේ කාමයන්ගෙන් ආශ්වාදයන්ගෙන් දුරස් වෙන්න කියලයි බුදුරජාණන් වහන්සේ ඔබලාට දේශනා කරන්නේ.

මේ ආශ්වාදයට ඇති ලොල් භාවය නිසාමයි සත්වයා අප්‍රමාණ අකුසල් සිදුකර ගන්නේ. ඒ අකුසල්වල ප්‍රතිඵලය තමයි කායිකව මානසිකව ඔබ අත්විඳින දුක පසුතැවීම. මෙය හඳුනාගතහොත් ඔබලාට දේවාල ගාණේ පඬුරු බඳින්න, භාරහාර වෙන්න යන්න අවශ්‍ය නැහැ.

වර්තමානයේ සමහරක් පූජනීය බෝධීන් වහන්සේලාගේ බෝධි අතු භාරහාර සඳහා බැඳපු පඬුරුවලින් පිරිලා, එල්ලපු කොඩිවලින් පිරිලා, දේවාලවලත් එහෙමයි. ඔබේ ජීවිතයට බලපාන ප්‍රශ්න ඔබ හේතුඵල ධර්මයන්ට අනුව ගලපා ගතහොත් ඔබ නැවත පූජනීය බෝධීන් වහන්සේලාගේ බෝ අතුවල පඬුරු එල්ලන්නේ නැහැ. ඔබට පඬුරක් බඳින්න අවශ්‍ය නම් ඊට සුදුසුම තැන ඔබේම අත හෝ බෙල්ලයි. මොකද ඔබ එහෙම බැඳගතහොත් ඔබට නිරතුරුවම සිහිය පිහිටනවා. ඔබ එය දකින, දකින මොහොතක් පාසාම. ඔබ තුළින් අකුසලයන් සිද්ධ වෙන්න යන විට එය වළක්වා ගැනීමට, කළ අකුසල් නැවත නොකිරීමට, නොකළ කුසල් සිදුකර ගැනීමට... මොකද ඔබ පඬුරු බඳින්නේ ඔබට තිබෙන ප්‍රශ්නයක් විසඳා ගන්න භාරයක් ලෙසටයි. ඔය

ප්‍රශ්න ඇති වුණේ අතීතයේ ඔබ කළ අකුසල් නිසාමයි. ඒ නිසා අනුන්ට භාර වෙලා වැඩක් නැහැ. තමා තමාට භාර වෙන්න ඕනේ. සපථ වෙන්න ඕනේ. අකුසලයෙන් දුරුවෙලා කුසල් වඩනවාය කියලා. ඒ මාර්ගය තුළයි ක්‍රියාත්මක වෙන්න ඕනේ. එවිටයි ඔබට අකුසල් යටපත් වෙලා කුසල් ඉස්මතු කරගන්න පුළුවන්කම ලැබෙන්නේ. පව යටපත් කරලා පින මතු කරගන්න පුළුවන්.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා පින කියලා කියන්නේ සැපයට කියන තව නමක්ය කියලා. සැපය හීනයි කියන්නේ පින හීනයි කියන එකයි. ඉවසීම තිබෙනවා නම් තේරුම් ගැනීමට ඉතාමත් පහසු සමීකරණයක් මේක. ඉවසීම නැති තැනදී ඔබ ඔබගෙන්ම පළිගන්නවා. එයත් දිට්ඨධම්මවේදනීය අකුසල විපාකයක්. ඔබ අතීතයේ කරන අකුසල්වලට ඔබ විසින්ම වැරදි දෘෂ්ටීන් ඇති කරගෙන කායිකව මානසිකව දඬුවම් විඳිනවා. වෙනත් කෙනෙක් ඔබට දඬුවම් කරනවා නොවේ.

ඔබ ඔය දේවාල ගාණේ පිළිසරණ සොයා රස්තියාදු වන්නේ පෙර ජීවිතයේදී ඔබ අනුන්ගේ බලාපොරොත්තු කඩ කරලා තිබෙන නිසා වෙන්න පුළුවන්. අනුන්ගේ බලාපොරොත්තු කඩ කරලා අනුන්ව අතරමං කළ නිසා වෙන්න පුළුවන්. ඔබේ මහේශාඛ්‍යභාවයෙන් අනුන්ට පීඩා කිරීමේ අකුසලයේ ප්‍රතිබිම්බය තමයි ඔබ අත්විඳින්නේ. ප්‍රතිබිම්බය කියන්නේ ඔබම හේතුවෙන් සැදුනක්. මේ සෑම දෙයක්ම ධර්මානුකූලව බැලුවහම, ඔබට සිතෙන්න ඕනේ, සැප හෝ දුක ගැන සිත සිතා සිටීම නොව, මේ දෙකෙන්ම මිදිය යුතුය කියලා. මිදීමේ මාර්ගයට අවතීර්ණ වීමය කියලා. දුක, සැප දකින, මනින, කිරන, ගණන් හදන මමත්වයේ දැඩිභාවයෙන් මිදිය යුතුය කියලා.

රෙදි කැබැල්ලක බැඳගත් රුපියල් දෙකේ කාසියකින්, පොප්ලින් යාරයකින් මසා ගත් කොඩියකින්, දේවාලයේ ත්‍රිශූලය

මත ගැට ගසන පඬුරකින්, දුකින් මිදීමට හැකි බවට ඔබ තුළ ඇති දෘෂ්ටිය, විශ්වාසය, තෙරුවන් කෙරෙහි ඇති ශ්‍රද්ධාව තුළින්ම ඔබ නැතිකරගත යුතුය. තෙරුවන් වෙත ජීවිතය පූජා කර, සීලයේ කොඩිය ඔබේ අතට ගෙන, කර්මය කර්මඵල විශ්වාසයෙන් හැකිතාක් පඬුරු දන් දෙමින්, දුකට හඬනා කඳුළු මෛත්‍රියෙන් පිසදා ගෙන, සැප ලබන සැබෑම මාර්ගයට අවතීර්ණ වෙන්න. මුලාවූ ලෝකයෙන් මිදී, සතර අපායෙන් නිදහස් වූ මනුෂ්‍යයෙක්, දෙවියෙක් වන්න ඔබත් වීර්යය වඩන්න.

# මස් මාළුවල නොවෙයි
# කෙළෙස්වල පිළී ගඳෙන් මිදෙන්න...

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටි කාලවකවානුවේදී මෙන්, සම්බුදු බණ පදයක් අසා, ධර්මය දැකීමේ, අවබෝධ කරගැනීමේ ස්වභාවයට පත් වීමට සමත්, පිනක් සහිත පින්වතුන් වර්තමානයේ විරලය. එහෙයින් නිවීමේ මග පෙරට යා යුත්තේ මෛත්‍රිය, කරුණාව, ජීවිතය තුළ වඩවා ගෙන, ඒ තුළින් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, දානය, සීලය වඩමින් උත්සහයෙන්ම වීම ඒකාන්තය.

ඒ වීර්යයෙන් යන ගමනේ ඔබට යම් සන්ධිස්ථානයකදී මස්මාංශද, නිර්මාංශද යන්න නොව ඉහත ස්වභාවයන් දෙකටම ඇලීමෙන්, ගැටීමෙන්, උපේක්ෂාවෙන් මිදී මස් මාංශ සහිත රූපයෙන් සදහටම මිදී, ඉපදීම නිරුද්ධ කරගැනීම එකම අරමුණ විය යුතු යැයි ඔබ දකිනවා ඇත. එය කළ හැක්කේ ඉහත තුන් ආකාරයේ බැඳීම, මස් මාළු කෙරෙහි නැති කරගත් දාකමය. එතෙක් කුකුළෙක්, හරකෙක්, ඌරෙක්, එළුවෙක්, මාළුවෙක් වෙනුවෙන් සටන් කරන ඔබ, එම සතුන්ගේ නිදහස කැමති වුවද, ඔබ මරණින් පසු තිරිසන් යෝනියේ ඉපදීමේ ස්වභාවයෙන් තවම මිදී නොමැති බව මෙනෙහි කළ යුතුය.

තිරිසන් ලෝකයේ ඕනෑම සතෙකු එම ස්වභාවයේ උපතක් ලබන්නේ, එම සතුන් පෙර මනුෂ්‍ය ආත්මභාවවල ඉපිද කරගන්නා ලද අනන්ත අප්‍රමාණ සත්ව ඝාතන නිසාමය. මසට මැරෙන තිරිසන් සතෙක් යනු පෙර භවයක පාණාතිපාතා වේරමණී

ශික්ෂා පදය දැඩි ලෙස කැඩූ මනුෂ්‍යයින්මය. මස් මාංශයෙන් වැළකීම මගින් එවැනි කර්ම විපාකයන්ගෙන් එම සතුන්ව ගලවා ගැනීමට ඔබට හැකි යැයි ඔබ සිතනවා නම් එය මුලාවකි.

ගවයෙක්, එළදෙනක් උදාහරණයකට ගන්න. පින්වත් ඔබ බොහොම ශ්‍රද්ධාවෙන් කරුණාවෙන් මස් මඩුවට ගිහින්, එම සතා නිදහස් කරගෙන ඇවිත් වත්තකට නැත්නම් ගව රැළකට දානවා. ඒ මොහොතේ පටන් ඒ සතා මොකද කරන්නේ. තම වර්ගයා බෝ කරනවා. ඒ කියන්නේ මුලා වූ ලෝකයට දුක පැටව් ගසනවා. පින්වත් ඔබ ඔය නිදහස් කළේ තව තව මරණයට පැටවු නිපදවන්නෙක්. ඔවුන් නිපදවයි. ඔබට තිබෙන්නේ නිදහස් කිරීමය. මේ පරස්පරයට තමයි අපි මෝහය කියන්නේ. අපිම සංවර්ධනයට දායක වෙමින් අපම සීමා කරනවා. මෝහයෙන් මිදුණු දිනක තමයි ඔබට මේ ධර්මතාවය වැටහෙන්නේ.

පින්වත් ඔබට, සතා නිදහස් කළ පින ලැබෙනවා. ඔබ තුළ මෛත්‍රිය කරුණාව වැඩෙනවා. එය නැතෙයි කියලා භික්ෂුව කියන්නේ නැහැ. සමහරවිට ඔබ ඔබේ අපලයකටය කියලා වෙන්න පුළුවන් සතුන් නිදහස් කරන්න ඇත්තේ. නමුත් තිරිසන් සතෙකුට, මනුෂ්‍යයෙකුව අපලයෙන් මුදවා දීර්ඝායුෂ දෙන්න බැහැ. මෙතැනදී ඔබව අපලයෙන් මුදවන්නේ තිරිසන් සතා නෙවෙයි. එම ක්‍රියාව නිසා ඔබ තුළ ඇති කරගන්නා කුසල් සිතයි. එම ශක්තිමත් කුසල් සිත නිසා අකුසල් කර්මයන් යටපත් වෙනවා. බලන්න, පින්වත් ඔබ තුළින්ම එම කුසල් සිත මතුකර ගැනීමටත්, ඔබට තිරිසන් සත්ත්ව සංඥාවක් ඊට හවුල් කරගන්න අවශ්‍ය වුණා. භික්ෂුව මේ කරුණු ඔබට දක්වන්නේ, පින්වත් ඔබට මේ තිරිසන් සත්ත්ව සංඥාවලින් ඉවත් වෙන්න කියලයි. සැබැවින්ම ඔබ විසින් වැඩිය යුත්තේ දිව්‍ය බ්‍රහ්ම සංඥායි.

පින්වත් ඔබ අහිංසක තිරිසන් සතුන් මරණින් මුදා ගන්න. එවැනි පින්කම්වලින් වළකින්න කියා කියනවා නොවේ. නමුත් වඩා වැදගත් වෙන්නේ ලැබූ මේ බුද්ධෝත්පාද කාලයේ, තමා

සිරගතව සිටියදී, අනුන්ව නිදහස් කිරීමට යෑම නොවේ. තමා සතර අපායෙන් නිදහස් වීමට වෙර දැරීමයි. ඊට අවශ්‍ය ශක්තිය සැඟවී ඇත්තේ තිරිසන් සතා තුළ නොව, ඔබ තුළමය.

ප්‍රමාදී භාවයකට පත් වී අපි තිරිසන් යෝනියක, උපතකට වැටුනොත්, අපිව නිදහස් කරගැනීමට කිසිවෙක් නොමැත. ඒ දුක අපම විඳිය යුතුය.

ඉහතින් සඳහන් කළේ හරක් එළුවෝ ගැන. ඔබ මාළු ගැන සිතන්න. පිටකොටුව තොග මාළු වෙළඳපොළට යන්න. දස දහස් ගණනින්, ලක්ෂ ගණනින් මියගිය මාළු ඔබට දකින්නට පුළුවන්. පොඩි මාළු අසුවෙන කාලවලදී, දැල්වලට දස දහස් ගණනිනුයි මාළු අහුවෙලා මිය යන්නේ. මේ වගේ මාළු තොග ප්‍රමාණයෙන් දකිනකොට මිනිස්සුන්ට සිතෙනවද 'මේ මොන අපරාධයක්ද?' කියලා. එහෙම සිතෙන්නේ නැහැ. 'මේ මාළුවාත් පෙර ආත්මයක මනුෂ්‍යයෙක්, දැන් මේ තිරිසන් යෝනියේ ඉපදිලා' කියලා හැඟීමක් ඇතිවෙන්නේ නැහැ. ඒ මාළුවන්ගේ කර්ම විපාකයයි. ඔවුන් දස දහස් ගණනින් මුහුද මතුපිටට මතුවී එන්නේ මැරෙන්නමය. ඔවුන්ගේ ආයුෂ එපමණය. මේ මාළු යෝනියේ මසුන් පෙර ජීවිතවල කළ කර්ම විපාකයන්ය. හේතුඵල ධර්මයන්ය. හාල්මැස්සාගේ පටන් සෑම මාළුවෙක්ම කුස පුරවා ගන්නේ තමන්ට වඩා කුඩා මාළු සිය දහස් ගණනින් ගිල දමාය. ඔබ ඔය මරණයෙන් මුදවන්නට හදන මාළුවාද මාංශ භක්ෂකයෙකි. කිලෝ දහයක් බරැති කෙලවල්ලෙක් ඔය තැනට ගෙන එන්න, කුඩා මාළු ලක්ෂ ගණනක් ගිල දමන්නට ඇත. ඒ කියන්නේ ප්‍රාණඝාත අකුසල් ලක්ෂ ගණනක් ඒ සතා අතින් සිද්ධ වෙලා. අපි හිතමු ඉහත කෙළවල්ලා මුහුදෙන් අල්ලාගෙන පැමිණෙනකොටම නිර්මාංශ ඔබ එය දැකලා එම කෙළවල්ලා නැවත මුහුදට නිදහස් කළා කියලා. ඒ නිදහස් කළ මොහොතේ පටන්ම ඒ සතා කරන්නෙත් ප්‍රාණඝාතයමයි. කුඩා මාළුන් දහස් ගණනින් ගිල දමනවා. කුඩා මාළුන් එම කෙළවල්ලාගේ කුස තුළ මැරෙන්නේ ඒ ඔවුන්ගේ කර්ම විපාකය නිසයි. විපාක දීමට ඇති

ස්වභාවය නිසා. මේකට තමයි ලෝකය කියන්නේ. ඉපදෙන, කැඩෙන බිඳෙන, විසිරෙන ස්වභාවය...

එක් කෙළවල්ලෙකුගේ කුස තුළ දිනකට තවත් කුඩා මාළු ජීවිත දස දහස් ගණනක් කැඩිලා බිඳිලා විසිරිලා යන ප්‍රමාණයට වඩා, සිය ගුණයකින් එම කෙළවල්ලා නැවත නැවත බිත්තර මගින් පැටවු, වර්ගයා බෝ කරනවා. මේ සතුන් සැබැවින්ම අකුසල් නිධි. දිනපතා ලියලන, දළුලන අකුසල් නිධි. මේ මරණ දුකට හේතුව තමාමය. ඒ දුක වෙනස් කරන්න මනුෂ්‍ය අපට බැහැ. ලියලන අකුසල් නිධි නැමැති හේතුව තිබෙන තාක්කල්, මරණ දුක නැමැති ඵලය නියතය. අවිද්‍යාව විසින් අයෙක් මාළු යෝනියට ඇද දමද්දී, අවිද්‍යාව විසින්ම තව අයෙක් මාළුවා බේරා ගැනීම උදෙසා මෙහෙයවයි. මේ දෙකටම හේතුව ඔබ අවිද්‍යාවෙන් නිදහස් නොවීමයි. ඔබ කළ යුත්තේ සම්මා දිට්ඨිය ඇති කරගැනීම මිස, මාර ධර්මයන්ට රැවටී (සමාජයේ භාවිතා වන වචනයෙන්ම කියන්නේ නම්) මාරයාට 'කඩේ යෑම' නොවේ. ඒ කියන්නේ ඔබට අයිති නොමැති සිතට රැවටී සතර අපායට නොයන්න කියලයි.

ඔබට ඔබේ ස්වභාවයෙන් සිටීමට නොහැක. ඔබ සිටින්නේ අවිද්‍යා සහගත සිතේ ස්වභාවයෙන්ය. මන්ද සිත ඔබේ ක්‍රියාකරුවාය. ඔබ ඔබේ ස්වභාවයට සිටිනවා යනු, ඔබ අවිද්‍යා සහගත සිතේ ස්වභාවයෙන් සිටීමයි. ඔබ වීර්යය කළ යුත්තේ ධර්මයේ ස්වභාවයට පැමිණීමටය. එවිට සිතද ධර්මයේ ස්වභාවයට පැමිණෙනු ඇත. මේ තැනට පැමිණෙනතාක් ඔබව ඔය අවිද්‍යා සහගත සිත නොයෙක් ජනප්‍රිය දෘෂ්ඨීන්වල සිරකරුවෙක් කරනු ඇත. එහෙයින් මස්, මාළු, බිත්තර, කරවල කැබැල්ලකට ඇලීමෙන්, ගැටීමෙන්, උපේක්ෂාවෙන් ඔබ රකින උතුම් සීලය, සමාධිය තණ්හාවෙන්, මාන්නයෙන්, දිට්ටියෙන් කිළිටි කිරීමට මාරයාට ඉඩ නොදෙන්න.

භික්ෂුව ඉහත සටහන සවස් වරුවේ ලියන විට භික්ෂුවට පෙනෙනවා, කුටිය අසළින් රතු පැහැ එළදෙනක් කැලය තුළට යනවා. ඇය යන්නෙ බොහොම අමාරුවෙන්. කකුලක් කොරගසමින්. සමහරවිට වාහනයක ගැටිලා වෙන්න පුළුවන්. ඇය හොඳටම කෙට්ටු වෙලා. ආහාර නොලැබීමෙන් වෙන්න ඇති. ඇය පසුපසින් සති දෙකක් පමණ වයසැති සුරුබුහුටි වසු පැටවෙක් ගමන් කරනවා. ඒ ඇයගේ පැටවා. කොර ගසමින් යන මව් වැස්සිය පසුපසින් පැටවාද සතුටින් යනවා. මවගේ වේදනාව එයාට දැනෙන්නේ නැහැ. මව් වැස්සිය පැටවාත් අරගෙන මහා අවදානම් ගමනක් යන්නේ. ඇයට තේරුමක් නැහැ රාත්‍රී අඳුර වැටෙන විට පැටවාත් සමග කැලයට යෑම නුසුදුසුයි කියලා. නපුරු සතෙකුට ගොදුරු වෙන්න පුළුවන් කියලා. මව් වැස්සිය රෝගී තත්ත්වය වැඩි වී කැලයේ අතරමං වේවිය කියලා. මේවා ගැන කිසිම හැඟීමක් මව් වැස්සියට නැහැ. පැටවා සමග කැලය තුළට ගියා. මව් වැස්සියගේ අනවබෝධය නිසා දෙදෙනාගේම විනාශය කැලය තුළදී සිද්ධ වෙන්න පුළුවන්. පැටවාට කරන්න දෙයක් නැහැ. එයා මව් උණුසුමට, මව් කිරට ඇති ඡන්ද රාගය නිසා, අවදානම කරා කැමැත්තෙන් ගමන් කරනවා.

මේ සිද්ධිය අපටත් හොඳ පාඩමක්. අප හැමවිටම අනුගමනය කළ යුත්තේ, ආදර්ශයට ගත යුත්තේ අපව සතර අපායේ අවදානම කරා රැගෙන යන පෙරගමන්කරුවෙක් නොවේ. නිවැරදි මාර්ගයට අපව මෙහෙයවන කළ්‍යාණ මිත්‍රයෙක්මය. ඒ කල්‍යාණ මිත්‍රයා අන් කව්රුවත් නොව ලොව්තුරා බුදුරජාණන් වහන්සේමය. උන්වහන්සේ අපට වදාළේ පිළී ගඳ ඇත්තේ මස්මාංශවල නොව, සීලයක් නොරකින, සමාධියක් නොවඩන මනුෂ්‍යයා තුළ ඇති කෙළෙස්වල බවයි. ඔබ මස් මාංශ අනුභව නොකොට සිටියද, ඔබේ සිත කෙළෙස්වලින් බරිත නම්, සැබැවින්ම ඔබ තුළ පිළී ගඳ ඇත. ඔබ මස් මාංශ අනුභව කළද සිත කෙළෙස්වලින් පිරිසිදු කිරීමට වෙහෙස වන්නේ නම් ඒ ඔබ වෙහෙස වන්නේ පිළී ගඳට එරෙහිවය.

මාළු යනු මාළුය. මස් යනු මස්ය. බිත්තර යනු බිත්තරය. මේවා රස අනුව, ගුණ අනුව, වර්ගය, හැඩරුව, ප්‍රමාණය, පින් පව් අනුව වර්ග කරන්නේ ඔබේ සිතමය. මේ විෂයන් පිළිබඳව ඔබව සංකීර්ණභාවයට පත්කරන්නේ ඔබගේ සිතය. මේ සංකීර්ණභාවය නිසාම, නොයෙක් දෘෂ්ටි මතවාදවල ඔබ සිරකරුවෙක් වෙයි. ඉහත සිරකාර බවින් ඔබ නිදහස් වීමට නම් අවිද්‍යා සහගත සිත ඔබ අවබෝධ කරගත යුතුය.



ඝෝරතර සසරේ
තවත් එක් සන්ධියක
ඉබාගාතේ ඇවිදි
සංසාර සතුන් හට
නොඇලෙන්න කියාදුන්
නොගැටෙන්න සිහිය දුන්
අතහරින සතිය දුන්
නිදුකානගේම පුත්
සඟ මැණික ඔබම විය

කරගන්න මහ කුසල්
බෙදා ලොවටම දහම
ඔබේ අවබෝධයෙන්
සැනසීය මනු කැලක්
එමතු නොව දෙවියෝද
එයින් තුටු වනු දනිමි

සාරිපුත් පරපුරේ
අපේ කාලේ උපන්
මහකසුප් මහතෙරගෙ
එමඟ යන බුදු පුතුනි
එක්කෝ මරණයය
නොමැතිනම් නිවනමය
කියා කළ සිහ නාද
තව කොහෙන් අසන්නද

ඔබේ දම් ගැලපුමට
නොතිත් පැසසුම් එතැයි
කියූ කල මා ඔබට
පුතේ මේ මගෙ නොවෙයි
බුදුරජුන් දහමමය
නිහතමානීව කිවු
ඒ වදන් රාවදෙයි

කොහේ හෝ වන පෙතක
මේ මොහොතෙ වැඩ සිටින
අපේ පිනටම උපන්
හිමියනේ ඔබෙ ගුණෙන්
දකිමු අපි බුදු රජුන්

ඒ අමා මැණියන්
සහස් දෙකකුත් අඩක්
ගෙවී වස් ගතවෙතත්
වදයි ඔබ වැනි පුතුන්
ලෝ සතට සෙනෙහසින්

ISBN 978-955-7887-05-0
මුද්‍රණය: ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්

මිල රු. 130/-